# පශ්චාත් අස්වැන්න පිළිබඳ තාක්ෂණ ආයතනය

# அறுவடைக்குப் பிந்திய தொழில்நுட்ப நிறுவனம்

# INSTITUTE OF POST HARVEST TECHNOLOGY

## වාර්ෂික වාර්තා - 2016

## வருடாந்த அறிக்கை - 2016

## Annual Report – 2016


කොළඹ කාර්යාලය,
G – 34, කෘෂිකර්ම අමාත්‍යාංශය,
අංක 80/5, රජමල් වත්ත පටුමග,
බත්තරමුල්ල,
ශ්‍රී ලංකා.

පර්යේෂණ සහ සංවර්ධන මධ්‍යස්ථානය,
ජයන්ති මාවත,
අනුරාධපුරය,
ශ්‍රී ලංකා.

கழும்பு காரியாலயம்,
G – 34, கமத்தொழில் அமைச்சு,
கொவிஜன மந்திரய,
80/5, ரஜமல்லத்தை வீதி,
பத்தரமுல்லை

ஆராய்ச்சி மற்றும் அபிலிருத்தி நிலையம்,
மாவத்தை,
அநுராதபுரம்.

*COLOMBO OFFICE,*
*G – 34, MINISTRY OF AGRICULTURE,*
*GOVIJANA MANDIRAYA,*
*NO. 80/5, RAJAMAL WATHTHA AVENUE,*
*BATHTHARAMULLA,*
*SRI LANKA.*

*RESEARCH AND DEVELOPMENT CENTRE,*
*JAYANTHI MAWATHA,*
*ANURADHAPURA,*
*SRI LANKA.*

# පශ්චාත් අස්වැන්න පිළිබඳ තාක්ෂණ ආයතනය

# වාර්ෂික වාර්තාව - 2016

**ප්‍රධාන කාර්යාලය:**
ජී-34, කෘෂිකර්ම අමාත්‍යාංශය
“ගොවිජන මන්දිරය”,
නො: 80/5, රජමල්වත්ත පාර,
බත්තරමුල්ල,
ශ්‍රී ලංකාව.

**පර්යේෂණ සහ සංවර්ධන මධ්‍යස්ථානය:**
ජයන්ති මාවත.
අනුරාධපුරය,
ශ්‍රී ලංකාව.

පශ්චාත් අස්වැන්න පිළිබඳ තාක්ෂණ ආයතනය
ජී-34, කෘෂිකර්ම අමාත්‍යාංශය
"ගොවිජන මන්දිරය", නො:80/5, රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.
2017.02.28

ගරු කෘෂිකර්ම අමාත්‍යතුමා
කෘෂිකර්ම අමාත්‍යාංශය,
"ගොවිජන මන්දිරය",
බත්තරමුල්ල.

ගරු අමාත්‍යතුමනි,

**වාර්ෂික වාර්තාව - 2016**

1971 අංක 38 දරන මූලා පනතෙහි 14(2) ඡේදය ප්‍රකාරව, 2016 වර්ෂය සඳහා පශ්චාත් අස්වැන්න පිළිබඳ තාක්ෂණ ආයතනයේ වාර්ෂික වාර්තාව සහ ගිණුම් ප්‍රකාශන ඔබතුමා වෙත ගෞරවයෙන් ඉදිරිපත් කරමි.

මෙයට විශ්වාසී,

කවින්ද සී. දිසානායක
සභාපති
පශ්චාත් අස්වැන්න පිළිබඳ තාක්ෂණ ආයතනය

01

## 01. පනත්, ව්‍යවස්ථා සම්පාදනය සහ ආයතනික යහපාලනය

කෘෂිකර්ම අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන පශ්චාත් අස්වැන්න පිළිබඳ තාක්ෂණ ආයතනය, සියලුම කෘෂිකාර්මික භෝග පිළිබඳ පර්යේෂණ සහ සංවර්ධන කටයුතු සිදු කිරීම සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 1137/10 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය මගින් 2000 වර්ෂයේ ජූනි මස 19 දින පිහිටුවන ලදී. 1976 වර්ෂයේදී FAO/UNDP සහාය ඇතිව පිහිටුවන ලද වී අළෙවි මණ්ඩලයේ අනුරාධපුර පිහිටි සහල් සැකසීමේ පර්යේෂණ සහ සංවර්ධන මධ්‍යස්ථානය (RPRDC) හි කාර්යයන් අලුතින් ස්ථාපනය කරන ලද ආයතනය විසින් පවරාගනු ලැබිණි. සහල් සහ ධාන්‍ය පිළිබඳව පමණක් නොව එළවළු, පළතුරු, කුළු බඩු සහ කපන ලද මල් වැනි වෙනත් ක්ෂේත්‍ර භෝග පිළිබඳවද පශ්චාත් අස්වනු පර්යේෂණ හා සංවර්ධන කටයුතු සිදු කිරීමේ කාර්යයන් සහ වගකීම් අලුතින් පිහිටුවන ලද ආයතනයට පවරා දෙන ලදී.

### අපගේ දැක්ම

පසු අස්වනු තාක්ෂණය පිළිබඳ විශිෂ්ටතම කේන්ද්‍රස්ථානය වීම

### අපගේ මෙහෙවර

පසු අස්වනු පර්යේෂණ සහ සංවර්ධනය තුළින් ඵලදායීතාවය ඉහළ නැංවීම සහ කෘෂි ව්‍යාපාර ක්ෂේත්‍රයේ තරඟකාරිත්වය සඳහා පහසුකම් සැපයීම.

ගැසට් නිවේදනයේ සඳහන් විධිවිධාන අනුව ආයතනයෙහි අරමුණු පහත පරිදි වේ;

කෘෂිකර්මික අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන පශ්චාත් අස්වැන්න පිළිබඳ තාක්ෂණ ආයතනය (පඅතාආ) පර්යේෂණ, පුහුණු, ව්‍යාප්ති සහ වෙනත් සංවර්ධන ක්‍රියාකාරකම් හරහා ධාන්‍ය, මාශ බෝග, තෙල් බෝග, අනෙකුත් ක්ෂේත්‍ර බෝග, පලතුරු, එළවළු සහ කුළු බඩු භෝග සම්බන්ධයෙන් පසු අස්වනු ඉංජිනේරු සහ තාක්ෂණ වැඩිදියුණු කිරීමේ නිරතව සිටින ශ්‍රී ලංකාවේ ප්‍රධානතම ආයතනය ලෙස ක්‍රියාකාරී වේ. පුළුල් වශයෙන් ගත්කළ ආයතනයේ ඉලක්ක සහ අරමුණු පහත සඳහන් පරිදි වේ:

1. වැඩිදියුණු කළ, පිරිවැය ඵලදායි තාක්ෂණවේදයන් හඳුන්වාදීම තුළින් ධාන්‍ය, ක්ෂේත්‍ර බෝග, පලතුරු, එළවළු සහ කුළුබඩු බෝගයන්හි පසු අස්වනු හානි වැළැක්වීම මඟින් ඔවුන්ගේ අළෙවි කළ හැකි අතිරික්තය ඉහළ යාමේ ප්‍රතිඵලයක් ලෙස ග්‍රාමීය වගා අංශයෙහි ආදායම් වැඩි වනු ඇත. ජාතික මට්ටමේදී එවැනි ක්‍රියාමාර්ග මඟින් පරිභෝජනය සහ අවශ්‍ය ආහාර ද්‍රව්‍යයන්හි ප්‍රමාණාත්මක ඉහළ යෑමක් සිදු වනු ඇත.

2. අවිධිමත් පසු අස්වනු පරිහරණය කිරීමේ, ගබඩා කිරීමේ සහ සැකසීමේ ක්‍රමවේදයන් යොදා ගැනීම හේතුවෙන් ධාන්‍ය, ක්ෂේත්‍ර බෝග, පළතුරු, එළවළු සහ කුළුබඩු බෝගයන්හි සිදු වන තත්ත්ව හානිය වැළැක්වීම තුළින් වෙළඳපොළ කරා ලඟා වන මෙම අත්‍යවශය වෙළඳ ද්‍රව්‍යයන්හි තත්ත්වය සැලකිය යුතු ලෙස ඉහළ නැංවේ. නිෂ්පාදනයෙහි තත්ත්වය වැඩි දියුණු වීම තුළින් ඔවුන්ගේ "අගය එකතු කළ" නිෂ්පාදන තරඟකාරී වෙළඳපළ තුළ වඩාත් වැඩි මිලකට අළෙවි කර ගැනීමට හැකි වීමෙන් කෘෂිකර්මාන්තයෙන් ඔවුන් උපයන ආදායම ඉහළ නංවා ගත හැකි වනු ඇත.

3. අවිධිමත් පසු අස්වනු ක්‍රමවේද යොදා ගැනීම තුළින් ධාන්‍ය, මාශ බෝග සහ අනෙකුත් ආහාර බෝග, පලතුරු, එළවළු සහ කුළුබඩු බෝගයන්හි සිදු වන පෝෂණ හානිය වැළැක්වීම සහ එමඟින් දිවයිනෙහි පෝෂණ තත්ත්වයන් ඉහළ නැංවීම.

4. අවාරයේදී වඩාත් වාසි සහගත මිල ගණන්වලට ගොවීන්ගේ නිෂ්පාදනයන් විකිණීම තුළින් ඔවුන්ගේ ආදායම් ඉහළ නැංවීම සඳහා ගොවිපොළ මට්ටමේ ගබඩා සහ සංරක්ෂණ පහසුකම් වැඩිදියුණු කිරීම.

5. කෘෂි පාරිභෝගික ද්‍රව්‍යයන්හි නිෂ්පාදන පිරිවැය අවම කිරීම සඳහා අවම ශ්‍රමයක් යොදා ගන්නා වැඩිදියුණු කළ පසු අස්වනු තාක්ෂණ ක්‍රමවේද හඳුන්වා දීම.

6. ග්‍රාමීය වගා අංශයෙහි ආදායම සහ රැකියා අවස්ථා ඉහළ නැංවීම සඳහා සහ එමඟින් ඔවුන්ගේ ජීවන තත්ත්වය වැඩිදියුණු කිරීම සඳහා ග්‍රාමීය මට්ටමින් කෘෂි-පදනම් කර්මාන්ත ව්‍යාප්ත කොට ප්‍රවර්ධනය කිරීම.

7. දේශීය ධාන්‍ය නිෂ්පාදනය සඳහා ඉහළ අළෙවි ඉල්ලුමක් ඇති කිරීම පිණිස ධාන්‍ය, මාශ බෝග, පලතුරු, එළවළු සහ කුළුබඩු බෝගවලින් සකස් කරන ආහාර පාරිභෝගිකයින් අතර ජනප්‍රිය කරවීම. ඉහළ පෝෂණ වටිනාකමක් සහිත මෙම ආහාර පරිභෝජනය ඉහළ යාම දිවයිනෙහි පෝෂණ තත්ත්වය වැඩිදියුණු වීමටද හේතු වනු ඇත. ආයතනයේ පර්යේෂණ හා ව්‍යාප්ති කණ්ඩායම ඉංජිනේරුවන්, කෘෂිකාර්මිකයන්, ක්ෂුද්‍රජීව විද්‍යාඥයන් හා ආහාර තාක්ෂණවේදීන්ගෙන් සමන්විත වේ. පළපුරුදු සහායක කාර්ය මණ්ඩලය මෙම කණ්ඩායමට පිටුබලය සපයයි.

03

## 02. අධ්‍යක්ෂ මණ්ඩලය සහ ආයතනික ව්‍යුහය

| නම | තනතුර |
|---|---|
| ආචාර්ය කේ.බී. පලිපාන මහතා | සභාපති |
| ඩී.එම්. කවින්ද දිසානායක මහතා | සභාපති |
| ආර්.පී.ඒ. රණවීර පතිරණ මහතා | උප සභාපති |
| ආචාර්ය එච්.එම්.එස්. හීන්කෙන්ද මහතා | අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික |
| අචාර්ය රංජිත් විජේවර්ධන මහතා | අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික |
| ඉනෝකා ලංකාතිලක මිය | අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික |
| නීතිඥ එස්.පී. කුමාර ගුණරත්න මහතා | අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික |
| ඩී.බී. සරත් මහතා | අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික |

විගණන සහ කළමනාකරණ කමිටුව

| නම | තනතුර |
|---|---|
| ඉනෝකා ලංකාතිලක මිය (සභාපති) | නියෝජ්‍ය අධ්‍යක්ෂ,<br>කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව |
| ආර්.පී.ඒ. රණවීර පතිරණ මහතා | උප සභාපති,<br>පශ්චාත් අස්වැන්න පිළිබද තාක්ෂණ ආයතනය |
| ඩී.බී. සරත් මහතා | අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික<br>පශ්චාත් අස්වැන්න පිළිබද තාක්ෂණ ආයතනය |
| ආචාර්ය බී.එම්.කේ.එස්. තිලකරත්න මිය | අධ්‍යක්ෂ (2016 ජනවාරි සිට 2016 ජූලි දක්වා)<br>පශ්චාත් අස්වැන්න පිළිබද තාක්ෂණ ආයතනය |
| ඉංජි. ටී.එම්.ආර්. දිසානායක මහතා | වැ.බ. අධ්‍යක්ෂ (2016 ජූලි සිට 2016 දෙසැම්බර් දක්වා)<br>පශ්චාත් අස්වැන්න පිළිබද තාක්ෂණ ආයතනය |
| ඩී.පී.සී. ස්වර්ණසිරි මහතා | අතිරේක අධ්‍යක්ෂ (R & T T)<br>(2016 ජනවාරි සිය 2016 පෙබරවාරි දක්වා)<br>පශ්චාත් අස්වැන්න පිළිබද තාක්ෂණ ආයතනය |
| ඉංජි. ඩී.පී. සේනානායක මහතා | අතිරේක අධ්‍යක්ෂ (R & T T)<br>(2016 මාර්තු සිට 2016 දෙසැම්බර් දක්වා)<br>පශ්චාත් අස්වැන්න පිළිබද තාක්ෂණ ආයතනය |
| ආර්.කේ.ඒ.පී. රාමනායක මහතා | අතිරේක අධ්‍යක්ෂ (පරිපාලන සහ මුදල්)<br>පශ්චාත් අස්වැන්න පිළිබද තාක්ෂණ ආයතනය |
| අයි.එම්.එන්.පී. ඉලංගසිංහ මහතා | ගණකාධිකාරි<br>පශ්චාත් අස්වැන්න පිළිබද තාක්ෂණ ආයතනය |
| ආර්.එම්.ඩී. රත්නායක මහතා (කැඳවුම්කරු) | අභ්‍යන්තර විගණක<br>පශ්චාත් අස්වැන්න පිළිබද තාක්ෂණ ආයතනය |
| ජේ.ඒ.එස්. ධම්මික පෙරේරා මහතා (නිරීක්ෂක) | විගණක අධිකාරි<br>විගණකාධිපති දෙපාර්තමේන්තුව |

04

## අනුමත බඳවා ගැනීමේ පටිපාටියට (SOR) අනුව ආයතනික ව්‍යුහය




2016 වර්ෂයේදී ආයතනය එහි අංශ පහත සඳහන් පරිදි ප්‍රතිව්‍යුහගත කරන ලද අතර එය මේ වනවිට මුළු ආයතනික ව්‍යුහය ප්‍රතිව්‍යුහගතකරණය කිරීමේ යෙදී සිටී.

1. පර්යේෂණ අංශය
2. ඉංජිනේරු සේවා අංශය
3. ව්‍යාප්ති අංශය
4. පර්යේෂණාගාර සේවා අංශය
5. සැලසුම් සහ අධීක්ෂණ අංශය
6. සංවර්ධන ව්‍යාපෘති අංශය
7. පරිපාලන අංශය
8. මූල්‍ය අංශය
9. අභ්‍යන්තර විගණන අංශය
10. තොරතුරු තාක්ෂණ අංශය

05

# <u>සභාපතිතුමාගේ පණිවිඩය</u>

1976 වර්ෂයේ වී අලෙවි මණ්ඩලය යටතේ ආරම්භ කළ සහල් සැකසුම් පර්යේෂණ හා සංවර්ධන ආයතනයේ කාර්යය පුළුල් කරමින් කෘෂිකර්ම සංවර්ධන හා ගොවිජන සේවා අමාත්‍යාංශය යටතේ 1972 අංක 11 දරණ රාජ්‍ය කෘෂිකාර්මික පනත යටතේ 1137/10 දරණ ශ්‍රී ලාංකික ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අතිවිශේෂ ගැසට් පත්‍රය මගින් වර්ෂ 2000 ජුනි 19 දින පශ්වාත් අස්වැන්න පිළිබඳ තාක්ෂණ ආයතනය ස්ථාපනය කරන ලදි .

පර්යේෂණ, පුහුණු කිරීම්, ව්‍යාප්ති සේවා හා අනෙකුත් සංවර්ධන කාර්යයන් තුළින් වී/සහල්, අනෙකුත් එළවළු පලතුරු හා කුළුබඩු බෝග වල පසු අස්වනු තාක්ෂණය වැඩි දියුණු කිරීම මගින් ආහාර සුරක්ෂිතතාව ඇති කිරීම මෙම ආයතනයේ ප්‍රමුඛතම කාර්යය භාරය වේ.

මේ වන විට මෙම ක්ෂේත්‍රයේ කාර්යය භාරයන් මුල් කරගනිමින් ආහාර සැපයුම් දාමයේ සුරක්ෂිතතාවය ඇති කිරීමෙහිලා පර්යේෂණ හා සංවර්ධන ව්‍යාපෘති රාශියක්ම ආයතනය මගින් ක්‍රියාත්මක කෙරෙන අතර කාලීන අවශ්‍යතාවයන් පෙරදැරි කර ගනිමින් අඹ සැපයුම් හා අගයදාම කළමණාකරනය වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතිය, ශ්‍රී ලංකාවේ එළවළු කෘෂි භෝග වල සැපයුම් හා අගයදාම කළමණාකරන ව්‍යාපෘතිය, ආදී ව්‍යාපෘති සිදු කරමින් පවතියි.

එසේම මෙම ව්‍යාපෘතීන් තුළින් නිෂ්පාදන ඵලදායීතාවය ඉහළ නැංවීම මගින් සමස්ත නිෂ්පාදනයේ ගුණාත්මක වර්ධනය මෙන්ම ක්ෂේත්‍රයේ නියුතුවන්ගේ ආර්ථික වර්ධනය ඉහළ නැංවීම සමස්ත ක්‍රියාවලියේ අරමුණ වේ.

මේ අනුව මෙම අභිප්‍රායන් මුදුන්පත් කරගැනීමෙහිලා අවශ්‍ය මානව හා භෞතික සම්පත් සංවර්ධනය මගින් කෘෂිකාර්මික ක්ෂේත්‍රයට අවශ්‍ය සාධනීය දායකත්වය ලබාදීමෙහි විභවයක් අප ආයතනය සතු වන බවද සඳහන් කළ හැකිය.

**කවින්ද සී දිසානායක,**
**සභාපති**

# 03. විධායක වාර්තාව

**පර්යේෂණ**

පශ්චාත් අස්වැන්න පිළිබඳ තාක්ෂණ ආයතනයේ පර්යේෂණ වැඩසටහන මූලික සහ ව්‍යවහාරික පර්යේෂණ යන දෙවර්ගයම ඇතුළුව පසු අස්වනු කර්මාන්තය මුහුණ දෙමින් පවතින තාක්ෂණික ගැටලු විසඳීම සඳහා අඛණ්ඩව සිදු කරන ලද අතර මින් ප්‍රමුඛත්වය ව්‍යවහාරික පර්යේෂණ වලට ලැබී තිබිණි. 2016 වර්ෂය තුළදී පර්යේෂණ ව්‍යාපෘති තිහක් (30) සිදු කර ඇති අතර එය, 2015 වර්ෂයේ සිට සිදු කරගෙන එනු ලැබූ පර්යේෂණ ව්‍යාපෘති එකොළහකින් (11) සහ 2016 වර්ෂයේදී ආරම්භ කරන ලද පර්යේෂණ ව්‍යාපෘති දහ හතකින් (17) සමන්විත වේ. එයට අමතරව, NSF සහ NRC ප්‍රදානයන් යටතේ බාහිර මූල්‍යාධාර ලැබූ පර්යේෂණ ව්‍යාපෘති වශයෙන් ව්‍යාපෘති දෙකක්ද (02), ශිෂ්‍ය ව්‍යාපෘති වශයෙන් ව්‍යාපෘති (02) ක්ද සිදු කරන ලදී.

2015 වර්ෂයේ සිට පහත සඳහන් පර්යේෂණ ව්‍යාපෘති අඛණ්ඩව සිදු කරන ලද අතර 2016 දීද සිදු කරන ලදී. වර්ෂයේ විවිධ කාර්තු තුළ ඒවායින් සමහරක් සම්පූර්ණ කරන ලදී.

## 2015 වර්ෂයේ සිට 2016 වර්ෂය දක්වා සිදු කෙරෙමින් පවතින ව්‍යාපෘති

(a) 1-MCP (1-මෙතිල්ක්ක්ලොප්රොපෙන්) යෙදීම මගින් 'ඇඹුල්' කෙසෙල්වල පසු අස්වනු ජීව කාලය දීර්ඝ කිරීම.
b) රටකජු පොතු ඉවත් කිරීමේ යන්ත්‍රයක් (ඩිකෝර්ටිකේටර්) නිර්මාණය කිරීම සහ සංවර්ධනය කිරීම
c) ශීතජනක විද්‍යාව භාවිතයෙන් මිරිස් කුඩුවල විශාලත්වය අඩු කිරීම
d) සහල් සැකසීමේදී අධෝරක්ත (IR) කිරණ භාවිතා කිරීම
e) ශ්‍රී ලංකාවේ වගා කරනු ලබන ලූණු (*Alluiumrubrum සහ Alluium cepa*) සඳහා වැඩිදියුණු කළ පසු-අස්වනු තාක්ෂණික ක්‍රමවේද හඳුනාගැනීම
f) ජලාකර්ශක ද්‍රව්‍ය භාවිතයෙන් වීවල වියළීමේ කාර්යක්ෂමතාව ඉහළ නැංවීම
g) දේශීය එළවළු අධිශීත කර කල්තබා ගැනීම සඳහා ක්‍රමවේදයක් සකස් කිරීම
h) කෘෂිකාර්මික භෝග පිරිසිදු කිරීම සහ ගල් ඉවත් කිරීම සඳහා තාක්ෂණික ක්‍රමවේදයක් සකස් කිරීම
i) දේශීයව පවතින පලතුරුවලින් වයින් නිෂ්පාදනය කිරීම පිළිබඳව අධ්‍යයනය කිරීම
j) මඤ්ඤොක්කා පිටි සකස් කිරීම සහ ආහාර සකස් කිරීම සඳහා එම පිටි භාවිතා කිරීම.
k) ශ්‍රී ලංකාවේ විවිධ දිස්ත්‍රික්කවල වගා කරනු ලබන සමහර ජනප්‍රිය එළවළු වර්ගවල බර ලෝහ අපවිත්‍රනය පිළිබඳ ඇස්තමේන්තු කිරීම

## 2016 වර්ෂයේ නව ව්‍යාපෘති

a) විවිධ ගබඩා තත්ත්වයන් යටතේ දෙහි භෝගයේ රාක්ක ජීව කාලය දීර්ඝ කිරීම මත පලතුරු ආලේපනයක බලපෑම් තක්සේරු කිරීම
b) එළවළුවල පසු අස්වනු හානිය අවම කිරීම සඳහා ශීත දාම අධ්‍යයන ආරම්භ කිරීම
c) ගොවිපොළ ගබඩා කිරීමේදී වීවල පසු අස්වනු බර අඩු වීම හා ගුණාත්මකභාවය පිරිහීම නිශ්චය කිරීම
d) IPHT බඩඉරිඟු වියලන යන්ත්‍රය වෙනස් කිරීම ඇගයීම-අත්හිටුවන ලදී
e) තැටි වර්ගයේ යාන්ත්‍රික වියළන යන්ත්‍රයක් භාවිතා කරමින් පලතුරු සහ එළවළු විජලනය කිරීමේ ක්‍රියාවලිය
f) හදිසි තත්ත්ව යටතේ තෙත් වී වියළීම පිළිබඳ අධ්‍යයනය කිරීම
g) කාබනික සිලිකන් ප්‍රභවයන් භාවිතයෙන් විසින් එළවළුව පසු අස්වනු රෝග පාලනය කිරීම
h) එළවළු කැරොටිනොයිඩවල සමස්ත ප්‍රතිඔක්සිකාරක ධාරිතාවය සහ in-vitro ජෛව ප්‍රවේශය මත සකස් කිරීමේ බලපෑම
i) පාරම්පරික සහ වැඩිදියුණු කළ සහල් ප්‍රභේදවල පෝෂණ ගුණාංග සහ බැර ලෝහ අපවිත්‍රනය විශ්ලේෂණය කිරීම
j) ඕසෝන් ජීවාණුහරණය භාවිතා කරමින් කුළුබඩුවල තත්ත්වය වැඩිදියුණු කිරීම
k) කාබනික ක්‍රමවේද භාවිතා කර පලතුරු ඉදවීම උත්ප්‍රේරණය කිරීම

07

බාහිර අරමුදල් ලැබූ පර්යේෂණ ව්‍යාපෘති (NSF සහ NRC විසින් අරමුදල් සපයන ලද)

a) පළතුරු සෘතු ඵල විද්‍යාව, පලතුරුවල ගුණාත්මකභාවය මත පෙර අස්වනු පත්‍ර පෝෂක සහ දෙහි භෝගයේ (*Citrus aurantifoila* Swingle) පසු අස්වනු ජීව කාලය ඉහළ නැංවීම (ජාතික විද්‍යා පදනම විසින් අරමුදල් සපයන ලදී)
b) දෙහි භෝගයේ (*Citrus aurantifoila* Swingle) පසු අස්වනු ජීව කාලය ඉහළ නැංවීම සඳහා පසු අස්වනු ප්‍රතිකාර සහ ගබඩා කිරීමේ උපාය මාර්ග සංවර්ධනය කිරීම (ජාතික පර්යේෂණ සභා අරමුදල් සැපයූ ව්‍යාපෘතියකි) ප්‍රදාන අංකය 15-154 (අරමුල් ලැබී නොමැත)

පෞද්ගලික අරමුදල් ලැබූ ව්‍යාපෘති

a) අඛණ්ඩව වී තැම්බීම සිදු කළ හැකි උපකරණයක් (මාර්ග ගත උඳුන) එහි කාර්ය සාධනය සඳහා ඇගයීම (අරමුදල් ලැබී නොමැත)
b) TJC අඹවල ගුණාත්මකභාවය පිරිහීම සම්බන්ධයෙන් අධ්‍යයනය කිරීම සහ පාලන ක්‍රියාමාර්ග ගැනීම (අරමුදල් ලැබී නොමැත)
c) ඉහළ සැරබවක් සහිත දේශීය මිරිස් වර්ගයක් භාවිතා කරමින් සකස් කරන ලද මිරිස් සෝස්වල සකස් කිරීමේ ක්‍රියාවලිය සහ තත්ත්ව ඇගයීම (පානිනි ඉන්ටර්නැෂනල් (පෞද්.) සමාගම විසින් අරමුදල් සපයන ලදී)
d) මධ්‍යම පරිමාණයේ සහල් සිටි නූඩ්ල්ස් සකස් කිරීමේ ක්‍රියාවලිය සංවර්ධනය කිරීම සහ ප්‍රශස්ත කිරීම (අරමුදල් ලැබී නොමැත)

ශිෂ්‍ය ව්‍යාපෘති

a) පරමාණුක අවශෝෂක වර්ණාවලිමිතිය (AAS) භාවිතා කරමින් අනුරාධපුර දිස්ත්‍රික්කයේ තෝරාගත් එළවළු ප්‍රභේද තුනක බැර ලෝහ (As, Pb, Cd) නිශ්චය කිරීම, ආහාර විද්‍යා සහ තාක්ෂණ දෙපාර්තමේන්තුව, ව්‍යවහාර විද්‍යා පීඨය, ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය
b) ශ්‍රී ලංකාවේ, අනුරාධපුර දිස්ත්‍රික්කයේ, මැදවච්චිය සහ ඉපලෝගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවල, තෝරාගත් එළවළු සහ ජල සාම්පලවල කැඩ්මියම්, ආසනික් හා ඊයම් වල මට්ටම මැනීම. සත්ත්ව සහ ආහාර දෙපාර්තමේන්තුව, කෘෂිවිද්‍යා පීඨය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය

සංවර්ධන ව්‍යාපෘති

ආයතනය විසින් සංවර්ධිත පශ්චාත් අස්වනු තාක්ෂණයන් ඵලදායීව ව්‍යාප්ත කිරීම සඳහා, 2016 වර්ෂය තුළදී පඅතාආ විසින් පහත සඳහන් සංවර්ධන ව්‍යාපෘති දිවයින පුරා සිදු කර ඇත. ආහාර සුරක්ෂිතතා වැඩසටහන යටතේ කෘෂිකර්ම අමාත්‍යාංශය විසින් මෙම ව්‍යාපෘති තුන සඳහා අරමුදල් සපයන ලදී.

a) ශ්‍රී ලංකාවේ අඹවල සැපයුම් සහ වටිනාකම් දාම කළමනාකරණ භාවිතයන් වැඩිදියුණු කිරීම.
b) ශ්‍රී ලංකාවේ ප්‍රධාන කෘෂිකාර්මික ආයතනවලදී කෘෂිකාර්මික ආහාර භෝගවල පසු අස්වනු හානිය අවම කිරීම පිළිබඳ පුහුණුකරුවන් පුහුණු කිරීම.
c) කාබනික ක්‍රමවේද මඟින් පලතුරු ඉදවීම උත්ප්‍රේරණය කිරීම.

"ශ්‍රී ලංකාවේ අඹවල සැපයුම් සහ වටිනාකම් දාම කළමනාකරණ භාවිතයන් වැඩිදියුණු කිරීම" , "ශ්‍රී ලංකාවේ ප්‍රධාන කෘෂිකාර්මික ආයතනවලදී කෘෂිකාර්මික ආහාර භෝගවල පසු අස්වනු හානිව අවම කිරීම පිළිබඳ පුහුණුකරුවන් පුහුණු කිරීම" සහ "කාබනික ක්‍රමවේද මඟින් පලතුරු ඉදවීම උත්ප්‍රේරණය කිරීම" යන ව්‍යාපෘතිවල මූල්‍ය ප්‍රගතිය පිළිවෙළින් 93.15%, 99.76% හා 93% ක් සහ භෞතික ප්‍රගතිය පිළිවෙළින් 100%, 100% හා 43% ක් වේ.

ඉහත ව්‍යාපෘති තුනට අමතරව, "ග්‍රාමීය මට්ටමේ ආදායම් උත්පාදනය/තෝරාගත් ප්‍රතිලාභීන්ගේ ආදායම වැඩි කිරීම (ශ්‍රී ලංකාවේ මහවැලි ගංගා ද්‍රෝණියේ ජීවත් වන කෘෂිකාර්මික ප්‍රජාවන් මුහුණ දෙන දේශගුණික විපර්යාස බලපෑම් සඳහා විසඳුම් ඉදිරිපත් කිරීම)"



මහවැලි සංවර්ධන අමාත්‍යාංශය යටතේ පඅතාආ විසින් 2016 වර්ෂයේදී පවත්වන ලදී.

## පුහුණුව



පශ්චාත් අස්වැන්න පිළිබඳ තාක්ෂණ ආයතනයේ පුහුණුව සඳහා වන ඉල්ලුම පෙර සිට වර්ධනය වෙමින් පවතී. ආයතනය විසින් ධාන්‍ය, අල සහ බල්බ, පළතුරු සහ එළවළු වර්ගයන්හි පසු අස්වනු තාක්ෂණ ක්ෂේත්‍රය සම්බන්ධයෙන් නිෂ්පාදකයින්, සැකසුම්කරුවන්, වෙළඳ ව්‍යාපාරිකයන් සහ සේවකයින් සහ විශ්වවිද්‍යාල සහ වෙනත් අධ්‍යාපනික ආයතනවල ශිෂ්‍යයන් සඳහා නිෂ්පාදනය/ව්‍යාප්තිය ඉලක්ක කරගත් පුහුණු වැඩසටහන් පවත්වයි. ක්‍රියාකාරකම් වන අතර, රාජ්‍ය සහ පෞද්ගලික අංශ නියෝජිතායතනයන්හි දැනුම ඉහළ නැංවීම උදෙසා ඉලක්ක කර ඇත. සමාලෝචිත වර්ෂය තුළදී අධ්‍යයන චාරිකා ඇතුළුව නේවාසික පුහුණු පාඨමාලා හතලිස් අටක් (48) පවත්වා පුද්ගලයන් 1714ක් පුහුණු කරන ලදී. ක්ෂේත්‍ර මධ්‍යස්ථාන තුළදී අනේවාසික පාඨමාලා දෙසිය හැත්තෑ තුනක් (273) පවත්වා පුද්ගලයන් 5752ක් පුහුණු කරන ලදී.

## ව්‍යාප්තිය

ව්‍යාප්ති අංශය, රාජ්‍ය හා රාජ්‍ය නොවන සංවිධාන සමග සහයෝගීත්වයෙන් යුතුව දිවයින පුරා පිහිටි එහි ව්‍යාප්ති මධ්‍යස්ථාන හරහා සිය තාක්ෂණ ව්‍යාප්ති ක්‍රියාකාරකම් සිදු කරයි. ආයතනයේ ප්‍රධාන ක්‍රියාරකම්වලින් එකක් වන ක්ෂේත්‍ර මට්ටමේ ව්‍යාප්ති කටයුතු මගින් තාක්ෂණ ව්‍යාප්තිය එක් 2016 වර්ෂය තුළ අඛණ්ඩව සිදු කරගෙන ගොස් ඇත.

පහත දැක්වෙන ප්‍රධාන භෝග නිෂ්පාදනය කරනු ලබන ප්‍රදේශවල පිහිටි පශ්චාත් අස්වැන්න පිළිබඳ තාක්ෂණ මධ්‍යස්ථාන හතකින් දිවයින පුරා පිහිටි ව්‍යාප්ති ජාලය සමන්විත වේ:

a) අනුරාධපුරය (අනුරාධපුරය, පොලොන්නරුව, ත්‍රිකුණාමලය ආවරණය කිරීම)
b) අඹන්පොල (කුරුණෑගල, පුත්තලම, ගම්පහ ආවරණය කිරීම)
c) මහනුවර (මහනුවර, මාතලේ, කෑගල්ල ආවරණය කිරීම)
d) නුවරඑළිය (නුවරඑළිය, වැලිමඩ ආවරණය කිරීම)
e) අම්පාර (අම්පාර, මොණරාගල, මඩකලපුවෙහි කොටසක්, මහවැලි සී කලාපය ආවරණය කිරීම)
f) හම්බන්තොට (හම්බන්තොට, මාතර, ගාල්ල, ඇඹිලිපිටිය ආවරණය කිරීම)
g) කිළිනොච්චිය (කිළිනොච්චිය, වව්නියාව, මුලතිව්, යාපනය, මන්නාරම ආවරණය කිරීම)

### තාක්ෂණ පැවරීම් කටයුතු සඳහා තෝරාගත් විවිධ ප්‍රධාන අංශ

a) කෘෂි භෝගවල පසු අස්වනු හානිය අවම කිරීම
b) ගබඩාකරණ ක්‍රම සඳහා තාක්ෂණය හඳුන්වාදීම
c) සහල්, මාෂ භෝග සහ අනෙකුත් ධාන්‍ය සැකසීම
d) කුළුබඩු සැකසීම
e) පලතුරු සහ එළවළු සඳහා අගය එකතු කිරීම
f) සහල් සහ මාෂ භෝග ආශ්‍රිත නිෂ්පාදන සංවර්ධනය
g) ශ්‍රී ලංකාවේ මානව පෝෂණය හා ආහාර පුරුදු පිළිබඳව දැනුම්වත් කිරීමේ වැඩසටහන්

## උපදේශනය

පඅතාආ විසින් පසු අස්වනු කර්මාන්තයේ සෘජුව හෝ වක්‍රව නිරතව සිටින රාජ්‍ය, පෞද්ගලික සහ සමූපකාර අංශ සංවිධාන සඳහා උපදේශක හා උපදේශන සේවා සපයයි. මෙම සේවාවන් සැපයීමෙන්, නව සැකසුම් මධ්‍යස්ථාන කිහිපයක් ස්ථාපිත කිරීම, පවත්නා බලාගාර නවීකරණය කිරීම සහ එදිනෙදා කටයුතු වලදී සහල් සැකසුම්කරුවන් හා ආහාර සැකසුම්කරුවන් මුහුණ දෙනු ලබන තාක්ෂණික ගැටලු විසඳා ගැනීම සඳහා 04

තොරතුරු උපදේශන 67 ක් ලබා දීමට ආයතනය සමත් විය. 2016 වර්ෂයේදී අපනාආ මහා භාණ්ඩාගාරයේ සංවර්ධන මූල්‍ය දෙපාර්තමේන්තුවේ “ගබඩා ලදුපත් ව්‍යාපෘතියට” උපදේශකයෙකු ලෙස කටයුතු කර ඇත. තවද, ග්‍රාමීය ආර්ථික අමාත්‍යාංශය විසින් පවත්වන ලද "ශීත ගබඩා ස්ථාපිත කිරීමේ" ව්‍යාපෘතියට පඅතාආ විසින් ඔවුන්ගේ තාක්ෂණික යෙදවුම් ලබාදී ඇත. ඔවුන්ගේ පහසුකම් වැඩිදියුණු කර ගැනීම සඳහා තවත් උපදේශන සහ තාක්ෂණික යෙදවුම් කිහිපයක් සමහර වී මෝල් කර්මාන්තවලට ලබා දී ඇත.

### ඉංජිනේරු සහ පරීක්ෂණාගාර සේවාවාන්

ඉන්ජිනේරු හා පරීක්ෂණාගාර සේවා සඳහා ආයතනය විසින් නව අංශ දෙකක් පිහිටුවන ලදී. මෙම අංශ දෙක ස්ථාපිත කිරීමේ ප්‍රධාන අරමුණ වන්නේ පාර්ශවකරුවන්ගේ අවශ්‍යතා සපුරාලීමයි. විශේෂයෙන්, ඉංජිනේරුමය සේවා අංශය මගින් පසු අස්වනු යන්ත්‍රෝපකරණ භාවිතා කරන්නන්ට විශේෂයෙන්ම වී මෝල් කිරීම, සහල් පිටි පිරවීම, කුළුබඩු අඹරාගැනීම ආදිය පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාවක් හඳුන්වාදෙයි. පඅතාආ පරීක්ෂා කිරීමේ පහසුකම් ශක්තිමත් කිරීම සඳහා පරීක්ෂණාගාර සේවා අංශය පිහිටුවන ලද අතර කර්මාන්තයට ජාත්‍යන්තරව තරඟකාරී පරීක්ෂණ සේවාවන් සැපයීම පිණිස උසස් තත්ත්වයේ, ඉහළ සංවේදී හා අති නවීන තාක්ෂණයෙන් යුත් උපකරණ කිහිපයක් පෙර වසරෙහි ලබා ගන්නා ලදී. සමාලෝචිත කාල පරිච්ඡේදය තුළදී නියැදීන් අසූ අටක් (88) විශ්ලේෂණය කරන ලදී.

### ප්‍රකාශන, පේටන්ට් බලපත්‍ර, සම්මාන සහ පිළිගැනීම්

පර්යේෂණ සොයාගැනීම් සඳහා ජනාධිපති සම්මාන තුනක් පඅතාආ විද්‍යාඥයන් විසින් දිනා ගන්නා ලදී. පඅතාආ විද්‍යාඥයින්ගේ විද්‍යාත්මක පත්‍රිකා 28 ක් අදාළ ජර්නල සහ වෙනත් ජර්නලවල ප්‍රකාශයට පත් කෙරිණි. 2016 වර්ෂය තුළදී ආයතනය විසින් පඅතාආ ක්‍රියාකාරකම් සහ නව තාක්ෂණය ප්‍රසිද්ධ කිරීම සඳහා ව්‍යාප්ති පත්‍රිකා සහ අත් පත්‍රිකා ප්‍රකාශයට පත් කරන ලදී. මෙම සන්දර්භය තුළ පුහුණුවන්නන් සහ පාර්ශ්වකරුවන් අතර ව්‍යාප්ති අත්පත්‍රිකා 9176 ක් බෙදා දෙන ලදී.



### ආයතනික සංවර්ධනය

ආයතනය විසින් 2016 වර්ෂයේදී එහි අංශ ප්‍රතිව්‍යුහගත කර ඇති අතර මේ වනවිට සමස්ත ආයතනික ව්‍යුහය ප්‍රතිව්‍යුහගත කිරීමේ ක්‍රියාවලියෙහි නිරත වේ.

1. පර්යේෂණ අංශය
2. ඉංජිනේරු සේවා අංශය
3. ව්‍යාප්ති අංශය
4. රසායනාගාර සේවා අංශය
5. සැලසුම් හා අධීක්ෂණ අංශය
6. සංවර්ධන ව්‍යාපෘති අංශය
7. පරිපාලන අංශය

10

8. මූල්‍ය අංශය
9. අභ්‍යන්තර විගණන අංශය
10. තොරතුරු තාක්ෂණ අංශය

### මූල්‍ය කාර්ය සාධනය

2015 වර්ෂය හා සැසඳීමේදී 2016 වර්ෂය තුළ මූල්‍ය කාර්ය සාධනය සාධනීය වර්ධනයක් පෙන්නුම් කර ඇත.

| විස්තරය | 2015 (රු.මි.) | 2016 (රු.මි.) | වර්ධනය (රු.මි.) |
|---|---|---|---|
| වර්ෂය සඳහා ඌනතාවය | (18.4) | (9.5) | 8.9 |
| මුදල් හා සමාන දෑ | 11.94 | 29.8 | 17.86 |
| මුළු ජංගම වත්කම් | 15.25 | 33.8 | 18.55 |
| මුළු ජංගම බැරකම් | 24.3 | 17.4 | 6.9 |
| ශුද්ධ වත්කම් (සමකොටස්) | 168.6 | 175.7 | 7.1 |

### මානව සම්පත

පඅතාආ අධ්‍යක්ෂ ආචාර්ය බී.එම්.එස්.කේ. තිලකරත්න මහතා තම තනතුරෙන් ජූලි මස සිට විශ්‍රාම ගිය අතර ඊට පෙර 2016 අප්‍රේල් මාසයේදී ඩී.පී.සී. ස්වර්ණසිරි මහතා සිය තනතුරෙන් විශ්‍රාම ගියේය. පඅතාආ පරීක්ෂණාගාරයේ තාක්ෂණ නිලධාරි රංජිත් පලිපාන මහතා දිගු කාලීන කැපවූ සේවයක් ඉටු කිරීමෙන් අනතුරුව විශ්‍රාම ගැන්වීය. ආචාර්ය බී.එම්.එස්.කේ. තිලකරත්න මහතාගේ විශ්‍රාම යෑමෙන් පසුව ජ්‍යෙෂ්ඨ යාන්ත්‍රික ඉංජිනේරු ටී.එම්.ආර්.දිසානායක මහතා 2016 ජූලි මස සිට පඅතාආ වැඩබලන අධ්‍යක්ෂ ලෙස පත් කරන ලදී. පඅතාආ පර්යේෂණ කණ්ඩායම ශක්තිමත් කිරීම සඳහා නව පර්යේෂණ නිලධාරින් දස දෙනෙක් බඳවා ගනු ලැබිණි.

### සේවක සබඳතා සහ සුභසාධන ක්‍රියාමාර්ග

සේවක සේවිකාවන්, ඔවුන්ගේ පවුල් සහ ජනතාව අතර යහපත් සම්බන්ධතා ගොඩනඟා ගැනීම සඳහා සුබ සාධන කටයුතු අඛණ්ඩව සිදු කරන ලදී. සභාපතිවරයාගේ මඟපෙන්වීමට අනුව, පොසොන් උත්සව සමයේ ආයතනයේ සුභසාධක සමිතිය විසින් "රයිස් ක්‍රීම් දන්සලක්" පැවැත්වීය. එමෙන්ම වසර අවසානයේදී කාර්ය මණ්ඩලයේ පවුල්වල සාමාජිකයන්ගේ හමුවක්ද පැවැත්විණි.



ඉංජි. මහේෂ් දිසානායක
අධ්‍යක්ෂ/ප්‍රවිනි

11

# 04. කාර්ය සාධන විශේෂතා

## පර්යේෂණ

### තැටි වර්ගයේ යාන්ත්‍රික වියළන යන්ත්‍රයක් භාවිතා කරමින් පලතුරු සහ එළවළුවල විජලනය කිරීමේ ක්‍රියාවලිය ප්‍රශස්ත කිරීම



වට්ටක්කා සහ ගස්ලබු යනු ශ්‍රී ලංකාවේ නිෂ්පාදනය කරනු ලබන වැදගත් වෙළඳ භෝග දෙකක් වන අතර අළෙවිකරණයේදී මෙම භෝගවල විශාල තොග ප්‍රශස්ත ප්‍රමාණයටය වඩා කුඩා වීම සහ විරූපවීම ආදිය හේතුවෙන් ප්‍රතික්ෂේප කරනු ලැබේ. තවද, බීජ වර්ග නිස්සාරණය සඳහා භාවිතා කරන විට මෙම භෝගවල මාංශය අපද්‍රව්‍යයක් ලෙස ඉවත දමනු ලැබේ. එබැවින්, ගොවීන් සඳහා අතිරේක ආදායමක් සහතික කිරීම පිණිස ප්‍රශස්ත ප්‍රමාණයට වඩා කුඩා වර්ගවල සහ බීජ ලබා ගැනීම සඳහා භාවිතා කරනු ලබන ඒවායින් ප්‍රයෝජනයක් ලබා ගැනීම සඳහා විජලනය කිරීමේ තාක්ෂණයන් සංවර්ධනය කිරීම වැදගත් වේ. මෙම අධ්‍යයනය මගින් ගස්ලබු සහ වට්ටක්කාවලින් උසස් තත්ත්වයේ විජලනය කරන ලද නිෂ්පාදිත නිෂ්පාදනය කිරීම සඳහා කුටි තුනක තැටි වියළීමේ යන්ත්‍රයක් හඳුන්වාදීම අරමුණු කෙරේ.

විශාල පරිමාණයේ කුටි තුනක වියළීමේ යන්ත්‍රයක් ඇගයීමට ලක් කරන ලද අතර ගොවීන් හා සැකසුම්කරුවන්ට හඳුන්වාදීම සඳහා සැකසීමේ පරාමිතීන් ප්‍රශස්තකරණය කර ඇත. සුප්, අවුළුපත් ආදිය නිෂ්පාදනය කළ හැකි හැකි උසස් තත්ත්වයේ වට්ටක්කා කුඩු නිපදවීමට තාක්ෂණික පැකේජයක් සකස් කර ඇත.

සෙන්ටිග්‍රේඩ් අංශක 55-60 ත් අතර පැය 7ක කාලයක් සහ සෙන්ටිග්‍රේඩ් අංශක 40-45 ත් අතර පැය 10ක කාලයක් වියළීමකින් පසුව පිළිගත හැකි වට්ටක්කා හා ගස්ලබු නිෂ්පාදනයක් ලබා ගත හැකි බව අධ්‍යයන මගින් අනාවරණය වී ඇත. වියළන යන්ත්‍රයේ ඉන්ධන පරිභෝජනය පැයට ලීටර 3.1 (භූමිතෙල්) ක් වන අතර එක් එක් මෝටරය සඳහා විදුලි පරිභෝජනය ඇම්පියර 6.2 කි.

ව්‍යාපෘතියේ ප්‍රධාන අරමුණ වූයේ, ගස්ලබු සහ වට්ටක්කා වගා කිරීම, බීජ නිෂ්පාදනය සහ සැකසීමේ නිරතව සිටින ගොවීන් සහ සැකසුම්කරුවන් සඳහා ආදායම් උත්පාදන අවස්ථාවන් නිර්මාණය කිරීමයි. එපමණක්ද නොව, සකස් කරන ලද නිෂ්පාදනයට ඉතා හොඳ ජාත්‍යන්තර වෙළඳපොළක් ඇති අතර එවැනි භාණ්ඩ අපනයනය කිරීමෙන් වැඩි විදේශ විනිමයක් උපයා ගැනීමේ හැකියාවක් පවතී.

### 1-MCP (1-මෙතිල්ක්ක්ලොප්රොපෙන්) යෙදීම මගින් 'ඇඹුල්' කෙසෙල්වල පසු අස්වනු ජීව කාලය දීර්ඝ කිරීම

විවිධ ගබඩා තත්ත්වයන් යටතේ සාන්ද්‍රණය සහ නිරාවරණ කාලසීමාව අනුව 1-MCP භාවිතා කර "ඇඹුල්" කෙසෙල්වල රාක්ක ජීව කාලය දීර්ඝ කිරීම සඳහා සුදුසු තාක්ෂණයන් සංවර්ධනය කිරීම අධ්‍යයනයෙන් අරමුණු කරන ලදී. කෙසෙල් ගෙඩි 1-MCP සාන්ද්‍රණ හතරකට මෙන්ම විවිධ කාල පරාස හතරකදී 1-MCP ට නිරාවරණය කරන ලදී. කෙසෙල් සාම්පල සාමන්‍ය කාමර උෂ්ණත්වයේ සහ ශීත කාමර තත්ත්ව යටතේ ගබඩා කරන ලදී. ඉන්පසු ඉදීමේ දර්ශක, මුළු ද්‍රාව්‍ය ඝනද්‍රව්‍ය ප්‍රමාණය, ස්කන්ධ හානිය, ක්ලෝරෝෆිල් ප්‍රමාණය, පලතුරු ඝනභාවය සහ පොත්තෙහි වර්ණය වැනි භෞත-රසායනික තත්ත්ව පරාමිති භාවිතා කරමින් ප්‍රතිකාර කරන ලද කෙසෙල් නියැදිවල රාක්ක ජීව කාලය අගයන ලදී. හොඳින් පැසුනු කොළ පැහැති "ඇඹුල්" කෙසෙල් සඳහා 1-MCP යෙදීම මගින් ශීත කාමර ගබඩාකරණ තත්ත්ව යටතේ (සෙන්ටිග්‍රේඩ් 14 සහ 85 ± 5%) ඉදීම ප්‍රමාද කිරීමෙන් රාක්ක ජීව කාලය දින 30 ක් දක්වා දීර්ඝ කළ හැකි බව අධ්‍යයනයෙන් අනාවරණය විය.

'ඇඹුල්' කෙසෙල්වල රාක්ක ජීව කාලය දීර්ඝ කර ගැනීමෙන් අදාළ කෙසෙල් ප්‍රභේදයේ අපනයන පරිමාව වැඩි කර ගත හැකි වන අතර එමගින් වැඩි විදේශ විනිමයක් උපයා ගත හැකි වනු ඇත. මීට අමතරව, ගොවිපොළ මට්ටමින් කෙසෙල්වල මිල ගණන්ද ඒ සමඟම ඉහළ යැමෙන් ගොවීන්ගේ ජීවන තත්ත්වයද ඉහළ යනු ඇත.

## කාබනික සිලිකන් ප්‍රභවයන් භාවිතා කිරීමෙන් එළවළුවල පසු අස්වනු රෝග පාලනය කිරීම

කරවිල (*Momordica charantia L.*) සහ බටු (*Solanum melongina* L.) යනු අග්නිදිග ආසියාවේ ඉහළ ජනප්‍රියතාවයක් සහිත එළවළු වර්ග දෙකක් වන අතර ඉහළ පාරිභෝගික ඉල්ලුමක් ඇති ඒවාය. කෙසේ වෙතත් මේ බෝග දෙක විවිධ වර්ධන අවධිවලදී අස්වැන්න හා නිෂ්පාදන ගුණය අඩු කිරීමට හේතු වන බොහෝ දිලීර රෝග වලට බොහෝ සෙයින් ගොදුරු වේ. මෙම තත්වය හේතුවෙන් ගොවීන්/වගාකරුවන් විසින් රෝගී තත්ත්වයන් ඇති වීම අවම කිරීම සඳහා වාණිජ දිලීර නාශක ගණනාවක් භාවිතා කර ඇති අතර අවසානයේදී එමගින් පෝෂණය හා ආරක්ෂාව සම්බන්ධ තත්ත්වයන් අඩු වීම සිදු වේ. කෘතිම අකාබනික දිලීර නාශක භාවිතය සම්බන්ධයෙන් හඳුනාගත් බොහෝ දුර්වලතා හේතුවෙන් එවැනි රෝග පාලනය කිරීම සඳහා ආරක්ෂිත, පරිසර හිතකාමී විකල්ප ක්‍රම සංවර්ධනය කිරීම සඳහා උනන්දුවක් ඇති කර ඇත.

සිලිකන් (Si) බොහෝ ශාකවල රෝග පාලනය කිරීම අනුව එහි ඵලදායී බලපෑම් සඳහා ප්‍රයෝජනයට ගෙන ඇත. වී පොත්ත සිලිකන් බහුලව පවතින ස්වභාවික ප්‍රභවයක් වන අතර වී පොතුවල අඩංගු Si ප්‍රමාණය 18-20% පමණ වේ. එයින් 8-9% ක් ද්‍රාව්‍යය Si වේ. කරවිල සහ බටුවල පෙර අස්වනු සහ පසු අස්වනු රෝග පාලනය කිරීම සඳහා ස්වභාවික Si මූලාශ්‍රයක් ලෙස වී පොතුවල බලපෑම මෙම අධ්‍යයනයෙන් ඇගයීමට ලක් කරන ලදී. කරවිලවල කුඩු සහිත පුස්, බූව සහිත පුස් සහ ෆියුසාරියම් ඵල කුණුවීම සහ බටුවල ඇන්ත්‍රැක්නෝස් රෝග පාලනය කිරීම සඳහා කුඩු කරන ලද අමු වී පොතු සහ දවන ලද වී පොතුවල (සුදු අළු) සඵලත්වය ප්‍රතිඵලවලින් අනාවරණය විය. කෙසේවෙතත්, කරවිල හා සැසඳීමේදී සිලිකන් මගින් බටුවල රෝගය පාලනය කිරීමේ සඵලත්වයෙහි අඩුවක් නිරීක්ෂණය විය. එකතු කළ යුතු හොඳම Si සාන්ද්‍රණය පස් කිලෝග්‍රෑමයට සිලිකන් මිලිග්‍රෑම් 200 ක් වේ. කෘතිම දිලීර නාශක සඳහා විකල්පයක් ලෙස මෙම තාක්ෂණය හඳුන්වාදීමට පෙර ගොවිබිම්වල නැවත නැවතත් පරීක්ෂණ සිදු කිරීම අවශ්‍ය වේ. එළවළු සැපයුම් දාමයේ සියලුම පාර්ශ්වයන් පර්යේෂණයේ සොයාගැනීම්වල ප්‍රතිලාභීන් වේ. මීට අමතරව, මෙම අධ්‍යයනයේ සොයාගැනීම් මගින් සහල් මෝල් කර්මාන්තයේ අතුරුඵල උපයෝගීතාවය වැඩිදියුණු වනු ඇත.

ගොවි ක්ෂේත්‍රවල ක්ෂේත්‍ර අත්හදා බැලීම්වලින් පසුව මෙය දිවයිනෙහි තිරසර කෘෂිකාර්මික සංවර්ධනය ප්‍රවර්ධනය කිරීම පිණිස ශාක රෝග පාලනය කිරීම සඳහා තාක්ෂණිකව යහපත්, ආර්ථික ශක්‍යතාවයක් සහිත, පරිසර හිතකාමී සහ සමාජීයව පිළිගත හැකි ක්‍රමවේදයක් ලෙස හඳුන්වා දිය හැකිය.

## තක්කාලි යුෂවල මුළු ඔක්සිකාරක ධාරිතාවය සහ ලයිකොපීන් ජෛව-ප්‍රවේශය මත තාප සැකසීමේ බලපෑම ඇගයීම

තක්කාලි යුෂ අපනයන විභවයක් සහිත වැදගත් නිෂ්පාදනවලින් එකක් වන අතර සකස් කිරීමෙන් පසුව සහ ගබඩා කිරීමේදී ගුණාත්මක ලක්ෂණ රඳවා තබා ගැනීම කර්මාන්තය සඳහා විශාල අභියෝගයක් වී තිබේ. නිෂ්පාදන ආකර්ශනීයත්වය සහ පිළිගතබව අහිමි වීම සඳහා හායනය වීම හේතු විය හැකි බැවින් සැකසීමේදී හා ගබඩා කිරීමේදී ලයිකෝපීන්වල ස්ථාවරත්වය තීරණාත්මක වේ. එබැවින් සැකසීමේ පරාමිතීන් ප්‍රශස්තකරණය කිරීම සඳහා සහ වැඩි දියුණු කළ ලයිකොපීන් ජෛව-ප්‍රවේශයක් සහිත උසස් තත්ත්වයේ තක්කාලි යුෂ ලබා ගැනීම සඳහා සුදුසු ප්‍රභේදයක් විමර්ෂණය කිරීම සඳහා මෙම පර්යේෂණය සිදු කරන ලදී. තිළින, මහේෂි සහ ලංකා ඇඹුල් යන තක්කාලි ප්‍රභේද පර්යේෂණය සඳහා භාවිතා කරන ලද අතර නැවුම් ඵලවල රසායනික ගුණ විශ්ලේෂණය කිරීමෙන් පසුව යුෂය තාප සැකසීම සඳහා යොමු කෙරිණි. සියලු තත්ත්ව පරාමිතීන් සංරක්ෂණය කරමින් සහ ලයිකෝපීන් ජෛව-ප්‍රවේශය ඉහළ නැංවමින් තාප ප්‍රතිකාරකය ප්‍රශස්තකරණය කිරීම සිදු කරමින් පවතින අතර 2017 වර්ෂයේදී සම්පූර්ණ කිරීමට නියමිතය.

## දේශීයව පවතින පලතුරුවලින් වයින් නිෂ්පාදනය කිරීම සඳහා අධ්‍යයන සිදු කිරීම

දේශීය පලතුරුවලින් වයින් නිෂ්පාදනය කිරීම සඳහා ක්‍රමවේදයක් සහ වට්ටෝරු සකස් කිරීම ව්‍යාපෘතියේ මූලික අදහස විය. දේශීය මිදි, අන්නාසි, කොස් සහ කොමඩු වයින් නිෂ්පාදනය සඳහා ප්‍රයෝජනයට ගත හැකි පලතුරු ලෙස හඳුනාගෙන ඇත. වයින් යනු පැසීමට ලක් කරන ලද පලතුරුවලින් සෑදූ මධ්‍යසාර පානයක් වන අතර එහි බොහෝ සෞඛ්‍ය ප්‍රතිලාභ පවතී. රතු මිදි පොතු වයින්වල පවතින වයසට යෑම පාලනය කිරීමේ ගුණ, සුදු පැහැති වයින් වල ප්‍රතිඔක්සිකාරක ගුණ මගින් පෙනහළු ක්‍රියාකාරිත්වය ඉහළ නැංවීම, කිරීටක හෘද රෝග අඩු කිරීම, වැඩිහිටි ජනතාවගේ රුධිර වාහිනී සෞඛ්‍ය සම්පන්න හා ශක්තිමත් කිරීම, කල් පවතින තුවාල ඇතිකරන බැක්ටීරියාව නාශනය, රතු මිදි පොතු වයින්වල පවතින ප්‍රෝටීන මගින් පිළිකා සෛල විනාශ කිරීම, රතු මිදි පොතු වයින්වල පවතින පොලිෆීනෝල් මගින් රුධිර වාහිනී පවිත්‍රව තැබීමෙන් ආඝාතය වැළැක්වීම, කාන්තාවන්ගේ ඩිම්බ කෝෂ පිළිකා අවදානම අඩු කිරීම සහ ඇටකටු ශක්තිමත් කිරීම එයට ඇතුලත් වේ. බොහෝ වයින් වර්ග ඖෂධීය වටිනාකම් වලින් පලතුරුවලින් නිෂ්පාදනය කරනු ලබන අතර එවැනි වයින්වල අතිරේක ප්‍රතිලාභ බොහෝය. එබැවින් මිදි හා කොමඩුවලින් වයින් නිෂ්පාදනය කිරීම පිණිස තාක්ෂණික

පැකේජයක් නිර්මාණය කිරීම සඳහා මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන ලදී. දේශීය කොමඩු හා මිදිවලින් හොඳ තත්ත්වයේ වයින් නිෂ්පාදනය කළ හැක. සැකසුම් තාක්ෂණය ක්ෂේත්‍රයට පැවරීමට සූදානම්ව පවතී.




## TJC අඹවල පොත්ත කලුවීම පිළිබඳව අධ්‍යනය කිරීම සහ පාලන ක්‍රියාමාර්ග ගැනීම

TJC අඹ යනු පසුගිය දශක කිහිපය තුළ අඹ කර්මාන්තය තුළට පිවිස ඇති නව අඹ ප්‍රභේදයකි. විශේෂයෙන්ම අපනයන වෙලඳපොළෙහි එම අඹ සඳහා ඉහළ වෙළෙඳපොළ විභවතාවයක් ඇත. කෙසේවෙතත්, TJC අඹවල පසු අස්වනු ගුණාත්මකභාවයට සාධක කිහිපයකින් බාධා එල්ල වී තිබේ. ඒවා අතර ආම්ලික රසයක් ඇති කරනු ලබන ලා පැහැති අභ්‍යන්තර මාංශයක් සහිතව නටුව ප්‍රදේශයේ කලු පැහැති පැල්ලම් ඇතිවීම වඩාත් බරපතල ගැටළුවකි. මෙම සන්දර්භය තුළ, TJC හඳුනානොගත් 'කලුපැහැති' වීම ඵලයේ පසු අස්වනු ගුණාත්මකභාවයට අහිතකර ලෙස බලපෑම් ඇති කරන බව වර්තමාන අධ්‍යයනවලින් අනාවරණය වී ඇත. ආසාදිත අඹ ඵලවලින් බෝට්‍රියොස්ෆෙරිසියේ විශේෂයේ දිලීරයක් සහ එක් බැක්ටීරියා විශේෂයක් වෙන් කර ගන්නා ලදී. සෝඩියම් බයිකාබනේට් සහ කැල්සියම් ක්ලෝරයිඩ් වැනි GRAS සංයෝග (පොදුවේ ආරක්ෂිත ලෙස පිළිගන්නා) රෝගය ඇතිවීමෙහි අඩුවීමක් පෙන්නුම් නොකළ නමුත් ඕසෝන් යොදාගැනීම තුළින් රෝගී තත්ත්වයේ විශිෂ්ට පාලනයක් සාක්ෂාත් කර ගැනීමට හැකි විය. TJC අඹවල පසු අස්වනු ගුණාත්මකභාවය වැඩිදියුණු කිරීම සඳහා නව තාක්ෂණය දියුණු කර එමඟින් TJC අඹ සඳහා පවතින වෙළඳපොළ විභවය වැඩි කිරීම සඳහා මෙම පර්යේෂණ සිදු කරන ලදී.

පසු අස්වනු තාක්ෂණය හා අගය එකතු කිරීම පිළිබඳ ජාතික කමිටුව විසින් අඹ ශ්‍රී ලංකාවේ ඉහළ ප්‍රමුඛතාවයක් සහිත භෝගයක් ලෙස හඳුනාගෙන ඇත. TJC අඹ, ශ්‍රී ලංකාවේ වගා කරනු ලබන විවිධ අඹ ප්‍රභේද අතරින් අපනයන මෙන්ම දේශීය වෙළඳපොළෙහි ඉහළ වෙළෙඳපොළ විභවතාවයක් සහිත ඉහළ වාණිජ වටිනාකමක් ඇති අඹ ප්‍රභේදයකි.

මෙම සන්දර්භය තුළ, ඵලයෙහි පසු අස්වනු ගුණාත්මකභාවය කෙරෙහි අහිතකර බලපෑම් ඇති කළ හඳුනානොගත් 'කලුපැහැති වීම', අවසානයේදී TJC අඹ සඳහා පවතින වෙළෙඳපොළ විභවය සීමා කරයි. එබැවින්, මෙම ගැටලුව සඳහා බලපාන හේතු සාධක සහ විසඳුම් හඳුනාගැනීම ඉතා වැදගත් වේ.

## "ඇඹුල්" කෙසෙල් ප්‍රභේදයේ ඉදීම ප්‍රවර්ධනය කිරීම මත විවිධ ආකාරයේ කැප්පෙටියා (Croton aromaticus L.) පත්‍රවල බලපෑම ඇගයීම

වාණිජ නැවුම් පලතුරු වෙළඳාමේදී, ඉදුනු පලතුරු පරිහරණය කිරීමේදී හානියට පත් වීමට සහ කුණු වීමට ඉතා වැඩි නැඹුරුවක් ඇති බැවින් කෘතිමව ඉදවීම ව්‍යාපාරයේ අත්‍යවශ්‍ය අංගයක් වී ඇත. කෘතිමව ඉදවීමේ උත්ප්‍රේකරයක් ලෙස කැල්සියම් කාබයිඩ් සහ එතිෆෝන් වැනි කාර්මික අතුරු නිෂ්පාදන වෙළඳුන් විසින් පුළුල්ව භාවිතා කරමින් සිටී. ඒවා බෙහෙවින් මිල අඩු බැවින් අධික මාත්‍රා භාවිතා කරනු ලබන අතර, ඒවා යොදා ගැනීමේදී බලධාරින් විසින් නිර්දේශ කර ඇති ක්‍රමවේද සාමාන්‍යයෙන් අනුගමනය කරනු නොලැබේ. මෙය පාරිභෝගික සෞඛ්‍ය කෙරෙහි ඉහළ අවදානමක් ඇති කරයි. මෙලෙස ස්ථාපිත සෞඛ්‍ය ප්‍රතිලාභ ලැබීම වෙනුවට එවැනි නිෂ්පාදන පරිභෝජනය කිරීම ජීවිතයට තර්ජනයක් විය හැකිය. එබැවින් ඉදීමේ ක්‍රියාවලිය ඉක්මන් කිරීම සඳහා කාබනික ඉදවීමේ උත්ප්‍රේරක ලෙස සාම්ප්‍රදායිකව භාවිතා කරන ලද ජෛවද්‍රව්‍ය වැඩි දියුණු කිරීම සඳහා සහ නැවුම් පළතුරු ඉදවීමෙන් කර්මාන්තය සඳහා භාවිතා කිරීම පිණිස තිරසර නිපැයුමක් සකස් කිරීමේ ප්‍රථම පියවර ලෙස යෝජිත අධ්‍යයනය සිදු කරන ලදී.

කැප්පෙටියා (Croton aromaticus) පත්‍රවල විවිධ ආකාරයන් (පල්ප, ජලීය සාරය, නැවුම් කුඩු සහ නැවුම් පත්‍ර) ප්‍රතිකාර නොකරන ලද පාලකයකට එදිරිව ඇඹුල් කෙසෙල් ප්‍රභේදයේ ඉදීම ප්‍රවර්ධනය කිරීමේ හැකියාව සම්බන්ධයෙන් පරීක්ෂණාගාර තත්ත්ව යටතේ අගයන ලදී. පොත්තෙහි වර්ණය (L *, a *, b *), පල්පයේ ඝන බව, මුළු ද්‍රාව්‍ය ඝනද්‍රව්‍ය ප්‍රමාණය, ප්‍රතිකාර කළ හැකි ආම්ලිකතාවය හා සංවේදක ගුණාංග ඇගයීමට ලක් කරන ලදී.

නැවුම් කැප්පෙටියා පත්‍ර කුඩු යොදා ප්‍රතිකාර කරන ලද ඇඹුල් කෙසෙල් ප්‍රභේදයේ ඉදීම පාලකය හා සැසඳීමේදී ප්‍රවර්ධනය වූ බව ප්‍රතිඵලවලින් අනාවරණය විය.

## "ඇඹුල්" කෙසෙල් ප්‍රභේදයේ ඉදීම ප්‍රවර්ධනය කිරීම මත කැප්පෙටියා (Croton aromaticus L.) සහ බිලින් (Averrhoa bilimbi L) පත්‍ර සංයෝජන බලපෑම ඇගයීම

ශාක පත්‍රවල විවිධාකාර සංයෝජනම් එනම් කැප්පෙටියා (Croton aromaticus L) සහ බිලින් (Averrhoa bilimbi L) පත්‍ර විවිධාකාරයෙන් සංයෝජන මගින් ඇඹුල් කෙසෙල් ප්‍රභේදයේ ඉදීම වේගවත් කිරීම පරික්ෂා කිරීම සඳහා අධ්‍යයනයක් සිදු කරන ලදී. ලපටි සහ මේරු කැප්පෙටියා සහ බිලින් පත්‍ර උඳුනක් තුළදී වියළාගෙන (40°C උෂ්ණත්වයේ පැය 14-18) ඇඹරීමෙන් කුඩු බවට පත් කරනු ලැබිණි. විවිධ අනුපාතයේ කුඩු එනම් 10% බිලින්, 10% කැප්පෙට්ටියා, 2% කැප්පෙටියා සහ 2% බිලින් මිශ්‍රණයක් සහ කිසිදු ජෛවද්‍රව්‍යක් නොමැති කෙසෙල් නියැදි පිළිවෙළින් ප්‍රතිකාරක සහ පාලකය වශයෙන් භාවිතා කරන ලදී. ඇඹුල් කෙසෙල් ප්‍රභේදය ඒවායේ උපරිම පරිණත අවස්ථාවේදී නෙලා ගන්නා ලද අතර කෙසෙල් ගෙඩි 3-4 අඩංගු ඇවරිවලට වෙන් කර හොඳින් මිශ්‍ර කරන ලදී. ආසන්න වශයෙන් කිලෝග්‍රෑම් එකක ඇවරි ත්‍රිත්වයක් එක් එක් ප්‍රතිකාරකය සඳහා අහඹු ලෙස වෙන් කරන ලද අතර ඒවායේ අදාළ ප්‍රතිකාරක සමඟ වායු රෝධිත වීදුරු කුටි (12 cm3) තුළ තබන ලදී. වීදුරු කුටි තුළ උෂ්ණත්වය සහ සාපේක්ෂ ආර්ද්‍රතාවය (RH) සහ පරිසර උෂ්ණත්වය හා සාපේක්ෂ ආර්ද්‍රතාවය මනින ලදී. ප්‍රතිකාරයෙන් දින 2කට සහ 4කට පසු පොත්තෙහි වර්ණය වෙනස්වීම, ඝන බව, මුළු ද්‍රාවය ඝනද්‍රව්‍ය, අනුමාපනය කළ හැකි ආම්ලිකතාවය සහ යුෂයේ pH අගය මනින ලදී. ප්‍රතිකාරයෙන් දින 4කට පසුව සංවේදක ඇගයීමේ පරීක්ෂණයක් සිදු කෙරිණි. ප්‍රතිකාරයෙන් පැය 24කට පසු කැප්පෙටියා සහ බිලින් පත්‍ර සංයෝජනයට නිරාවරණය කරන ලද කෙසෙල් නියැදිවල පොත්තෙහි වර්ණය කොළ පැහැයේ සිට කහ පැහැයට හැරීම ප්‍රථම වරට නිරීක්ෂණය විය. එම සංයෝජනයටම නිරාවරණය කරන ලද නියැදිවල පැය 48කට පසුව අඩුම පල්ප ඝනභාවය, ඉහළම TSS, TA සහ පහළම යුෂ pH අගය නිරීක්ෂණය විය. අවසන් වශයෙන්, බිලින් සහ කැප්පෙටියා පත්‍ර සංයෝජනය (එක් එක් පත්‍ර වර්ගයෙන් 2%ක මාත්‍රාවක්) සහ වෙන් වෙන් වශයෙන් භාවිතා කළ අවස්ථාවේදී පාලකයට සාපේක්ෂව ඇඹුල් කෙසෙල්වල ඉදීම ප්‍රවර්ධනය කරන ලදී .

වර්තමානයේදී එවැනි සෞඛ්‍ය හිතකාමී නිෂ්පාදනයක් නොමැති වීම හේතුවෙන් ඉදීම වේගවත් කිරීමේ කාබනික උත්ප්‍රේරණයක් හඳුන්වාදීමට අපේක්ෂා කරන ලදී. එබැවින්, වැඩිදුර අධ්‍යයන සිදු කරමින් පවතී. ඉලක්කගත කණ්ඩායම වන්නේ පලතුරු භෝග වගාකරුවන් සහ පරිභෝජකයන් ඇතුළු නැවුම් පලතුරු සැපයුම් දාමයේ සියලු පාර්ශවකරුවන් වේ.

## ඉහළ සැරබවක් සහිත දේශීය මිරිස් වර්ගයක් භාවිතා කරමින් සකස් කරන ලද මිරිස් සෝස්වල සකස් කිරීමේ ක්‍රියාවලිය සහ තත්ත්වය ඇගයීම (පානිනි ඉන්ටර්නැෂනල් (පෞද්.) සමාගම විසින් අරමුදල් සපයන ලදී)

බර්ඩ්ස් අයි චිලි හෝ කොච්චි (*Capsicum frutescens* L) යනු ශ්‍රී ලංකාව ඇතුළු ලෝකය පුරා ඉතා කුඩා ප්‍රදේශයන්හි නොසලකා හරින ලද භෝගයක් ලෙස වැවෙන කුඩා හා ඉතා සැර මිරිස් වර්ගයකි. වර්තමානයේදී භෝගයේ ඉතා අඩු වාණිජ වටිනාකමක් ඇති බැවින්, දඹුල්ල, පානිනි ඉන්ටර්නැෂනල් පෞද්. සමාගමේ අනුග්‍රාහකත්වය යටතේ බර්ඩ්ස් අයි චිලි ප්‍රභේදය යොදා ගනිමින් සෝස් වර්ගයක් සකස් කිරීම සඳහා සහ නිෂ්පාදනයේ පිළිගතහැකි බව අධ්‍යයනය කිරීම සඳහා පර්යේෂණයක් සිදු කරන ලදී. සෝස් සකස් කිරීම සඳහා ප්‍රශස්ත අමුද්‍රව්‍ය මිශ්‍රණය පරික්ෂණයට ලක් කරන ලද අතර නිෂ්පාදනයේ රසායනික, සංවේදක සහ ක්ෂුද්‍ර ජීවී ගුණාංග විශ්ලේෂණය කිරීමෙන් පසු නිෂ්පාදනයේ පිළිගතහැකි බව සහ ගබඩාකළ හැකි බව ඇගයීමට ලක් විය.

බර්ඩ්ස් අයි චිලිවලින් අගය එකතු කරන ලද ක්‍රමවේද ජනප්‍රිය කිරීම සහ සකස් කිරීම මෙම නොසලකා හරින ලද භෝගයෙන් අමතර ආදායමක් උපයා ගැනීම සඳහා ග්‍රාමීය ගොවි ජනතාවට ඉහළ ප්‍රතිලාභ ලබා ගත හැකි වනු ඇති අතර අවසානයේදී රටේ සංවර්ධනයටද වැදගත් වේ.

එබැවින්, අපනයන විභවයක් සහිත සැර මිරිස් සෝස් වර්ගයක් සකස් කිරීම වර්ධනය කිරීම නුදුරු අනාගතයේදී විදේශ ආදායම් උපයා ගැනීමේදී ප්‍රයෝජනවත් විය හැකිය. මෙම පර්යේෂණය යටතේ ආහාර සැකසුම් කර්මාන්තය සහ ග්‍රාමීය ගොවි ජනතාව ප්‍රතිලාභ ලබනු ඇත.

15

## ශ්‍රී ලංකාවේ වගා කරනු ලබන රතු ලූනු (*Allium cepa*) සඳහා වැඩිදියුණු කරන ලද පසු අස්වනු තාක්ෂණික ක්‍රමවේද හඳුනාගැනීම

වර්තමානයේදී රතු ලූනුවල පවතින තත්ත්වය හඳුනාගෙන සුදුසු ගබඩා ව්‍යුහයක් සකස් කිරීම සඳහා මෙම අධ්‍යයනය සිදු කරන ලදී. රතු ලූනු බහුලව වගා කරනු ලබන යාපනය ප්‍රදේශයේ රතු ලූනු ගොවීන් අතර ප්‍රශ්නාවලියක් භාවිතා කරමින් සමීක්ෂණයක් පවත්වන ලදී. හඳුනාගත් ප්‍රධාන ගැටලුවක් වූයේ විධිමත් ගබඩා කිරීමේ තාක්ෂණික ක්‍රමවේද නොමැති වීම වන අතර අස්වැන්න නෙලන කාලයේදී ගොවිපොළ මට්ටමින් මිල අඩුවීම එහි ප්‍රතිඵලයකි. විධිමත් ගබඩා කිරීමේ පහසුකම් නොමැති වීමද හඳුනාගන්නා ලද අතර ඒ අනුව පාලිත පරිසරයක් (උෂ්ණත්වය සහ සාපේක්ෂ ආර්ද්‍රතාවය) සහිතව ගබඩා කිරීමේ ව්‍යුහයක් සකස් කරන ලදී. උෂ්ණත්වය සහ RH ස්වයංක්‍රීයව පාලනය කළ වැඩිදියුණු කළ ගබඩා කිරීමේ ව්‍යුහයක් භාවිතා කරමින් රතු ලූනුවල ගබඩා කිරීමේ කාලය මාස හතරක් දක්වා දීර්ඝ කරන ලදී. මෙම ගබඩා කාලය තුළ රතු ලූනු බල්බවල ගුණාත්මක වෙනස්කම් අවමව පෙන්නුම් කරන ලදී. මෙම තාක්ෂණය හඳුන්වා දීම මගින් රතු ලූනු ගොවීන්ගේ ආදායම වැඩි කළ හැකිය. නව තාක්ෂණය භාවිතා කරමින් රතු ලූනු ගබඩා කිරීමෙන් ගොවීන්ට ගොවිපොළ මට්ටමින් ඉහළ මිලක් ලබා ගත හැකිය. මීට අමතරව අවාරයේදී ආනයනය කරන ලද රතු ලූනු ප්‍රමාණය අඩු කිරීමෙන් විදේශ විනිමය ඉතිරි කර ගත හැකිය.

## රටකජු පොතු ඉවත් කිරීමේ යන්ත්‍රයක් සැලසුම් කිරීම සහ සකස් කිරීම



රටකජු ලෝකයේ හයවැනි වැදගත් තෙල් භෝගයයි. එහි 48-50% තෙල් සහ 26-28% ප්‍රෝටීන් අඩංගු වන අතර එය ආහාරමය කෙඳි, ඛනිජ ද්‍රව්‍ය සහ විටමින්වලින් පොහොසත් ප්‍රභවයකි. රටකජුවල සෞඛ්‍ය ප්‍රතිලාභ ගණනාවක් තිබේ. ශ්‍රී ලංකාව තුළ රටකජු කඳුකරයේදී මහ කන්නයේදී අහස් දියෙන්ද වියළි හා අතරමැදි කලාපවල යල කන්නයේදී වාරි ජලයෙන්ද කුඹුරු ඉඩම්වල වගා කරනු ලබන භෝගයකි. එය ප්‍රධාන වශයෙන් මොණරාගල, කුරුණෑගල, අම්පාර, බදුල්ල, පුත්තලම සහ රත්නපුර යන දිස්ත්‍රික්ක වල වගා කරනු ලැබේ. රටකජු තෙල් භෝගයක් වුවද, ශ්‍රී ලංකාවේ එයට අවුළුපත් හා රසකැවිලි ලෙස ඉල්ලුමක් ඇත. පොතු ඉවත් කරන ලද රටකජු අවුළුපත් සහ රසකැවිලි සඳහා එකතු කිරීම හෝ මිශ්‍ර කිරී කරනු ලැබේ. එබැවින් රටකජු සැකසීමේදී පොතු ඉවත් කිරීම වැදගත් ක්‍රියාවලියකි. ලොව පුරා සිටින ලොව පුරා සිටින පුද්ගලයන් කිහිප දෙනෙක් අතින් ක්‍රියාකරන පොතු ඉවත් කිරීමේ උපකරණ සකස් කිරීම සිදු කර ඇති අතර ඒවා කුඩා ධාරිතාවයකින් යුක්ත වේ. ශ්‍රී ලංකාවේ දැනට යාන්ත්‍රික පොතු ඉවත් කිරීමේ යන්ත්‍රයක් නොමැත. එබැවින් මෙම ව්‍යාපෘතිය යටතේ රටකජු පොතු ඉවත් කිරීමේ යන්ත්‍රයක් සකස් කරන ලද අතර එහි කාර්ය සාධනය ඇගයීමට ලක් කරන ලදී.

මෙම යන්ත්‍රය සකස් කර එහි කාර්ය සාධනය ඇගයීමට ලක් කෙරිණි. යන්ත්‍රයේ ධාරිතාව වරකට කිලෝග්‍රෑම් 3ක් වන අතර යන්ත්‍රය සඳහා නිර්දේශිත ධාරිතාව පැයකට රටකජු කිලෝග්‍රෑම් 72-120 කි. මෙම යන්ත්‍රය මධ්‍ය පරිමාණ සැකසුම්කරුවන් සඳහා වාණිජමය වශයෙන් අදාළ වේ.

බොහෝ ජනතාවක් රටකජු වගා කිරීමේ සහ රටකජු ආශ්‍රිත ආහාර සකස් කිරීමේ ක්ෂේත්‍රයේ නිරතව සිටී. රටකජු පොතු ඉවත් කිරීමේ යන්ත්‍රයක් හඳුන්වාදීමෙන් මෙම කර්මාන්තය තවදුරටත් පුළුල් වීමක් මෙන්ම නව රැකියා අවස්ථා උත්පාදනය වීමක්ද සිදු වනු ඇත. තවද, එමගින් උසස් තත්ත්වයේ පොතු ඉවත් කළ රටකජු සාධාරණ මිලකට වෙළඳපොළෙන් වැඩි වශයෙන් ලබා ගත හැකි වනු ඇත.

## දෙහි භෝගයේ සෘතු ඵල විද්‍යාව සහ ඵලයෙහි ගුණාත්මකභාවය සහ පසු අස්වනු ජීව කාලය මත පෙර අස්වනු වර්ධන නියාමක පත්‍ර ප්‍රතිකාරවල බලපෑම විමර්ශනය කිරීම

දේශීය සූපවේදය, ආහාර සැකසුම් කර්මාන්තය හා දේශීය වෛද්‍ය විද්‍යාවේ ඖෂධයක් ලෙස නැවුම් දෙහි (*Citrus aurantifolia* Swingle) සඳහා වර්ෂය පුරා අඛණ්ඩ ඉල්ලුමක් පවතී. එබැවින්, එබැවින්, පසු අස්වනු තාක්ෂණය හා අගය එකතු කිරීම පිළිබඳ ජාතික කමිටුව විසින් එය ඉහළ ප්‍රමුඛතා භෝගයක් ලෙස හඳුනාගෙන ඇත. අවාරයේදී දෙහි කිලෝග්‍රෑම් එකක මිල පාරිභෝගිකයන්ට දරා ගත නොහැකි මට්ටමකට (ශ්‍රීලරු.600-1000) ඉහළ යයි. අනික් අතට, උපරිම අස්වැන්නක් ලැබෙන කාලයේදී නිෂ්පාදන පිරිවැය පියවා ගැනීමට ප්‍රමාණවත් මිලක් නොලැබීමෙන් වගාකරුවන්




16

විසින් අස්වැන්නක් නෙලීමක් නොකරන තත්ත්වයකට පත් වේ. කෙසේවෙතත්, ශ්‍රී ලංකාවේ දැනට ජාතික මට්ටමෙන් මෙම භෝගයේ පූර්ව සහ පසු අස්වනු ගැටලු විසඳීම සඳහා විධිමත් පර්යේෂණ සිදු කර නොමැති බැවින් තාක්ෂණය තවමත් ළදරු අවධියක පවතී. එබැවින් යෝජිත පර්යේෂණයේ අරමුණ වූයේ භෝගයේ ඍතු ඵල විද්‍යාව, පරිණත වීම සහ වැඩසටහනගත වර්ෂය පුරා අළෙවිකරණයක් සඳහා අස්වනු නෙලන වාරය මෙහෙයවීම අධ්‍යයනය කිරීමයි. ව්‍යාපෘතියේ පළමු අදියර මේ වනවිට නිම කර ඇති අතර දෙහි ඵලයේ වර්ධන අවස්ථා 16, විකසනය සහ කල්පිරීම (ඍතු ඵල විද්‍යාව) හඳුනාගෙන තිබේ. ක්ෂේත්‍ර තත්ත්වයන් යටතේ භාවිතා කිරීම පිණිස ගොවීන් සහ අනෙකුත් අදාළ පාර්ශවකරුවන් අතර බෙදා හැරීම සඳහා වර්ණ ප්‍රස්තාර සහ ප්‍රමාණකරණ මුද්‍ර සකස් කර ඇත. දෙහි (C. aurantifolia) ඵලයේ වර්ධන අවස්ථා 16ක වෙනස්වීම් රූපයේ දක්වා ඇත. (14, 28 ආදිය යනු දෙහි ඵලය හටගෙන ගත වී ඇති දින ගණන වේ). මෙම ව්‍යාපෘතිය සඳහා ශ්‍රී ලංකා ජාතික විද්‍යා පදනම විසින් අරමුදල් සපයනු ලැබිය.

## සංවර්ධන ව්‍යාපෘති

කෘෂිකර්ම අමාත්‍යාංශයේ මූල්‍යාධාර යටතේ පඅතාආ විසින් සංවර්ධන ව්‍යාපෘති තුනක් ක්‍රියාත්මක කරන ලදී. මෙම ව්‍යාපෘතිවල ප්‍රධාන අරමුණු වන්නේ පසු අස්වනු හානි අඩු කිරීම තුළින් පසු අස්වනු ක්ෂේත්‍රය සංවර්ධනය කිරීම, කෘෂිකාර්මික නිෂ්පාදනවල ගුණාත්මකභාවය ඉහළ නැංවීම, ආහාර ආරක්ෂාව හා ආහාර සුරක්ෂිතතාවය සහතික කිරීමයි. ජාතික ආර්ථිකයට ඍජුව දායකත්වයක් සපයනු ලබන කෘෂි ආශ්‍රිත කර්මාන්ත සංවර්ධනය කිරීම උදෙසා මෙම සියලු ක්‍රියාකාරකම් ඉලක්ක කර තිබේ. 2016 සැප්තැම්බර් මාසයේදී මෙම ව්‍යාපෘතිය ආරම්භ කරන ලද අතර 2018 වසර අවසන් වන තුරු මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක වේ. ව්‍යාපෘතිය දිවයින පුරා සිදු කරන ලදී.

### ශ්‍රී ලංකාවේ අඹවල සැපයුම් සහ වටිනාකම් දාම කළමනාකරණ භාවිතයන් වැඩිදියුණු කිරීම





අඹ යනු රට තුළ වගා කරනු ලබන හා පරිභෝජනය කරනු ලබන ප්‍රධාන පලතුරුවලින් එකකි. නමුත් ඉහළ පසු අස්වනු හානිය, නිෂ්පාදනයේ ගුණාත්මකභාවය අඩු වීම සහ මිල ගණන් ඉහළ යෑම කර්මාන්තයේ ගැටලුකාරී තත්ත්වයන් බවට පත් වී තිබේ. එබැවින්, දිවයිනෙහි සැපයුම් හා වටිනාකම් දාම කළමනාකරණ භාවිතයන් වැඩිදියුණු කිරීම සඳහා ව්‍යාපෘතිය මඟින් ක්‍රියාකාරකම් සිදු කරයි. නැවුම් හා සැකසූ නිෂ්පාදනවල ගුණාත්මකභාවය වැඩිදියුණු කර ගැනීම හා දේශීය වෙළෙඳපොළේ හානියව අවම කර ගැනීම සඳහා සලකා බලන ලද ක්‍රියාකාරකම් වූයේ අස්වැන්න නෙළීම, තේරීම, ශ්‍රේණිගත කිරීම, ඉදවීම, ඇසිරීම, සහතික කිරීම ආදියයි. මූලික සමීක්ෂණයක් මඟින් වර්තමාන තත්ත්වය තක්සේරු කරනු ඇත. හඳුනාගත් ප්‍රතිලාභීන් සඳහා පුහුණුව, උපකරණ සහ අනෙකුත් අවශ්‍ය පහසුකම් ලබාදීම හරහා සහාය දැක්වීම මඟින් වැඩිදියුණු කිරීමේ ක්‍රියාකාරකම් සඳහා ව්‍යාපෘතිය පහසුකම් සපයයි. ඒ අනුව, වගාකරුවන්, එකතු කරන්නන්, සිල්ලර වෙළඳුන්, සැකසුම්කරුවන්, පාරිභෝගිකයන් සහ ව්‍යවසායකයින් ඇතුළු සියලු සැපයුම් හා වටිනාකම් දාම ක්‍රියාකාරිකයන් සඳහා ප්‍රතිලාභ ලබා දීමට ව්‍යාපෘතිය මඟින් අපේක්ෂා කරයි.






2016 දී ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘති ක්‍රියාකාරකම් යටතේ වෙළඳ නාමයක් සහිත උසස් තත්ත්වයේ අඹ වෙළඳ පොළට හඳුන්වා දීම සඳහා අඹ සැකසුම් කලාප ස්ථාපිත කිරීමට මූලික කටයුතු සිදු කරන ලදී. තවද, පාරිභෝගිකයන් සඳහා සුරක්ෂිත හා සෞඛ්‍ය සම්පන්න නිෂ්පාදන සැපයීම සඳහා කුරුණෑගල දිස්ත්‍රික්කයේ ඕමාරගොල්ල ප්‍රදේශයේ පළමු අඹ සැකසුම් කලාපය ආරම්භ කරන ලදී. ආරක්ෂාකාරී ඉදවීමේ භාවිතයන් මඟින් ඉදවන ලද සහ ආරක්ෂාකාරී හැසරවීමේ සහ සකස් කිරීමේ ක්‍රමවේද භාවිතා කළ අඹ, "ඕමාරගොල්ල අඹ" යන වෙළඳ නාමය යටතේ වෙළඳපොළට හඳුන්වාදෙන ලදී.

17

## ශ්‍රී ලංකාවේ ප්‍රධාන කෘෂිකාර්මික ආයතනවලදී කෘෂිකාර්මික ආහාර භෝගවල පසු අස්වනු හානිව අවම කිරීම පිළිබඳ පුහුණුකරුවන් පුහුණු කිරීම



පුහුණුකරුවන් පුහුණු කිරීම මඟින් දිවයිනෙහි සියලු කෘෂිකාර්මික වගාවන්හි සැපයුම් හා වටිනාකම් දාමයන්හි සියලු පාර්ශ්වකරුවන්ගේ පසු අස්වනු තාක්ෂණය පිළිබඳ දැනුම වැඩි දියුණු කර එමඟින් රටෙහි පසු අස්වනු භාවිතය වැඩිදියුණු කිරීම මෙම ව්‍යාපෘතියේ අරමුණ විය. එබැවින් මෙම ව්‍යාපෘතිය යටතේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ කෘෂිකර්ම උපදේශකවරුන් සඳහා පුහුණු වැඩසටහන් පවත්වන ලද අතර කෘෂි සේවා දෙපාර්තමේන්තුවේ කෘෂිකර්ම පර්යේෂණ සහ සංවර්ධන සහකාර නිලධාරින් සඳහා වැඩසටහන් පැවැත්වීමට කිරීමට යෝජනා කරයි. පුහුණුකරන්නන් පුහුණු කිරීමේ ව්‍යාපෘතියේ සමාරම්භක වැඩසටහන 2016 ඔක්තෝබර් මස 13 වන දින දඹුල්ල විශේෂිත ආර්ථික මධ්‍යස්ථානයේදී පැවැත්විණි.



තවද එමඟින් දිවයිනේ සියලු ආර්ථික මධ්‍යස්ථානවල සියලුම පාර්ශ්වකරුවන් සඳහා පුහුණු වැඩසටහන් පවත්වයි. ව්‍යාපෘති ක්‍රියාකාරකම් යටතේ දිස්ත්‍රික්ක 24 ක පුහුණුකරුවන් පුහුණු කිරීමේ වැඩසටහන් 28 ක් පැවැත්වීමට ආයතනය සමත් වූ අතර කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ කෘෂිකර්ම උපදේශකවරුන් 1316 දෙනෙකු පුහුණු කරන ලදී.

තවද දඹුල්ල, නුවරඑළිය, කැප්පෙටිපොල සහ ඇඹිලිපිටිය යන ප්‍රධාන ආර්ථික මධ්‍යස්ථාන හතරක් පාදක කර ගනිමින් පුහුණු වැඩසටහන් හතරක් පවත්වන ලදී. මෙම වැඩසටහන යටෙත් ප්‍රතිලාභීන් 317 ක් පුහුණු කරන ලදි. දඹුල්ල ආර්ථික මධ්‍යස්ථානයේ පවත්වන ලද වැඩසටහනේ දී එයට සෘජුව සහභාගී වූ පාර්ශ්වකරුවන්ට අමතරව ආර්ථික මධ්‍යස්ථානය තුළ එම අවස්ථාවේ සිටි 3000 කට වැඩි පිරිසකට බහුමාධ්‍ය හා LED තිර යොදා ගනිමින් දැනුම්වත් කරන ලදී.

### කාබනික ක්‍රමවේදයකින් පලතුරු ඉදීම ප්‍රේරණය කිරීම

වාණිජ නැවුම් පළතුරු කර්මාන්තයේදී භාවිතා කිරීම සඳහා කාබනික පලතුරු ඉදවීමේ ක්‍රමවේදයක් සකස් කිරීම පිණිස මෙම ව්‍යාපෘතිය ආරම්භ කරන ලදී. ඒ සඳහා අපගේ රසායනාගාරය සඳහා අවශ්‍ය පහසුකම් ස්ථාපිත කිරීමට අවශ්‍ය විය. එබැවින්, පරීක්ෂණ සිදු කිරීම සඳහා අවශ්‍ය රසායනාගාර පහසුකම් මේ වනවිට ස්ථාපනය කරමින් පවතී.

ඉහත සංවර්ධන ව්‍යාපෘති තුනට අමතරව "ග්‍රාමීය මට්ටමේ ආදායම් උත්පාදනය/තෝරාගත් ප්‍රතිලාභීන්ගේ ආදායම වැඩි කිරීම (ශ්‍රී ලංකාවේ මහවැලි ගංගා ද්‍රෝණියේ ජීවත් වන කෘෂිකාර්මික ප්‍රජාවන් මුහුණ දෙන දේශගුණික විපර්යාස බලපෑම් සඳහා විසඳුම් ඉදිරිපත් කිරීම)" මහවැලි සංවර්ධන අමාත්‍යාංශයේ මූලාධාර යටතේ පඅතාආ විසින් 2016 වර්ෂයේදී පවත්වන ලදී.

### පුහුණුව

නිෂ්පාදන ඉහළ නැංවීම, අපනයන වෙළඳපොළ කරා ලඟා වීම සහ කෘෂි ව්‍යාපාර සංවර්ධනය කිරීම යන ජාතික අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා තාක්ෂණික දැනුම් හැකියාව අත්‍යවශ්‍ය වේ. එබැවින්, 2016 වර්ෂයේදිද පශ්චාත් අස්වැන්න පිළිබඳ තාක්ෂණ පුහුණු වැඩසටහන් අඛණ්ඩව ක්‍රියාත්මක වෙමින් පවතී. විශේෂයෙන්ම පෞද්ගලික සහ සමූපාකාර අංශයේ සංවිධානවල පුහුණුව සඳහා වන ඉල්ලුම සමාලෝචිත කාල පරිච්ඡේදය තුළ අඛණ්ඩව වැඩිවෙමින් තිබේ. ආයතනය විසින් පවත්වන ලද පුහුණු පාඨමාලා නිෂ්පාදන/ව්‍යාප්ති අභිප්‍රායන් ඉලක්ක කර ගත් අතර, පසු අස්වනු ක්‍රියාකාරකම්වල නියැලී සිටින පුද්ගලයන් වෙත තාක්ෂණ හුවමාරු කිරීම අරමුණු කර ගැනිණි.

18

## අනුරාධපුර, පඅතාආ දී නේවාසික පුහුණුව

2016 වර්ෂය තුළ දී කෙටි කාලීන නේවාසික පුහුණු පාඨමාලා 48 ක් පවත්වා පසු අස්වනු තාක්ෂණය පිළිබඳ විවිධ විෂයයන් සම්බන්ධයෙන් 1714 දෙනෙකු පුහුණු කර ඇති අතර 01 රූපයෙහි විස්තර දක්වා ඇත.




පුහුණු වැඩසටහන්, කෘෂිකාර්මික නිෂ්පාදනවල සැපයුම් සහ වටිනාකම් දාමයන්හි සියලු පාර්ශවකරුවන් ඉලක්ක කරගෙන පවත්වන ලදී. මෙම පාර්ශවකරුවන් ප්‍රධාන වශයෙන්, ගොවීන්/ගෙවිලියන්, එක්රැස් කරන්නන්, ප්‍රවාහනය කරන්නන්, තොග වෙළෙන්දන්, සිල්ලර වෙළෙන්දන්/වෙළෙන්දන් සහ සකස් කරන්නන් විය. තවද මෙම වැඩසටහන්, රාජ්‍ය සහ රාජ්‍ය නොවන සංවිධානවල නිලධාරින්, විශ්වවිද්‍යාල, කාර්මික විද්‍යාල සහ පාසල් ශිෂ්‍යයන් සඳහා පුහුණුකරන්නන් පුහුණු කිරීම අංගයක් යටතේද පවත්වා ඇත.මෙම වැඩසටහන් මඟින්,පසු අස්වනු තාක්ෂණ, ව්‍යවසායක සංවර්ධනය, හානි අඩු කිරීම, ක්‍රියාවලි සහ තත්ත්වය වැඩිදියුණු කිරීම, පසු අස්වනු යන්ත්‍රසූත්‍ර ක්‍රියාත්මක කිරීම සහ නඩත්තු කිරීම ආදිය පිළිබඳව පිළිබඳ දැනුම්වත් භාවය ඇති කිරීම ඉලක්ක කර ඇත.

| කාණ්ඩය | විස්තරය | පුහුණු වැඩසටහන් සංඛ්‍යාව | පුහුණුවන්නන් සංඛ්‍යාව |
|---|---|---|---|
| A | ගොවීන්, ගෙවිලියන් සහ ගොවි සංවිධාන සාමාජිකයින් | 6 | 180 |
| B | ව්‍යාපෘති ප්‍රතිලාභීන් සහ කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් | 9 | 226 |
| C | රාජ්‍ය, සමුපකාර, පෞද්ගලික සහ රාජ්‍ය නොවන සංවිධාන ව්‍යාප්ති නිලධාරින් | 12 | 387 |
| D | ද්විතියික පාසල්, විශ්වවිද්‍යාල, කෘෂි සහ කාර්මික විශ්වවිද්‍යාල සිසුන් | 21 | 921 |
| | එකතුව | **48** | **1714** |

## අනේවාසික පුහුණු, ක්ෂේත්‍ර මට්ටමේ පුහුණු /ඉදිරිපත්කිරීම්

ප්‍රතිලාභීන්ගේ අවශ්‍යතා අනුව පඅතාආ විසින් අනේවාසික ක්ෂේත්‍ර මට්ටමේ පුහුණු කිරීමද සිදු කරයි. 2016 අනේවාසික පුහුණු, ක්ෂේත්‍ර පුහුණු වැඩසටහන් සහ ආදර්ශන 191ක් පවත්වා පුද්ගලයින් 5752ක් පුහුණු කර ඇත. සමාලෝචිත වර්ෂය තුළදී ආයතනය විසින් එහි ක්ෂේත්‍ර මධ්‍යස්ථාන හරහා තාක්ෂණ පැවරීමේ ක්‍රියාකාරකම් විශේෂයෙන් ප්‍රධාන භෝග නිෂ්පාදන ප්‍රදේශයන්හිදී ඵලදායී අන්දමින් සිදු කර ගෙන ගොස් ඇත.




| කාණ්ඩය | විස්තරය | පුහුණු වැඩසටහන් සංඛ්‍යාව | පුහුණුවන්නන් සංඛ්‍යාව |
|---|---|---|---|
| A | ගොවීන්, ගෙවිලියන් සහ ගොවි සංවිධාන සාමාජිකයන් | 50 | 1502 |
| B | ව්‍යාපෘති ප්‍රතිලාභීන් සහ කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන් | 12 | 286 |
| C | පලතුරු සහ එළවළු වගා කරන්නන්, එකතු කරන්නන්, සහල් සහ අනෙකුත් ධාන්‍ය සැකසුම්කරුවන් | 40 | 1152 |
| D | සහල් සහ අනෙකුත් ධාන්‍ය සකස් කරන්නන් | 60 | 1712 |
| E | රාජ්‍ය, සමුපකාර, පෞද්ගලික සහ රාජ්‍ය නොවන සංවිධානවල ව්‍යාප්ති නිලධාරින් | 29 | 1100 |
| | එකතුව | **273** | **7900** |



මෙම ප්‍රතිලාභීන් බොහොමයක් මෙම පුහුණු වැඩසටහන්වලින් ලබා දෙන ලද තාක්ෂණයන් භාවිතා කරමින් සිටී. අත්පත් කර ගනු ලැබූ තාක්ෂණික දැනුම තුළින්, දැනුම වැඩිදියුණු කර ගැනීම, නිෂ්පාදනයෙහි තත්ත්වය ඉහළ නැංවා ගැනීම, ආදායම් උත්පාදනය, ග්‍රාමීය සවිබලගැන්වීම සහ වෙනත් බොහොමයක් ප්‍රතිලාභ අත්පත් කරගෙන ඇත. ආහාර සුරක්ෂිතතාව සම්බන්ධ ජාතික සංවර්ධනයෙහි එක් ප්‍රධාන සීමාකාරි සාධකයක් වන කෘෂිකාර්මික ක්ෂේත්‍රයේ හානි අඩු කිරීම සහ තත්ත්වය ඉහළ නැංවීම සඳහා මෙය සෘජුවම දායකත්වය ලබා දෙනු ලැබේ. තවද එය වැඩිදියුණු වූ ජීවන තත්ත්වයන් සමඟ කර්මාන්තමය සංවර්ධනය, ආර්ථික සංවර්ධනය සහ සමාජීය සංවර්ධනය සඳහාද දායකත්වය ලබා දී ඇත.

මෙම වැඩසටහන් යටතේ ඔවුන්ගේ කර්මාන්ත ආරම්භ කරන ලද/සංවර්ධනය කරන ලද ප්‍රතිලාභීන් කිහිප දෙනෙකු පහත ලැයිස්තුගත කර ඇත.

| අංකය | නම | ලිපිනය | වැඩසටහන් වර්ගය |
|---|---|---|---|
| 1 | ඩබ්.එම්. රොෂාන් ප්‍රියංකර ප්‍රනාන්දු මහතා | දන්ගොල්ල පාර, හාල්දඩුවන, දංකොටුව | පලතුරු ආශ්‍රිත නිෂ්පාදන |
| 2 | ඩබ්. සමන්තා රත්නවීර මිය | අංක 10, පැණි වෙරළුව, බෝපිටිය, පන්නල | මෙනේරි සකස් කිරීම |
| 3 | එච්. සුජීව සමන් කුමාර මහතා | සමන් ස්ටෝර්ස්, මහව | සහල් පිටි සකස් කිරීම |
| 4 | චාමර දසනායක මහතා | චාමර සහල් මෝල, කොබෙයිගනේ පාර, හෙට්ටිපොළ | සහල් සකස් කිරීම |
| 5 | ගොවි කාන්තා සංගමය | අඹන්පොළ | කුළුබඩු සකස් කිරීම |
| 6 | ආර්.එම්. නන්දාවති මැණිකේ මිය | රස මිහිර පලතුරු වෙළඳසැල, කනත්තෙ වැව, වාරියපොළ | පලතුරු ආශ්‍රිත නිෂ්පාදන |
| 7 | කේ.එච්. රෝහිණී බාලසූරිය මිය | 18/177, රත්මල්යාය, වීරගොඩ | දෙහි ආශ්‍රිත නිෂ්පාදන |
| 8 | එල්. ප්‍රසාදිනි මධුෂිකා මෙය | 18/5/1, වීරගොඩ, දඩයම්තලාව | දෙහි ආශ්‍රිත නිෂ්පාදන |
| 9 | එම්.ජී. ප්‍රේමා කුමාරි මිය | 18/138/1/ වීරගොඩ, දඩයම්තලාව | සහල් සකස් කිරීම |
| 10 | එස්. ඒ. ප්‍රියංගිකා මිය | 17/170, වීරගොඩ, දඩයම්තලාව | සියඹලා ආශ්‍රිත නිෂ්පාදන |
| 11 | ඩබ්. චන්ද්‍රකාන්ති මිය | 18/97, වීරගොඩ, දඩයම්තලාව | සහල් සකස් කිරීම |
| 12 | ඩබ්.එම්. ගයානි මිය | 24/11/3/2, උදයගිරිය (නැගෙනහිර), අම්පාර | දෙහි ආශ්‍රිත නිෂ්පාදන |
| 13 | එම්.ජී. සුමුදු චන්දිමා ගමගේ මිය | 32/7/A, ගොනාගොල්ල | කුළුබඩු සකස් කිරීම |
| 14 | ඩබ්. මනෝජි හර්ෂිකා මිය | 8/2, රජගම, වීරගොඩ | කුළුබඩු සකස් කිරීම |
| 15 | එල්.පී. කුමුදුනි ප්‍රියංගිකා | 18/52/3, වීරගොඩ, දඩයම්තලාව | සහල් පිටි සකස් කිරීම |
| 16 | ඒ.එම්. ප්‍රේමලතා මැණිකේ මිය | 18/164, වීරගොඩ, දඩයමතලාව | තල ආශ්‍රිත නිෂ්පාදන |
| 17 | පී. ශ්‍රියානි පද්මිණී මිය | 18/138, වීරගොඩ, දඩයමතලාව | සහල් සකස් කිරීම |
| 18 | පී.ජී.ආර්. සුජිත් සමන්ත මහතා | 18/166, වීරගොඩ, දඩයමතලාව | දෙහි ආශ්‍රිත නිෂ්පාදන |
| 19 | එස්.ඒ. ප්‍රියංගිකා ප්‍රියදර්ශනී මිය | 18/170, වීරගොඩ, දඩයමතලාව | සහල් ආශ්‍රිත නිෂ්පාදන |
| 20 | කේ.ඒ. ජයන්ති පතිරාජ මිය | 18/130/1, වීරගොඩ, දඩයමතලාව | තල ආශ්‍රිත නිෂ්පාදන |
| 21 | ජී. ධර්මපාල මහතා | මච්චාගම, ඉපලෝගම | දෙහි ආශ්‍රිත නිෂ්පාදන |

20

| | | | |
|---|---|---|---|
| 22 | එම්. හේමන්ත මහතා | 34සී, යාය 02, වම් ඇළ, මහකනදරාවැව | රනිල භෝග ආශ්‍රිත නිෂ්පාදන |
| 23 | සීතා කුමාරි හේරත් මිය | 67, ගලේවැව, ගල්නෑව | රයිසික්‍රීම් නිෂ්පාදනය |
| 24 | ප්‍රේමදාස මුණසිංහ මහතා | 159, 21, ජනපදය, ගලෙන්බිඳුනුවැව | සහල් සකස් කිරීම |
| 25 | ඩී.එස්.කේ. දිසානායක මහතා | 30, 'වාණිජ ප්‍රසාද' රාජාංගනය | නැවුම් පලතුරු බීම සකස් කිරීම |
| 26 | චන්ද්‍රිමා කුමාරසිංහ මිය | 362, මන්නාරම හන්දිය, විලච්චිය | කුළුබඩු සකස් කිරීම |
| 27 | ජීවන්ති කුමුදුනී මිය | කෝන්වැව, තඹුත්තේගම | නැවුම් පලතුරු බීම සකස් කිරීම |

**ව්‍යාප්තිය**

ආහාර සුරක්ෂිතතාව, ගුණාත්මකභාවය ඉහළ නැංවීම, අගය එකතු කිරීම සහ තිරසර කෘෂි කර්මාන්ත දියුණු කිරීම යන ජාතික පර්යේෂණ ප්‍රමුඛතා සහතික කිරීම සඳහා පඅතාආ විසින් මෙම ව්‍යාප්ති කටයුතු සිදු කරනු ලබයි. මෙමඟින් ප්‍රධාන වශයෙන් ග්‍රාමීය හා නාගරික ප්‍රදේශවල ජනතාවගේ ආදායම් උත්පාදනය අරමුණු කරයි. තවද, ................හඳුන්වාදීම මඟින් විදේශ වෙළඳපොළෙන් ආදායම් උත්පාදනය කිරීම මෙම ව්‍යාපෘතියේ අරමුණක් වේ.

Further, these project aim to income generation from foreign market by introducing high???

**කෘෂි භෝගවල පසු අස්වනු හානි අවම කිරීම**

ශ්‍රී ලංකාවේ කෘෂි භෝග ඉහළ පසු අස්වනු හානිය හේතුවෙන් විශාල ගැටලුවකට මුහුණ දෙයි. එබැවින් යෝග්‍ය පසු අස්වනු තාක්ෂණ ප්‍රචලිත කිරීම සඳහා රටේ කෘෂි භෝග සැපයුම් හා වටිනාකම් දාමයන්හි අදාළ පාර්ශවකරුවන් වෙත දැනුම හා තාක්ෂණික දැනුම් හැකියාව ව්‍යාප්ත කිරීම සඳහා පුහුණු වැඩසටහන් පැවැත්වීම මෙම ව්‍යාප්ති ක්‍රියාකාරකම අරමුණු කර ඇත. ව්‍යාපෘතිය යටතේ වැඩසටහන් 32 ක් ක්‍රියාත්මක කරන ලද අතර අනුරාධපුර, පොලොන්නරුව, කුරුණෑගල, අම්පාර, නුවරඑළිය, මහනුවර, ගාල්ල, පුත්තලම, යාපනය සහ උතුරු පළාත්වල ප්‍රතිලාභීන් 886 දෙනෙකු පුහුණු කර ඇත.

**ගබඩා ක්‍රමවේද සඳහා තාක්ෂණය හඳුන්වා දීම**

වාරයේදී සහ අතිරික්ත නිෂ්පාදනයක් ඇති පසු අස්වනු හානිය ඉහළ යන අතර මිල ගණන් පහළ යෑමද සිදු වේ. අනෙක් අතට අවාරයේදී පාරිභෝගිකයින්ට ඒ සඳහා වැඩි මිලක් ගෙවීමටද සිදු වේ. එබැවින්, කෘෂි නිෂ්පාදන සඳහා ගබඩා කිරීමේ තාක්ෂණය ප්‍රධාන වශයෙන් වැදගත් වේ. මෙම ව්‍යාපෘතිය යටතේ යෝග්‍ය පසු අස්වනු තාක්ෂණ ප්‍රචලිත කිරීම පිණිස රටේ කෘෂි භෝග සැපයුම් හා වටිනාකම් දාමයන්හි අදාළ පාර්ශවකරුවන් වෙත දැනුම හා තාක්ෂණික දැනුම් හැකියාව ව්‍යාප්ත කිරීම සඳහා පුහුණු වැඩසටහන් පැවැත්වීම අරමුණු කර ඇත. මෙම ක්ෂේත්‍රය යටතේ ව්‍යාප්ති කටයුතු 10 ක් පවත්වන ලද අතර අනුරාධපුරය, පොලොන්නරුව, කුරුණෑගල, අම්පාර, මහනුවර, ගාල්ල, පුත්තලම, යාපනය හා උතුරු පළාත්වල ප්‍රතිලාභීන් 289 දෙනෙකු පුහුණු කර ඇත.

**සහල්, මාෂ භෝග සහ අනෙකුත් ධාන්‍ය සැකසීම**

සහල්, මාෂ භෝග සහ වෙනත් ධාන්‍ය ප්‍රාථමික සැකසීම පිළිබඳව පසු අස්වනු ක්ෂේත්‍රය තුළ ප්‍රධාන වශයෙන් සැලකිල්ල යොමු වේ. එබැවින් මෙම තාක්ෂණික ක්ෂේත්‍රයේ දැනුම වැඩිදියුණු කිරීම කර්මාන්තයේ දියුණුවට අත්‍යවශ්‍ය වේ. සැකසීමේ ක්‍රමවේදවල දැනුම හා කුසලතාව වැඩිදියුණු කිරීම ව්‍යාප්ති ක්‍රියාකාරකම්වල අරමුණ වේ. මෙම කාරණය යටතේ අනුරාධපුර, පොලොන්නරුව, කුරුණෑගල, අම්පාර, නුවරඑළිය, මහනුවර, ගාල්ල, පුත්තලම, යාපනය සහ උතුරු පළාත්වල වැඩසටහන් 19ක් පවත්වා ප්‍රතිලාභීන් 542 ක් පුහුණු කරන ලදි.

**කුළුබඩු සැකසීම**

කුළුබඩු ශ්‍රී ලාංකික ආහාරවල අත්‍යවශ්‍ය අංගයකි. තවද, ඒ සඳහා අපනයන වෙළඳපොළ තුළ ඉහළ විභවයක් ඇත. එබැවින්, දැනට පවත්නා නිෂ්පාදනවල පවතින තත්ත්වයේ පවතින ගැටලු අවම කිරීම සහ නව ව්‍යවසායන් ආරම්භ කිරීම සඳහා සැකසුම් කර්මාන්තය වැඩිදියුණු කිරීම මෙම ව්‍යාපෘතියෙහි අරමුණ විය. ව්‍යාපෘතිය යටතේ වැඩසටහන් 11 ක් පවත්වන ලද අතර අනුරාධපුර, පොලොන්නරුව, කුරුණෑගල, අම්පාර, ගාල්ල, පුත්තල්, යාපනය සහ උතුරු පළාත්වල ප්‍රතිලාභීන් 276 දෙනෙකු පුහුණු කර ඇත.

21

## පළතුරු සහ එළවළු සඳහා අගය එකතු කිරීම

පලතුරු සහ එළවළු ස්වභාවයෙන්ම කල් තබා ගත නොහැකි තත්ත්වයක පවතින අතර එබැවින් රටෙහි ඉහළ පසු අස්වනු හානියකට හේතු වේ. මෙය විශාල මුදල් අපතේ යෑමටද හේතු වී ඇත. මෙම ගැටලුවට එක් විසඳුමක් වන්නේ අගය එකතු කිරීමයි. තවද, අගය එකතු කළ නිෂ්පාදන වෙළෙඳපොළට හඳුන්වාදීම මඟින් මෙම ක්ෂේත්‍රය සංවර්ධනය කිරීම සඳහා නව මාර්ග විවෘත වේ. එබැවින් මෙම ව්‍යාපෘතිය මඟින් කර්මාන්තයේ පාර්ශ්වකරුවන් සඳහා යෝග්‍ය තාක්ෂණය ප්‍රචලිත කිරීමද අරමුණු කර ඇත. මෙම ව්‍යාපෘතිය යටතේ වැඩසටහන් 46 ක් පවත්වන ලද අතර අනුරාධපුර, පොළොන්නරුව, කුරුණෑගල, අම්පාර, නුවරඑළිය, මහනුවර, ගාල්ල, පුත්තලම, යාපනය සහ උතුරු පළාත්වල පුහුණුකරුවන් ප්‍රතිලාභීන් 1168 දෙනෙකු පුහුණු කර ඇත.

## සහල් සහ මාෂ භෝග ආශ්‍රිත නිෂ්පාදන සංවර්ධනය

දේශීය ආහාර ජනප්‍රිය කිරීම සඳහා මේ වනවිට සැලකිල්ල යොමු වී තිබේ. මෙම සහල් හා මාෂ භෝග නිෂ්පාදනවල අගය එකතු කිරීම පරිභෝජනය ඉහළ යාමට පහසුවක් වනු ඇත. ඒ අනුව, සෞඛ්‍ය තත්ත්වය වැඩිදියුණු කිරීම සහ නිෂ්පාදකයාගේ ආදායම ඉහළ නැංවීමට හේතුවක් වේ. තවද, ග්‍රාමීය මට්ටමින් වුවද කෘෂි ආශ්‍රිත කර්මාන්ත සඳහා අවස්ථාවන් නිර්මාණය කරනු ඇත. එබැවින්, ඉහත අරමුණු සපුරා ගැනීම සඳහා පාර්ශ්වකරුවන්ට වටිනාකම් එකතු කරන නිෂ්පාදන සහ ඒවායේ තාක්ෂණය හඳුන්වා දීම සඳහා මෙම ව්‍යාපෘතිය මඟිනි ක්‍රියාකාරකම් සිදු කරන ලදී. ව්‍යාපෘතිය යටතේ වැඩසටහන් 47 ක් පවත්වන ලද අතර අනුරාධපුර, පොළොන්නරුව, කුරුණෑගල, අම්පාර, නුවරඑළිය, මහනුවර, ගාල්ල, පුත්තලම, යාපනය සහ උතුරු පළාත්වල ප්‍රතිලාභීන් 1373 දෙනෙකු පුහුණු කර ඇත

## ශ්‍රී ලංකාවේ මානව පෝෂණ හා ආහාර පුරුදු පිළිබඳ දැනුම්වත් කිරීමේ වැඩසටහන්

ආහාර සම්බන්ධ සෞඛ්‍ය ගැටලු සම්බන්ධයෙන් වර්තමානයේදී ප්‍රමුඛ අවධානයක් යොමු කර ඇත. බෝ නොවන රෝග පැතිරීම සමාජයට තර්ජනයකි. එබැවින්, නිසා වර්තමාන සෞඛ්‍ය ගැටලු විසඳීම සඳහා මිනිස් පෝෂණ හා ආහාර පුරුදු පිළිබඳ දැනුම්වත් කිරීම අතිශයින් වැදගත්ය. මෙම ගැටලුව විසඳුමක් සොයා ගැනීම සඳහා පාසැල් සිසුන් සහ ගුරුවරුන් සඳහා පුහුණු වැඩසටහන් පැවැත්වීම ව්‍යාපෘති අරමුණු වී ඇත. එබැවින් මෙම ව්‍යාපෘතිය යටතේ වැඩසටහන් 29ක් පවත්වන ලද අතර අනුරාධපුර, පොලොන්නරුව, කුරුණෑගල, අම්පාර, නුවරඑළිය, මහනුවර, ගාල්ල, පුත්තලම, යාපනය සහ උතුරු පළාත්වල සඳහා ප්‍රතිලාභීන් 1051 දෙනෙකු පුහුණු කරන ලදී.

## උපදේශනය

විශේෂයෙන් පසු අස්වනු ක්ෂේත්‍රයේ ගැටලු සඳහා විසඳුම් ලබා දීම පිණිස උපදේශන සේවාවන් භාර ගන්නා ලදී. පුහුණුවීම ලබා දීම තුළින් පමණක් අවශ්‍යතාවයන් සපුරලිය නොහැකි පුද්ගලයන්/සංවිධානවල ඉල්ලීම මත ප්‍රධාන වශයෙන් මෙම උපදේශන ලබා දෙන ලදී. 2016 වර්ෂය තුළදී, ආයතනය නව පශ්චාත් අස්වනු තාක්ෂණ ක්‍රමවේදයන් සොයා ගැනීමට ලක් කළ අතර එම තාක්ෂණ ක්‍රමවේදයන්ට අනුව ඔවුන්ගේ තාක්ෂණ ක්‍රමවේද වැඩිදියුණු කර ගැනීම සඳහා ඒවා ව්‍යවසායකයින් හට ලබා දීමට හැකි විය. එහි ප්‍රතිඵලයක් වශයෙන් නව මෝල් ආරම්භ කිරීම, දැනටමත් පවතින මෝල් නවීකරණය කිරීමට, ආහාර සැකසීමේ කර්මාන්තශාලා පිහිටුවීමට, වියළන ඒකක පිහිටුවීමට, නව ගබඩා ව්‍යුහයන් ඉදිකිරීමට සහ වෙනත් පශ්චාත් අස්වනු ක්‍රියාකාරකම් හා බැඳුනු තාක්ෂණික ගැටලු නිරාකරණය කර ගැනීමට නව ආයෝජකයන්, පෞද්ගලික සහල් මෝල් කරුවන්, මෝල් හිමියන්, සමුපකාර සංගම්, පෞද්ගලික වෙළෙන්දන්, රාජ්‍ය නොවන සංවිධාන සහ දිවයිනෙහි පශ්චාත් අස්වනු ක්‍රියාකාරකම්වල නියුතු පුද්ගලයින් 67දෙනෙකු පඅතාආ මඟ පෙන්වීම ලබා ගන්නට යෙදිණි.

## මහා භාණ්ඩාගාරයේ මූල්‍ය සංවර්ධන දෙපාර්තමේන්තුවේ ගබඩා ලදුපත් ව්‍යාපෘතිය

බුත්තල ටොන් දස දහසක තොග ගබඩා පිහිටුවීම සඳහා පසු අස්වනු උපදේශන සේවා සැපයීම සම්පූර්ණ කර ඇත. පිරිසිදු කිරීම සහ වියලීමේ කියාවලිය සඳහා අදාළ යන්ත්‍රසූත්‍ර සහ උපකරණ ආයතනය විසින් තෝරා ගෙන ඇගයීමට ලක් කරන ලදී. එසේම ආයතනයේ අධීක්ෂණය යටතේ රසායනාගාර පහසුකම් සංවර්ධනය කරන ලදී. එය මෙම වරෂයේදී පඅතාආ විසින් සිදු කරන ලද ප්‍රධාන ක්‍රියාකාරකමකි. මෙම ව්‍යාපෘතිය සඳහා මුදල් අමාත්‍යාංශයේ මූල්‍ය සංවර්ධන දෙපාර්තමේන්තුවෙන් මූල්‍යාධාර ලබා දුනි. පිරිවිතර සැකසීම, තාක්ෂණික ඇගයීම, යන්ත්‍රෝපකරණ පරීක්ෂා කිරීම, කොමිෂන් කිරීම හා කාර්ය මණ්ඩලය පුහුණු කිරීම මෙම ව්‍යාපෘතියට සම්බන්ධ ප්‍රධාන ක්‍රියාකාරකම් වේ. මෙම ගබඩාවල සිය වී හා අනෙකුත් ධාන්‍ය ගබඩා කර තැබීමට ගොවීන්ට අවසර දී ඇති අතර අදාළ බලධාරීන් වෙතින් මූල්‍ය පහසුකම් ලබා ගත හැකි අතර මිල ගණන් ඉහළ ගිය විට ඔවුන්ගේ ධාන්‍ය විකුණා වැඩි ලාභයක් ලබාගත හැකි වේ. ඔවුන් ඉතා අඩු ගබඩා පිරිවැයක් ගෙවිය යුතුය. 22





පඅතාආ උපදේශකයෙකු විසින් පසු අස්වනු ගබඩා කිරීමේ ක්‍රමවේදයන් ලබා දීම සහ ගබඩා තත්ත්වයන් අධීක්ෂණය කිරීම සඳහා සහාය ලබා දේ. මෙය ගොවීන්ට ඉහළ ප්‍රතිලාභ ලබා දෙනු ඇත.

ඊට අමතරව, ආයතන කාර්ය මණ්ඩලය, උපදේශකයන්, පසු අස්වනු තාක්ෂණයේ ඇගයීම් කමිටු සාමාජිකයන් ලෙස රජයේ ක්‍රියාකාරකම් සමහරක නිරතව සිටී. වර්තමානයේදී, ග්‍රාමීය ආර්ථික කටයුතු අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන ශීත ගබඩා ඒකක ඉදිකිරීම 2016-2017 සඳහා පත්කළ කැබිනට් මණ්ඩල අනුමැතිය ලත් තාක්ෂණ ඇගයීම් කමිටුවේ සාමාජිකයෙක් ලෙස ආයතනය කටයුතු කරනු ලැබේ.

## වෙනත් උපදේශන සහ උපදේශක සේවාවන්

එදිනෙදා ප්‍රශ්න, ක්‍රියාවලි වැඩිදියුණු කිරීම, තත්ත්වය වැඩිදියුණු කිරීම, යන්ත්‍රසූත්‍ර තෝරා ගැනීම, නිවැරදි ගබඩාකරණ ක්‍රමවේද සහ ඇසුරුම් ක්‍රමවේද ආදිය සම්බන්ධයෙන් නිවැරදි උපදෙස් ලබා ගැනීමේදී කුඩා සහ මධ්‍ය පරිමාණ ධාන්‍ය, කුළුබඩු, පලතුරු සහ එළවළු සකස් කරන්නන් ගැටලුවලට මුහුණපානු ලැබේ. මේ හේතුවෙන්, දුරකථන සංවාද, මුණගැසීම සහ අදාළ නිලධාරීන් සමඟ සාක සාකච්ඡා කිරීම, යන්ත්‍රසූත්‍ර නිරීක්ෂණය කිරීම සහ තාක්ෂණ දැනුම් හැකියාව හුවමාරු කර ගැනීම ආදිය තුළින් ඔවුන්ගේ ප්‍රශ්නවලට විසඳුම් ලබා දීමේ උපදේශන සේවාවක් පඅතාආ විසින් ආරම්භ කර ඇත. එමඟින් සකස් කරන්නන් ඔවුන්ගේ කර්මාන්ත දියුණු කර ගැනීම සඳහා ඉමහත් ප්‍රයෝජන ලබාගෙන ඇත. පහත දක්වා ඇති පරිදි ජනතාව මෙම සේවයෙන් ප්‍රතිලාභ ලබාගෙන ඇත

.

| අංකය | පාරිභෝගිකයාගේ නම | උපදේශන සේවාවන් |
|---|---|---|
| 1 | ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, විල්ගමුව | සහල් සැකසීමේ මධ්‍යස්ථානය |
| 2 | MPCS, පලුගස්දමන | සහල් පිටි නිෂ්පාදන |
| 3 | අයි.පී. අනුර විජේවර්ධන මහතා | මෙනේරි පොතු ඉවත් කිරීමේ යන්ත්‍රය |
| 4 | MPCS, ගිරිබාව | සහල් සැකසීමේ මධ්‍යස්ථානයක් ස්ථාපිත කිරීම |
| 5 | ලලිත් කොඩිප්පිලි මහතා, මිහින්තලේ | ධාන්‍ය සැකසීම |
| 6 | පී.ජී.එල්. වසන්ත මහතා | සහල් පිටි නිෂ්පාදන |
| 7 | පාලිත බණ්ඩාර මහතා | සහල් පිටි නිෂ්පාදන |
| 8 | පී.පී. විමලසිරි මහතා | සහල් මෝලක් ස්ථාපිත කිරීම |
| 9 | එක්සත් සහල් නිෂ්පාදන සංගමය, පොලොන්නරුව | සහල් මෝල් 25ක් සඳහා තාක්ෂණික වාර්තා ලබා දීම |
| 10 | සහිනි ඉන්ටර්නැෂනල් යුනයිටඩ් ලිමිටඩ් | නියැදි පරීක්ෂා කිරීම |
| 11 | පීස් වින්ඩ් ජපැන්, ත්‍රිකුණාමලය | වී තැම්බීමේ යන්ත්‍ර තෝරාගැනීම සඳහා උපදේශන |
| 12 | ඩී.ජී. විපුලසිරි මහතා | සහල් පිටි නිෂ්පාදන |
| 13 | එම්.ජී. නදීශා දිල්රුක්ෂි මිය | අළුත්වැඩියා කළ සහල් මෝල් |
| 14 | MPCS, හුරුළුගස්වැව | සහල් මෝලක් ස්ථාපිත කිරීම |

## ධාන්‍ය නියැදි විශ්ලේෂණය

ගොවීන්, සකස් කරන්නන්, පසු අස්වනු කර්මාන්තයන්හි නිරත වෙනත් පාර්ශවකරුවන් සහ පුද්ගලයන්ට පහසුකම් සැලසීම සඳහා ආයතනය විසින් පවත්වාගෙන යනු ලබන තවත් වැදගත් සේවාවකි, පරීක්ෂණාගාර සේවාව. මෙම වර්ෂයේදී ලබාදෙන ලද වැදගත් සේවාවන් සමහරක් මතු දක්වා ඇත.

| අංකය | ආයතනය | නියැදි වර්ගය | ප්‍රමාණය |
|---|---|---|---|
| 01. | පානිනි ඉන්ටර්නැෂනල් පෞද්. සමාගම | පලතුරු සහ එළවළු නියැදි | 45 |
| 02. | ශ්‍රී ලංකා යුද හමුදාව | සහල් නියැදි | 09 |
| 03. | එස්.එල්.ජී. බන්දුසිරි මහතා කෘෂිකර්ම අමාත්‍යාංශය | සහල් නියැදි | 07 |
| 04. | දිස්ත්‍රික් උසාවිය, පොලොන්නරුව | සහල් නියැදි | 01 |
| 05. | නියාස් මහතා, පී.එම්. රසිස් ප්‍රොඩක්ට්ස් | සහල් පිටි | 05 |
| 06. | එන්.ආර්. ඇල්ලෙපොළ මහතා | සහල් විස්කෝතු | 01 |
| 07. | නලින් මහතා<br>සුබ්‍රමනියම් මහතා<br>ගුණවර්ධන මහතා<br>අමිල ගයාන් මහතා | තල තෙල් | 06 |

## 05. ප්‍රකාශන, පේටන්ට බලපත්‍ර, සම්මාන සහ පිළිගැනීම

පර්යේෂණ ප්‍රකාශන සහ ඒවායින් සමාජයට ලැබෙන ප්‍රතිලාභ පහත පරිදි වේ.

| ප්‍රකාශනය | දායකත්වය |
|---|---|
| **විජේවර්ධන, ආර්.එම්.එන්.ඒ.**, නවරත්න, එස්.බී. සහ වික්‍රමසිංහ I. (2016) විවිධ පලතුරු කුඩුවල ආසන්න සංයුතිය හා ප්‍රතිඔක්සිකාරක විවිධ රඳවා ගැනීම මත විවිධ විජලන ක්‍රමවේදවල බලපෑම, අන්තර්ජාතික ආහාර පර්යේෂණ ජර්නලය 23 (5): 2016-2020. | පරිභෝජනය කිරීම සඳහා ඉහළ පෝෂණ හා ඖෂධීය ගුණ සහිත පලතුරු කුඩු නිපදවීම සඳහා කුඩා හා මධ්‍ය පරිමාණ ආහාර සැකසුම්කරුවන්ට තාක්ෂණික ක්‍රමවේද හඳුන්වා දීම. |
| **විජේවර්ධන, ආර්.එම්.එන්.ඒ.**, නවරත්න, එස්.බී., වික්‍රමසිංහ, I., ගුණවර්ධන, සී.ආර්., වාසල, ඩබ්ලිව්.එම්.සී.බී. සහ තිලකරත්න, බී.එම්.කේ.එස්. (2016), විජලන කරල ලද දිවුල් (Aegle marmelos) සහ තල් (Borassus flabellifer) එලවල භෞතික රසායනික හා ප්‍රතිඔක්සිකාරක ලක්ෂණ රඳවා ගැනීම, වෙළුම 6, pp.170-175 | පරිභෝජනය සඳහා ඉහළ පෝෂණ හා ඖෂධීය ගුණ සහිත පලතුරු කුඩු නිපදවීම සඳහා කුඩා හා මධ්‍ය පරිමාණ ආහාර සැකසුම්කරුවන් සඳහා තාක්ෂණික ක්‍රමවේද හඳුන්වා දීම. |
| සල, ඩබ්ලිව්.එම්.සී.බී., දිසානායක, සී.ඒ.කේ., ගුණවර්ධන, සී.ආර්., **විජේවර්ධන, ආර්.එම්.එන්.ඒ.**, ගුණතිලක, ඩී.එම්.සී.සී. සහ තිලකරත්න, බී.එම්.කේ.එස් (2016), ශ්‍රී ලංකාවේ ගබඩා කර ඇති වීවල ප්‍රධාන කෘමි පළිබෝධකයන්ට එරෙහිව කෘමිනාශක අන්තර්ගත කරන ලද මළුවල සඵලත්වය ඇගයීම. ප්‍රොසීඩියා ආහාර ජර්නලය. වෙළුම 6, pp.164-169. | ගබඩා කර ඇති වීවලට සිදු වන හානිය අඩු කිරීම සඳහා වාණිජ ධාන්‍ය ගබඩා කිරීමේදී පළිබෝධ පාලනය කිරීම සඳහා නව තාක්ෂණය හඳුන්වා දීම. |
| විජේවර්ධන, ආර්.එම්.එන්., නවරත්න, එස්.බී. සහ වික්‍රමසිංහ I. (2016), පිළිස්සීම සඳහා සූදානම් එළවළු කේක් මිශ්‍රණයක් සකස් කිරීම සහ ඇගයීම, කෘෂි විද්‍යාව පිළිබඳ ජර්නලය, කෘෂි විද්‍යා පීඨය, සබරගමුව විශ්ව විද්‍යාලය, ශ්‍රී ලංකාව 11, 1 (1): pp53-61 | ආහාර නිෂ්පාදන සකස් කිරීම සඳහා යොදා ගනු ලබනවාට වඩා අමතරව නිෂ්පාදනය කරනු ලබන ඌන උපයෝජිත පලතුරු සහ එළවළු විධිමත් ලෙස පරිභෝජනය කිරීම සඳහා සුදුසු තාක්ෂණික ක්‍රමවේද සකස් කිරීම |
| විජේවර්ධන, ආර්.එම්.එන්.ඒ., අස්ෆාන, එම්.එස්.එම්.එෆ්, රණදීර, එස්. සහ තිලකරත්න, බී.එම්.කේ.එස්. (2016), බතල (*Ipomoea batata*) පිටි ආශ්‍රිත පපඩම් සකස් කිරීම හා තත්ත්වය ඇගයීම, 2016 වර්ෂයේ පෙබරවාරි 19 සහ 20 යන දිනවල පවත්වන ලද ශ්‍රී ලංකා ජපන් ආදි ශිෂ්‍ය සංගමයේ අන්තජාර්තික සමුළුව. | අඩු වියදම් අමුද්‍රව්‍යයක් ලෙස අතිරික්ත අර්තාපල් යොදා ගනිමින් ආහාර නිෂ්පාදන සකස් කිරීම කිරීම සඳහා තාක්ෂණික ක්‍රමවේද හඳුන්වා දීම. මෙහි ප්‍රතිඵල කුඩා හා මධ්‍යම පරිමාණ ආහාර සැකසුම්කරුවන් විසින් භාවිතා කරනු ඇත. |

| | |
|---|---|
| ගුණවර්ධන, සී.ආර්., වාසල, ඩබ්ලිව්.එම්.සී.බී., දිසානායක, සී.ජේ.කේ., හේරත්, එම්. එම්., විජේවර්ධන, ආර්.එම්.එන්.ඒ. ස්වර්ණසිරි, ඩී.පී.සී., තිලකරත්න, බී.එම්.කේ.එස්. විජේරත්න, ආර්.එම්.එම්.කේ., වසන්ත, පී.ජී.එල් සහ සෝමකාන්තන්, එන් (2016) ඉඟුරු (*Zingiber officinale*) සඳහා අගය එකතු කිරීම: වෙළඳපොළ විභවය සහ ඉඟුරු ආශ්‍රිත නිෂ්පාදන සකස් කිරීම 2016 වර්ෂයේ පෙබරවාරි 19 සහ 20 යන දිනවල පවත්වන ලද ශ්‍රී ලංකා ජපන් ආදි ශිෂ්‍ය සංගමයේ අන්තජාර්තික සමුළුව. | ඉඟුරු ආශ්‍රිත නව්‍ය අගය එකතු කළ නිෂ්පාදන හඳුන්වා දීම. නිෂ්පාදනවල ගුණාත්මකභාවය ඉහළ නැංවීම සහ ව්‍යවසායකයන් සංවර්ධනය කිරීම සඳහා ප්‍රතිඵල භාවිතා කළ හැක. |
| **විජේවර්ධන, ආර්.එම්.එන්.ඒ.,** අස්ෆානා, එම්.එස්.එම්.එෆ්, **රණදීර, එස්. සහ තිලකරත්න, බී.එම්.කේ.එස්.** (2016), බනිස් සකස් කිරීම සඳහා තිරිඟු පිටි සඳහා විකල්පයක් ලෙස බතල (*Ipomoea batata*) පිටි භාවිතා කිරීම, 2016 අන්තර්ජාතික සම්මන්ත්‍රණයේ කාර්ය සටහන්, කෘෂිකර්ම පීඨය, රුහුණු විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව. | අඩු වියදම් අමුද්‍රව්‍යයක් ලෙස අතිරික්ත බතල යොදා ගනිමින් ආහාර නිෂ්පාදන සකස් කිරීම කිරීම සඳහා තාක්ෂණික ක්‍රමවේද හඳුන්වා දීම. මෙහි ප්‍රතිඵල කුඩා හා මධ්‍යම පරිමාණ ආහාර සැකසුම්කරුවන් විසින් භාවිතා කරනු ඇත. |
| චන්ද්‍රජිත්, යූ.ජී., විජේවර්ධන, ආර්.එම්.එන්.ඒ., ගුණවර්ධන, සී.ආර්. සහ තිලකරත්න, බී.එම්.කේ.එස්. (2016), බිලින් ඵලය (*Averrhoa bilimbi* L.) භාවිතා කර ජෑම් සකස් කිරීම සහ එහි සංවේදක හා භෞතරසායනික ගුණාංග ඇගයීම, 2016 අන්තර්ජාතික සම්මන්ත්‍රණයේ කාර්ය සටහන්, කෘෂිකර්ම පීඨය, රුහුණු විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව. | ආහාර නිෂ්පාදන සකස් කිරීම සඳහා න ඌන උපයෝජිත පලතුරු භාවිතා කිරීම සඳහා තාක්ෂණික ක්‍රමවේද සකස් කිරීම. මෙහි ප්‍රතිඵල කුඩා හා මධ්‍යම පරිමාණ ආහාර සැකසුම්කරුවන් විසින් භාවිතා කරනු ඇත. |
| වාසල, ඩබ්ලිව්.සී.බී., දිසානායක, සී.ජේ.කේ., ගුණවර්ධන, සී.ආර්., විජේවර්ධන, ආර්.එම්.එන්.ඒ., ගුණතිලක, ඩී.එම්.සී.සී. සහ තිලකරත්න යන බී.එම්.කේ. එස් (2016), බඩ ඉරිඟු ගබඩා කර තැබීමේදී ගබඩා ධාන්‍ය පළිබෝධකයන් පාලනය කිරීම සඳහා ඩෙල්ටමෙත්‍රින් අන්තර්ගත පොලිසැක් මළුවල කාර්යක්ෂමතාවය ඇගයීම, 2016 අන්තර්ජාතික සම්මන්ත්‍රණයේ කාර්ය සටහන්, කෘෂිකර්ම පීඨය, රුහුණු විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව. | වාණිජ බඩ ඉරිඟු ගබඩා තුළ කෘමි උවදුරු පාලනය කිරීම සඳහා තාක්ෂණික ක්‍රමවේද හඳුන්වා දීම. |
| **විජේවර්ධන, ආර්.එම්.එන්.ඒ.,** රිස්නා, එම්.ආර්.එෆ්., ජයවර්ධන, එන්.ඩබ්. අයි.ඒ. සහ වාසල, ඩබ්.එම්.සී.බී. (2016), විජලනය කළ සෝයා බෝංචි (Glycine max) කුඩු අන්තර්ගත කරන ලද පිසීම සඳහා සූදානම් නිර්මාංශ සූපයක් ධාරා හිමායනය භාවිතා කර සංරක්ෂණය කිරීම සහ එහි ගුණාත්මකභාවය ඇගයීම, ශ්‍රී ලංකා ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලයේ පවත්වන ලද 9 වන අන්තර්ජාතික පර්යේෂණ සමුළුවේ කාර්ය සටහන්, ISBN 978-955 -0301-28-7. | නැවුම් හා සැකසූ ආහාර නිෂ්පාදනවල රාක්ක ජීව කාලය දීර්ඝ කර ගැනීම සඳහා සඳහා කාර්යක්ෂම ක්‍රමවේදයක් ලෙස ධාරා හිමායන තාක්ෂණය හඳුන්වා දීම |
| **වාසල, ඩබ්ලිව්.එම්.සී.බී.,** දිසානායක, සී.ජේ.කේ., විජේවර්ධන, ආර්.එම්.එන්.ඒ., ගුණවර්ධන, සී.ආර්., රත්නායක, එච්.එම්.ජේ.පී., දිසානායක, ටී.එම්.ආර්. (2016), දේශීය තත්ත්වයන් සඳහා දිගුකාලීන වී තොග ගබඩා කිරීමේ ක්‍රමවේදයේ ශක්‍යතාවය, 9 වැනි ජාත්‍යන්තර පර්යේෂණ සම්මන්ත්‍රණය, ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්ව විද්‍යාලය ශ්‍රී ලංකාව, ISBN 978-955-0301-28-7. | මහා පරිමාණ කර්මාන්තවල ප්‍රයෝජනය සඳහා වී ගබඩා කිරීම සඳහා ඵලදායි ගබඩා කිරීමේ තාක්ෂණය හඳුන්වාදීම. |
| රත්නායක, ආර්.එම්.ආර්.එන්.කේ., දවුන්දසේකර, ඩබ්ලිව්.ඒ.එම්ර්., ආරියරත්න, එච්. එම්. සහ ගනේහේනගේ, එම්.වයි.යූ. (2016), කරවිලවල කුඩු වැනි පුස් වලදී ද්‍රාව්‍ය සිලිකන් මගින් සමහර ජෛව රසායනික ආරක්ෂක ප්‍රතික්‍රියා ඉහළ නැංවීම, ඕස්ට්‍රේලියානු ශාක ව්‍යාධිවේදී ජර්නලය 45 (4): 425-433. | කෘතිම වාණිජ දිලීර නාශකවලට විකල්ප උපාය මාර්ගයක්ක් ලෙස විෂ රහිත, පරිසර හිතකාමී රෝග පාලන ක්‍රමයක් හඳුන්වා දීම. එළවළු සැපයුම් දාමයේ සියලුම පාර්ශවකරුවන් මෙම සොයා ගැනීම් වලින් ප්‍රතිලාභ ලබනු ඇත |
| රත්නායක, ආර්.එම්.ආර්.එන්.කේ., දවුන්දසේකර, ඩබ්ලිව්.ඒ.එම්ර්., ආරියරත්න, එච්. එම්. සහ ගනේහේනගේ, එම්.වයි.යූ. (2016), පොටෑසියම් සිලිකේට් පාංශු යෙදුම මගින් කරවිල පත්‍රවල සිහින් කෙදි සහිත පුස්වල තීව්‍රතාවය අඩු කරයි, සිලෝන් විද්‍යා ජර්නලය | |
| රත්නායක, ආර්.එම්.ආර්.එන්.කේ., දවුන්දසේකර, ඩබ්ලිව්.ඒ.එම්., ආරියරත්න, එච්. එම්. සහ ගනේහේනගේ, එම්.වයි.යූ. (2016), කරවිල පත්‍රවල පෙර අස්වනු දිලීර පාලනය කිරීම සඳහා ස්වාභාවික සිලිකන් ප්‍රභවයක් ලෙස දහයියාවල බලපෑම ඇගයීම, PGIS පර්යේෂණ සම්මන්ත්‍රණයේ කාර්ය සටහන්, පේරාදෙණිය විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව. pp.74. | |
| **වම්පා, ඩබ්ලිව්.ඒ.එච්.,** රත්නායක, ආර්.ආර්.එන්.කේ., හේරත්, එම්. එම්., | නූතන විද්‍යාව හා තාක්ෂණය සමඟ |

25

| | |
|---|---|
| තිලකරත්න, බී.එම්.කේ.එස්., ගුණතිලක, ඩී.එම්.සී.සී. සහ චන්ද්‍රජිත්, යූ.ජී. (2016), කැප්පෙටියා (Croton aromaticus L.) සහ බිලින් (Averrhoa bilimbi L) පත්‍ර සංයෝජන මඟින් “ඇඹුල්” කෙසෙල් ප්‍රභේදයේ ඉදීම වේගවත් කිරීම. 5 වන YSF සම්මන්ත්‍රණයේ කාර්ය සටහන්, තරුණ විද්‍යාඥ සංසදය, ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිසම, අංක 31/9, 31/10, ඩඩ්ලි සේනානායක මාවත, කොළඹ 08, pp 14-16. | සාම්ප්‍රදායික දැනුම ඒකාබද්ධ කිරීම මඟින් පලතුරු ඉදවීම සඳහා නව්‍ය කාබනික ක්‍රමවේද හඳුන්වා දීම. මෙම පත්‍රිකා මඟින් මෙම ප්‍රයත්නයේ මූලික පරීක්ෂණ නියෝජනය කෙරේ. පළතුරු ඉදවීමේ කර්මාන්තයේ දී භාවිතා කළ හැකි තිරසර නිපැයුමක් සකස් කිරීම සඳහා තවදුරටත් අත්හදා බැලීම් සිදුකරමින් පවතී. |
| **චම්පා, ඩබ්ලිව්.ඒ.එච්.**, රත්නායක, ආර්.ආර්.එන්.කේ., හේරත්, එම්. එම්., තිලකරත්න, බී.එම්.කේ.එස්., ගුණතිලක, ඩී.එම්.සී.සී. සහ චන්ද්‍රජිත්, යූ.ජී. (2016), ), “ඇඹුල්” කෙසෙල් ප්‍රභේදයේ ඉදීම ප්‍රේරණය කිරීම මත කැප්පෙටියා (Croton aromaticus L.) පත්‍ර විවිධ ආකාරයන්ගේ බලපෑම කෘෂිකර්මාන්තය සහ පරිසරය පිළිබඳ අන්තර්ජාතික සම්මන්ත්‍රණය, කෘෂිකර්ම පීඨය,රුහුණු විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව, pp. 54-56. | |
| හේරත්, එච්.එම්.ඩබ්.එස්.කේ., **චම්පා, ඩබ්.ඒ.එච්.**, නයනාංජලී, ඩබ්.ඒ.ඩී. සහ ලක්මිණි, ජී.ඩබ්.ඒ.එස් (2016), “ඇඹුල්” කෙසෙල් ප්‍රභේදයේ ඉදීම ප්‍රේරණය කිරීම මත කජු (Anacardium occidentale) හා ඇහැළ (Cassia fistula) නැවුම් පත්‍ර කුඩුවල බලපෑම, WINC 2016, කාර්ය සටහන්, වයඹ විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව, pp.163. | |
| හේරත්, එච්.එම්.ඩබ්.එස්.කේ., චම්පා, ඩබ්.ඒ.එච්., ලක්මිණි, ජී.ඩබ්.ඒ.එස්. නයනාංජලී, ඩබ්.ඒ.ඩී. (2016), “ඇඹුල්” කෙසෙල් ප්‍රභේදයේ ඉදීම ප්‍රේරණය කිරීම සඳහා කාබනික ක්‍රමවේදයක් සකස්ය කිරීම, 08 වන වාර්ෂික පර්යේෂණ සම්මන්ත්‍රණයේ කාර්ය සටහන්, කෘෂිකර්ම පීඨය, රජරට විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව, pp 45. | |
| **ඩබ්.එම්.සී.බී.** වාසල, සී.ඒ.කේ. දිසානායක, සී.ආර්. ගුණවර්ධන, ආර්.එම්.එන්.ඒ. විජේවර්ධන, ඩී.එම්.සී.සී. ගුණතිලක, බී.එම්.කේ.එස්. තිලකරත්න, **ශ්‍රී ලංකාවේ ගබඩා කර ඇති වීවල ප්‍රධාන කෘමි පළිබෝධකයන්ට එරෙහිව කෘමිනාශක අන්තර්ගත කරන ලද මළුවල සඵලත්වය** ඇගයීම, ප්‍රොසීඩියා ආහාර විද්‍යා, ELSEVIER ජර්නලය: 6 (2016) | ගබඩා පළිබෝධ මර්ධනය සඳහා තාක්ෂණය හඳුන්වා දීම.<br>මෙම පර්යේෂණය ගොවීන් සහ මෝල් හිමියන් සඳහා ප්‍රයෝජනවත් වනු ඇත. |
| ඩී.එම්.සී.සී. ගුණතිලක, **ඩබ්ලිව්.එම්.සී.බී.** වාසල, පලිපාන, කේ.බී., **ලොකු ලූණු ප්‍රමාණය අනුව ශ්‍රේණිගත කිරීමේ යන්ත්‍රයක් සැලසුම් කිරීම සහ සකස් කිරීම**, ප්‍රොසීඩියා ආහාර විද්‍යා, ELSEVIER ජර්නලය: 6 (2016) | ක්ෂේත්‍ර මට්ටමේදී ලොකු ළූණු ශ්‍රේණිගත කිරීම සඳහා නව යන්ත්‍රයක් හඳුන්වාදීම<br>මෙම පර්යේෂණය ගොවීන් සහ මෝල් හිමියන් සඳහා ප්‍රයෝජනවත් වනු ඇත. |
| ආර්.එම්.එන්.ඒ. විජේවර්ධන, එම්.ආර්.ආර්. රිස්නා, එන්.ඩබ්.අයි.ඒ. ජයවර්ධන, **ඩබ්.එම්.සී.බී.** වාසල සහ **බී.එම්.කේ.එස්.** තිලකරත්න, **විජලනය කළ සෝයා බෝංචි (*Glycine max*) කුඩු අන්තර්ගත කරන ලද පිසීම සඳහා සූදානම් නිර්මාංශ සූපයක් ධාරා හිමායනය භාවිතා කර සංරක්ෂණය කිරීම සහ එහි ගුණාත්මකභාවය** ඇගයීම, ශ්‍රී ලංකා ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලයේ පවත්වන ලද 9 වන අන්තර්ජාතික පර්යේෂණ සමුළුවේ කාර්ය සටහන්, ISBN 978-955 -0301-28-7. | නැවුම් හා සැකසූ ආහාර නිෂ්පාදනවල රාක්ක ජීව කාලය දීර්ඝ කර ගැනීම සඳහා සඳහා කාර්යක්ෂම ක්‍රමවේදයක් ලෙස ධාරා හිමායන තාක්ෂණය හඳුන්වා දීම |
| ඩී.එස්.එස්.පී. බණ්ඩාර, කේ.එස්.පී. අමරතුංග, එල්. රාජපක්ෂ, ටී.එම්.ආර්. දිසානායක. **ඩබ්.එම්.සී.බී.** වාසල, **කුළු බඩු ඇඹරීමේ විකල්ප ක්‍රමවේද - සමාලෝචනයකි**, තිරසරව ඉදිකරන ලද පරිසරය පිළිබඳ 7 වන අන්තර්ජාතික සම්මන්ත්‍රණයේ කාර්ය සටහන්, 2016 දෙසැම්බර් 16 සිට 17 දක්වා, මහනුවර, ශ්‍රී ලංකාව. | කුළුබඩු කර්මාන්තයේ ව්‍යවසායකයන් දැනුම්වත් කිරීම |
| සී.ආර්.ගුණවර්ධන, ඩබ්.එම්.සී.බී.වාසල, සී.ඒ.කේ. දිසානායක, එම්. එම්. හේරත්, ආර්. එම්. එන්.ඒ. විජේවර්ධන, ඩී. පී. සී. වර්ණසිරි, බී.එම්.කේ. එස්. තිලකරත්න, ආර්. එම්. එම්.කේ. විජේරත්න, පී.ජී. එල්. වසන්ත, එන්. සෝමකාන්තන්. **ඉඟුරු (*zingiber officinale*) සඳහා අගය එකතු කිරීම: ඉඟුරු ආශ්‍රිත නිෂ්පාදනවල වෙළඳපොළ විභවයන් සහ එම නිෂ්පාදන සංවර්ධනය කිරීම**, 2016 වර්ෂයේ පෙබරවාරි 20 වැනි දින පවත්වන ලද ශ්‍රී ලංකා ජපන් උපාධිධාරි ආදිශිෂ්‍ය සංගමයේ අන්තජාර්තික සමුළුව. | ඉඟුරු ආශ්‍රිත නව්‍ය අගය එකතු කළ නිෂ්පාදන හඳුන්වා දීම. නිෂ්පාදනවල ගුණාත්මකභාවය ඉහළ නැංවීම සහ ව්‍යවසායකයන් සංවර්ධනය කිරීම සඳහා ප්‍රතිඵල භාවිතා කළ හැක. |
| *එච්.එම්.ඒ.පී. රත්නායක, **ඩබ්.එම්.සී.බී.** වාසල, ටී.එම්.ආර්. දිසානායක, ඩී.එම්.එස්.පී. බණ්ඩාර සහ ඩී.පී. සේනානායක, **සහල් සකස් කිරීමේදී ප්‍රතිකාර කළ යුතු අපවහන පරිමාව අවම කිරීම සඳහා තැම්බූ අපජල බැහැර කිරීමේ පද්ධතිය සඳහා වෙනස් කිරීම් සිදු කිරීම සහ ඇගයීම**, කෘෂිකර්මය හා පරිසරය පිළිබඳ අන්තර්ජාතික සම්මන්ත්‍රණයේ කාර්ය* | වී තැම්බීමේ පද්ධතිය සඳහා යෝග්‍ය අප ජල ප්‍රතිකාර ක්‍රමවේදයක් හඳුන්වා දීම.<br>තාක්ෂණය සහල් මෝල් කර්මාන්තයේදී සෘජුවම ක්‍රියාවට නැංවිය හැක. |

| | |
|---|---|
| *සටහන්, කෘෂිකර්ම පීඨය, රුහුණු විශ්වවිද්‍යාලය, 2016 ජනවාරි 13 වන දින පවත්වන ලදී.* | |
| *සී.ඒ.කේ. දිසානායක, එස්. ද සිල්වා,* ***ඩබ්.එම්.සී.බී.*** *වාසල සහ බී.එම්.කේ. එස්. තිලකරත්න,* ***ක්ෂුද්‍ර ව්‍යවසායන් පුළුල් කිරීම කෙරෙහි බලපාන සාධක: ගෘහාශ්‍රිත සහල් සැකසුම්වල SWOT විශ්ලේෂණය****, කෘෂිකර්මය හා පරිසරය පිළිබඳ අන්තර්ජාතික සම්මන්ත්‍රණයේ කාර්ය සටහන්, කෘෂිකර්ම පීඨය, රුහුණු විශ්වවිද්‍යාලය, 2016 ජනවාරි 13 වන දින පවත්වන ලදී.* | *සහල් සැකසුම් ක්ෂේත්‍රයේ ව්‍යවසාය සංවර්ධන ගැටලු හඳුනා ගැනීම. පසු අස්වනු කර්මාන්තය සංවර්ධනය කිරීම සඳහා ලිහිල් කිරීමේ ක්‍රියාමාර්ග හඳුනා ගැනීම.* |
| ඩී.එම්.එස්.පී බණ්ඩාර, සී.ඒ.කේ. දිසානායක, ටී.එම්.ආර්. දිසානායක, එච්.එම්.ඒ.පී. රත්නායක සහ ඩී.පී. සේනානායක. **මී (Madhuca longifolia) තෙල් නිස්සාරණය කිරීම සඳහා ඉස්කුරුප්පු ආකාරයේ තෙල් නිස්සාරකයක කාර්ය සාධනය ඇගයීම.** ජෛවපද්ධති ඉංජිනේරු විද්‍යා ජර්නලය,.කොරියාව; Vol.41 (No.3), pp.177 ~ 183 (2016) | අතහැර දැමූ කර්මාන්තය ප්‍රචලිත කිරීම සහ ඌන-උපයෝජිත භෝග නිෂ්පාදනය වැඩි දියුණු කිරීම |
| ඩී.එම්.එස්. පී.බණ්ඩාර, කේ.එස්.පී. අමරතුංග, එල්. රාජපක්ෂ, ටී.එම්.ආර්. දිසානායක හා ඩබ්.එම්.සී.බී. වාසල, **කුළු බඩු ඇඹරීමේ විකල්ප ක්‍රමවේදය.** තිරසර ලෙස ඉදි කළ පරිසරය පිළිබඳ අන්තර්ජාතික සමුළුවෙහි (ICSBE) කාර්ය සටහන් (2016) pp75-81. | සැකසූ කුළු බඩු නිෂ්පාදනවල ගුණාත්මකභාවය ඉහළ නැංවීම සහ කුළු බඩු කර්මාන්තය වැඩිදියුණු කිරීම. |
| **දිසානායක බී.ඩී.එම්.පී.බී** සහ ජයවර්ධන, **මෙනේරි භාවිතා කර නූඩ්ල්ස් නිෂ්පාදනය කිරීම**- ELSEVIER, ප්‍රොසීඩියා ආහාර විද්‍යා 6 (2016), අන්තර්ජාතික ජර්නලය pp.293-297 | මෙනේරි භාවිතා කර නූඩ්ල්ස් නිෂ්පාදනය කිරීම සඳහා ක්‍රමවේදයක් නිර්මාණය කිරීම. මෙනේරි වගාකරුවන් සඳහා වෙළඳපොළ විභවය වැඩිදියුණු කිරීම හා පාරිභෝගිකයින්ට උසස් තත්ත්වයේ නිෂ්පාදන හඳුන්වා දීම. |
| චන්ද්‍රජිත් යූ.ජී., ගුණතිලක ඩී.එම්.සී.සී., **බණ්ඩාර බී.ඩී.එම්.පී** සහ ස්වර්ණසිරි ඩී.පී.සී., ශ්‍රී ලංකාවේ දීර්ඝ හා කෙටි කාලීන වී අස්වැන්නෙහි මූලික වී අස්වැන්න සහ පිදුරු කැබලි ප්‍රමාණය මත ඒකාබද්ධ අස්වනු නෙලීමේ බලපෑම - ELSEVIER, ප්‍රොසීඩියා ආහාර විද්‍යා 6 (2016), අන්තර්ජාතික ජර්නලය, pp 242 -245 | සුලභව පවතින ඒකාබද්ධ අස්වනු නෙලීමේ යන්ත්‍රවල අස්වනු නෙලීමේ සහ කොළමැඩීමේ හානි ඇගයීම. අස්වැන්න නෙලීම සහ කොළමැඩීම සඳහා සුදුසු යන්ත්‍රෝපකරණ හඳුන්වා දීම. |
| **බණ්ඩාර බී.ඩී.එම්.පී.**, ඩී.පී. සේනානායක, ස්වර්ණසිරි ඩී.පී.සී. සහ බී.එම්.කේ.එස්. තිලකරත්න, අඩු පිරිවැය තල පොතු ඉවත් කිරීමේ යන්ත්‍රයක් සකස් කිරීම- ශ්‍රී ලංකා ජපාන උපාධිධාරි ආදිශිෂ්‍ය සංගමයේ අන්තජාර්තික සමුළුව (IC-JAGAAS 2016), pp120-123 | තල ආශ්‍රිත නිෂ්පාදන සඳහා ඉහළ ගුණාත්මකභාවයකින් යුත් අමුද්‍රව්‍ය හඳුන්වාදීම. |

## 2016 වර්ෂයේදී ලබා ගත් සම්මාන

01. NRC (ජාතික පර්යේෂණ සභාව) – "මිදි (*Vitis vinifera* L.) cv. ෆ්ලේම් සීඩ්ලස් ප්රභේදයේ ගුණාත්මකභාවය පවත්වාගෙන යෑම සහ රාක්ක ජීව කාලය දීර්ඝ කර ගැනීම සඳහා පසු අස්වනු පොලිඇමයින ප්‍රතිකාරක" යන තේමාවෙන් "පසු අස්වනු ජෛවවිද්‍යා සහ තාක්ෂණ ජර්නලයේ 2014, වෙළුම.91, pp 57-63" පළ කරන ලද පර්යේෂණ පත්‍රිකාව සඳහා විද්‍යාත්මක ප්‍රකාශන වෙනුවෙන් වූ කුසලතා සම්මානය.

02. YSF (තරුණ විද්‍යාඥ සංසදය) - " "ඇඹුල්" කෙසෙල් ප්‍රභේදයේ ඉදීම ප්‍රේරණය කිරීම මත කැප්පෙටියා (*Croton aromaticus* L.) සහ බිලින් (*Averrhoa bilimbi* L) පත්‍ර සංයෝජනයේ බලපෑම" යන තේමාව

යටතේ ශ්‍රී ලංකා ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභාවේ 5 වන YSF සම්මන්ත්‍රණයේදී (2016) වාචික ඉදිරිපත් කිරීම සඳහා කුසලතා සම්මානය.

ජනාධිපති සම්මාන

• ඉංජිනේරු අංශයේ දෙවන ස්ථානය හිමිකරගත් ඉංජි. ටී.එම්.ආර්. දිසානායක මහතා විසින් නිර්මාණය කරන ලද "වියළි ගම්මිරිස් සඳහා වාෂ්ප ජීවාණුහරණ යන්ත්‍රය" අගයමින් ජනාධිපති සම්මානය පිරිනමන ලදී.

• ආහාර තාක්ෂණ අංශයේ කුසලතා සම්මානයක් හිමිකරගත් ආචාර්ය ආර්.එම්.එන්.ඒ. විජේවර්ධන මහත්මිය විසින් නිපදවන ලද "නැවුම් පලතුරු සඳහා ලිපිඩ පාදක කරගත් ආහාරයට ගතහැකි ආවරණයක් (ඉටි) සකස් කිරීම" අගයමින් ජනාධිපති සම්මානය පිරිනමන ලදී.

• ඉංජිනේරු අංශයේ කුසලතා සම්මානයක් හිමිකරගත් ඉංජි. ටී.එම්.ආර්. දිසානායක මහතා විසින් නිර්මාණය කරන ලද "අඛණ්ඩ වී ස්ටීමරය" අගයමින් ජනාධිපති සම්මානය පිරිනමන ලදී.

පුවත්පත් ලිපි/ප්‍රවෘත්ති අයිතම

2016 දෙසැම්බර් මාසයේ 4 වන ඉරිදා "සිළුමිණ" පුවත්පතේ පලතුරු හා එළවළු හානිය අවම කිරීම පිළිබඳ සිංහල ලිපියක් පළ විය.

## 06. සම්මන්ත්‍රණ, සමුළු, පුහුණු වැඩසටහන් සහ වැඩමුළු

### දේශීය පුහුණු වැඩසටහන්

| පාඨමාලාව | නම | කාල සීමාව | ආයතනය |
|---|---|---|---|
| Arduino පුහුණුව සමඟ මයික්‍රොකොන්ට්‍රොලර් වැඩසටහන්කරණය | ඩී.එම්.එස්.පී. බණ්ඩාර ටී.එම්.ආර්. දිසානායක | 2016.01.20 | ඊසොෆ්ට් මෙට්‍රෝ කැම්පස්, කොළඹ |
| පර්යේෂකයින් සඳහා මූලික සංඛ්‍යානය පිළිබඳ කෙටිකාලීන පාඨමාලාව: මූලධර්ම හා භාවිතයන් | සියලු පර්යේෂණ සහ සංවර්ධන කාර්ය මණ්ඩලය | 2016.06.14 | ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභාව |
| "පර්යේෂකයින් සඳහා මූලික සංඛ්‍යානය: මූලධර්ම හා භාවිතයන්", පිළිබඳ වැඩමුළුව , තරුණ විද්‍යා සංසදය විසින් සංවිධානය කරන ලදී | පර්යේෂණ කාර්ය මණ්ඩලය | 2016-06-13 සිට 2016-06-14 | ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභාව |
| උසස් තත්ත්වයේ අත්පොතක් සහ සහ මෙහෙයුම් ක්‍රියාපටිපාටියක් සකස් කිරීම | පර්යේෂණ කාර්ය මණ්ඩලය | 2016-07-14 සිට 2016-07-15 | අනුකූලතා තක්සේරු පිළිබඳ ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලය |
| විනය කාර්ය පටිපාටිය | ආර්.කේ.ඒ.පී. රත්නායක | 2016.06.10 | PRAG ආයතනය |
| "ආකල්ප හා හැකියාවන්" පිළිබඳ වැඩමුළුව | සියලු කාර්ය මණ්ඩලය | 2016.06.20 | ජාතික ඵලදායිතා මධ්‍යස්ථානය |

### කෙටි කාලීන විදේශ වැඩසටහන්

| සහභාගී වූ නිලධාරින් | කාල සීමාව | පුහුණු පාඨමාලාව |
|---|---|---|
| එච්.එම්.ඒ.පී. රත්නායක | 2016 ජූලි 07 සිට අගෝස්තු 05 දක්වා | ශ්‍රී ලංකාව සඳහා කෘෂි –තාක්ෂණ ව්‍යාප්තිය පිළිබඳ පුහුණු පාඨමාලාව 2016 |
| සී.ආර්.ගුණවර්ධන මහතා. | 2016 නොවැම්බර් 14-18 දක්වා බැංකොක්, තායිලන්තය | ඓතිහාසික ග්‍රාමීය දාම කළමණාකරණය පිළිබඳ කලාපීය පුහුණු වැඩමුළුව |
| එම්.එම්. හේරත් මහතා | | |
| ආර්.එම්.එන්.ඒ. විජේවර්ධන මෙය | 2016 සැප්තැම්බර් 14-30 | සේද මාර්ගය ඔස්සේ ගොඩබිම සහ වෙරළබඩ රටවල නිලධාරින් සඳහා නවීන කෘෂිකාර්මික කළමනාකරණය |
| බී.ඩී.එම්.පී.බී. දිසානායක මහතා | 2016 සැප්තැම්බර් 14-30 | සේද මාර්ගය ඔස්සේ ගොඩබිම සහ වෙරළබඩ රටවල නිලධාරින් සඳහා නවීන කෘෂිකාර්මික කළමනාකරණය පිළිබඳ සම්මන්ත්‍රණය |
| සී.ඒ.කේ. දිසානායක මහතා | 2016 සැප්තැම්බර් 26-30 පැරෝ, භූතානය. | උද්‍යාන විද්‍යා දාම කළමනාකරණය පිළිබඳ පුහුණුකරුවන් පුහුණු කිරීම |
| ආර්.එම්.ආර්.එන්.කේ. රත්නායක මෙය | | |

### යන්ත්‍රාගාර/කර්මාන්ත පුහුණුව

සමාලෝචිත කාලපරිච්ඡේදය තුළදී පහත නම් සඳහන් ශිෂ්‍යයන් පුහුණුවන්නන් ලෙස අප ආයතනයට අනුයුක්තව සිටියේය.

| නම | ආයතනය | පුහුණුව | කාල පරිච්ඡේදය |
|---|---|---|---|
| යූ.ජී.ටී.එම්.විජේරත්න | NAITA | ICT තාක්ෂණවේදය | 2015.07.10-2016.01.09 |
| එච්.එම්.එස්.පී.කේ. හේරත් | පේරාදෙණිය විශ්වවිද්‍යාලය | ආහාර විද්‍යා හා තාක්ෂණ | 2015.12.07-2016.02.08 |
| එල්.ජී.එස්. වත්සලා | NAITA | ගණකාධිකාරී ශිල්පී | 2016.07.17-2016.07.17 |
| යූ.ජී.ටී.එම්.විජේරත්න | NAITA | ICT තාක්ෂණවේදය | 2015.07.07-2016.01.08 |
| ඩී.එච්. වික්‍රමපාල | වෘත්තීය පුහුණු අධිකාරිය | ICT තාක්ෂණවේදය | 2016.03.02-2016.09.01 |
| ඒ.එච්.කේ.කේ. අබේකෝන්<br>එස්.එන්. නුගලියද්ද<br>එන්.ආර්.ටී.එන්. සන්දීපනී | කෘෂිකර්ම පාසල, පුලියන්කුලම | කෘෂිකර්ම ක්ෂේත්‍ර සහකාර | 2015.09.30-2016.06.01 |
| යූ.ඒ.එස්. සම්මානි | NAITA | ICT තාක්ෂණවේදය | 2016.05.06-2016.11.05 |
| ටී.එම්.බී. තෙන්නකෝන්<br>එම්.ආර්.එන්. බාලසූරිය | විවෘත විශ්වවිද්‍යාලය | ඉංජිනේරු උපාධිය සහ ඩිප්ලෝමාව | 2016.05.09-2016.08.19 |
| ජේ.ඒ.සී.පී. ජයසූරිය | NAITA | ICT තාක්ෂණවේදය | 2015.11.06-2016.05.05 |
| එල්.එල්. එස්. මධුෂංක | ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය | කුළු බඩු තාක්ෂණය | 2016.08.08-2016.11,11 |
| එම්.එම්.එන්.කේ.කේ.සී. මාරසිංහ | NAITA | මූලික කාර්මික පුහුණුකිරීම් | 2016.08.22-2017.07.15 |
| යූ.ඒ.එස්.එස්. ප්‍රේමසිරි | NAITA | ICT තාක්ෂණවේදය | 2016.11.05-2017.05.04 |
| ඩබ්.ජී.එස්. කුමාරි<br>ඩී.එම්.අයි.එස්. දිසානායක<br>ජේ.අයි. කැටිපේආරච්චි<br>ටී.ජී.අයි.එම්.කේ. තිලකරත්න<br>ජේ.එම්.ඒ.එම්. සෙව්වන්දි<br>අයි.එම්.එම්. අසාර්ඩීන්<br>එම්.ආර්.එම්. රසිත් | යුනිවර්සිටි කොලේජ් ඔෆ් අනුරාධපුර | වෘත්තීය තාක්ෂණය | 2016.11.10-2016.11.14 |

## 07. ප්‍රචාරය/ප්‍රකාශන

### පුවත්පත් ලිපි/ප්‍රවෘත්ති අයිතම

සමාලෝචිත කාල පරිච්ඡේදය තුළදී පඅතාආ ක්‍රියාකාරකම් ජනමාධ්‍ය තුළින් ප්‍රචාරය කරන ලද අතර විස්තර පහත දක්වා ඇත:

"සිළුමිණ" පුවත්පතේ පළවූ ලිපි

- 2016 දෙසැම්බර් මාසයේ 4 වන ඉරිදා "සිළුමිණ" පුවත්පතේ පලතුරු හා එළවළු හානිය අවම කිරීම පිළිබඳ සිංහල ලිපියක් පළ විය.

### පඅතාආ ප්‍රකාශන බෙදා හැරීම

සමාලෝචිත කාල පරිච්ඡේදය තුළදී පසු අස්වනු තාක්ෂණ වැඩිදියුණු කිරීම් පිළිබඳ අත් පත්‍රිකා, පත්‍රිකා සහ වෙනත් තොරතුරු සහරා පිටපත් 27967ක් සිංහල හා ඉංග්‍රීසි භාෂා ද්විත්වයෙ ප්‍රකාශයට පත් කරන ලද අතර ඒවා ආයතනයේ ප්‍රතිලාභීන් වෙත නිකුත් කරන ලදී.

**සහභාගී වූ ප්‍රදර්ශන**

සමාලෝචිත කාල පරිච්ඡේදය තුළදී පඅතාආ පහත සඳහන් ප්‍රදර්ශන සඳහා සහභාගී විය.

| දිනය | ප්‍රදර්ශනය |
|---|---|
| 2016.03.06 - 2016.03.08 | "විෂෙන් තොර කෘෂිකර්මාන්තය" පිළිබඳ අධ්‍යාපනික ප්‍රදර්ශනය සහ වෙළඳ පොළ, BMICH, කොළඹ |
| 1016.08.29 - 2016.08.30 | ජාතික ගොවි සම්මන්ත්‍රණය සහ කෘෂිකාර්මික ප්‍රදර්ශනය - අම්පාර |
| 2016.09.01 - 2016.09.03 | "කෘෂි නවෝදය" මැදගොඩ 2වැනි අදියර |

## 08. පඅතාආ පහසුකම් භාවිතා කරන ලද අනෙකුත් ආයතන

2016 වර්ෂය තුළදී පහත සඳහන් ආයතන/සංවිධාන සම්මන්ත්‍රණ සහ නේවාසිකාගාර පහසුකම් භාවිතා කර ඇත.

| අංකය | ආයතනයේ නම | වාර ගණන |
|---|---|---|
| 1. | ඇසෝසියේට් මෝටර්වේස් (පෞද්.) සමාගම | 02 |
| 2. | මධ්‍යම පරිසර අධිකාරිය | 02 |
| 3. | කාර්මික විද්‍යාලය - අනුරාධපුර | 03 |
| 4. | ගොවි කටයුතු සංවර්ධන දෙපාර්තමේන්තුව | 02 |
| 5. | ආයුර්වේද දෙපාර්තමේන්තුව | 01 |
| 6. | සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව | 05 |
| 7. | කම්කරු දෙපාර්තමේන්තුව | 01 |
| 8. | ජාතික ප්‍රජා ජල සම්පාදන දෙපාර්තමේන්තුව | 02 |
| 9. | වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව | 04 |
| 10. | දිස්ත්‍රික් ඉඩම් භාවිතය සැලසුම් කිරීමේ කාර්යාලය අනුරාධපුරය | 01 |
| 11. | පවුල් පුනරුත්ථාපන මධ්‍යස්ථානය | 01 |
| 12. | ආහාර සහ කෘෂිකර්ම සංවිධානය (FAO) | 03 |
| 13. | GLL (පෞද්.) සමාගම | 01 |
| 14. | මිල්කෝ (පෞද්.) සමාගම | 01 |
| 15. | කෘෂිකර්ම අමාත්‍යාංශය | 05 |
| 16. | අධ්‍යාපන අමාත්‍යාංශය | 03 |
| 17. | ජාතික ජල සම්පාදන ජලාපවහන මණ්ඩලය | 02 |
| 18. | ජාතික තරුණ සේවා සභාව | 02 |
| 19. | නිම්නය අධ්‍යාපන සංවර්ධන පදනම, අනුරාධපුර | 02 |
| 20. | උතුරු මැද පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව | 02 |
| 21. | කෘෂිකර්ම නියෝජ්‍ය අධ්‍යක්ෂ කාර්යාලය - බදුල්ල | 03 |
| 22. | ජ්ලෑන් ඉන්ටර්නැෂනල් ශ්‍රී ලංකා ආයතනය | 03 |
| 23. | තැපැල් දෙපාර්තමේන්තුව | 01 |
| 24. | ශ්‍රීලංකා රජරට විශ්වවිද්‍යාලය | 48 |
| 25. | ප්‍රාදේශීය සංවර්ධන බැංකුව | 03 |
| 26. | මාර්ගස්ථ ප්‍රවාහන සේවා අධිකාරිය | 02 |
| 27. | සියෙරා කන්ස්ට්‍රක්ෂන් (පෞද්.) සමාගම | 01 |
| 28. | ශ්‍රී ලංකා පළාත් පාලන ආයතනය | 02 |
| 29. | ශ්‍රී ලංකා ප්‍රවාහන අධිකාරිය | 02 |
| 30. | ප්‍රධාන අමාත්‍යාංශය - උතුරු මැද පළාත | 05 |
| 31. | ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලය | 04 |

## 09. පර්යේෂණ සහ පුහුණු/ව්‍යාප්ති සඳහා පහසුකම් වැඩිදියුණු කිරීම

නේවාසික පහසුකම් වැඩිදියුණු කිරීම සඳහා පඅතාආ නේවාසිකාගාර පහසුකම් වැඩි දියුණු කරන ලදී.

- මෙම වැඩිදියුණු කිරීම් යටතේ කාමර නව බිම්උළු යොදා අලුත්වැඩියා කරන ලදි. වායුසමනය කළ කාමර සඳහා ගෘහභාණ්ඩ සහ ඇඳ ඇතිරිලි සපයන ලදී. නේවාසිකාගාරය වටා නව වැටක් ඉදි කෙරිණි.

## 10. පඅතාආ කාර්ය මණ්ඩලයේ සාමාජිකත්වයන් සහ කමිටුවල සාමාජිකයන්

**ඉංජි. ටී.එම්.ආර්. දිසානායක මහතා**

1. කෘෂිකාර්මික සහ වැව්ලි ඉංජිනේරු ආංශික කමිටුවේ සභාපති
2. ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනයේ සභා සාමාජික
3. ප්‍රාදේශීය අධ්‍යක්ෂ, ටෝස්ට්මාස්ටර් ඉන්ටර්නැෂනල්, H3 කලාපය, H කොට්ඨාසය, 82 දිස්ත්‍රික්කය
4. ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලයේ, කෘෂිකර්ම පීඨයේ, පීඨාධිපති මණ්ඩලයේ බාහිර සාමාජික

**ඉංජි. එච්.එම්.ඒ.පී. රත්නායක මහතා**

1. කෘෂිකාර්මික හා වැවිලි ඉන්ජිනේරු ආංශික කමිටුවේ සාමාජික
2. වී සහ සහල් සඳහා ප්‍රමිති සම්පාදනය කිරීම සඳහා වන ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනයේ කෘත්‍යාධිකාරී කමිටුවේ සාමාජික
3. කෘෂිකාර්මික යාන්ත්‍රිකරණය සඳහා ප්‍රතිපත්ති සකස් කිරීමේ ජාතික කමිටුවේ සාමාජික

**ආචාර්ය නිලන්ති විජේවර්ධන මහත්මිය**

1. ශ්‍රී ලංකා YSF (තරුණ විද්‍යාඥ සංසදයේ) මෙහෙයුම් කමිටු සාමාජික
2. ගස්ලබු සඳහා ප්‍රමිති සම්පාදනය කිරීම සඳහා වන ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනයේ කෘත්‍යාධිකාරී කමිටුවේ සාමාජික

## 11. පඅතාආ කාර්ය මණ්ඩලයේ වෘත්තිය සංවර්ධනය

2016 වර්ෂය තුළදී පඅතාආ පර්යේෂණ සහ පුහුණු කාර්ය මණ්ඩලයේ පහත නම් සඳහන් නිලධාරීන් පසු අස්වනු තාක්ෂණය හා සම්බන්ධ ක්ෂේත්‍රයන්හි පුහුණුව ලබා ඇත:

### a) පශ්චාත් උපාධි වැඩසටහන් (සම්පූර්ණ කර ඇත)

| | |
|---|---|
| කේ.ජී.එල්.ආර්. ජයතුංග මිය<br>පර්යේෂණ නිලධාරී | ආහාර විද්‍යාව සහ තාක්ෂණය පිළිබඳ ආචාර්ය උපාධිය<br>ක්වීන්ස් යුනිවර්සිටි,<br>බෙල්ෆාස්ට්,<br>එක්සත් රාජධානිය. |

### b) පශ්චාත් උපාධි වැඩසටහන් (සිදු කරගෙන යමින් පවතී)

| | |
|---|---|
| ආර්.එම්.ආර්.කේ. රත්නායක මිය<br>පර්යේෂණ නිලධාරී | ශාක විද්‍යාව පිළිබඳ ආචාර්ය උපාධිය<br>පශ්චාත් උපාධි ආයතනය (PGIS)<br>පේරාදෙණිය විශ්වවිද්‍යාලය |
| ඩී.එම්.එස්.පී. බණ්ඩාර මහතා | ජෛව පද්ධති ඉංජිනේරු විද්‍යාව<br>පශ්චාත් උපාධි ආයතනය (PGIS)<br>පේරාදෙණිය විශ්වවිද්‍යාලය |

31

| | |
|---|---|
| ටී.එම්.ආර්. දිසානායක මහතා | ජෛව පද්ධති ඉංජිනේරු විද්‍යාව<br>පශ්චාත් උපාධි ආයතනය (PGIS)<br>පේරාදෙණිය විශ්වවිද්‍යාලය |

## 12. 2016 දෙසැම්බර් මස 31 වැනි දිනට කාර්ය මණ්ඩල තත්ත්වය

| තනතුර | නම |
|---|---|
| අධ්‍යක්ෂ (2016.05.30 දක්වා) | ආචාර්ය බී.එම්.කේ.එස්. තිලකරත්න මිය<br>BSc.Sp.(Agric. Food Sci.& Tech.) Sri Lanka<br>MSc.(Food Sci.& Tech.), Sri Lanka<br>PhD.( Postharvest Tech. Horticulture), India<br>Dip.in rice sciences(China)<br>Dip.in Post harvest biology of fruit and veg.(Israel) |
| අධ්‍යක්ෂ (වැඩබලන)<br>(2016.06.18 සිට) | ඉංජි. ටී.එම්.ආර්. දිසානායක මහතා<br>BSc. (Eng.), Sri Lanka<br>MEng.(India), C.Eng. (Sri Lanka) |
| අතිරේක අධ්‍යක්ෂ (R&TT)<br>(2016.04.30 දක්වා) | ඩී.පී.සී. ස්වර්ණසිරි මහතා<br>BSc. (Agric), Sri Lanka<br>Dip. in Agric.(China)<br>MSc. (Agric), Sri Lanka<br>PGDM, Sri Lanka |
| අතිරේක අධ්‍යක්ෂ (R&TT)<br>( 2016.12.30 දන්වා වැඩබලන ) | ඩී.පී. සේනානායක මිය<br>B.Sc. Mech. Eng. (Sri Lanka)<br>M. Phil.Chem. Eng (Sri Lanka)<br>C. Eng (IESL) |
| අතිරේක අධ්‍යක්ෂ (පරිපාලන සහ මුදල්) | ආර්.කේ.ජේ.පී. රාමනායක මහතා<br>B.Sc. Management (Sri Lanka), Licentiate Certificate<br>ICA, MIPFDA |
| ප්‍රධාන යාන්ත්‍රික ඉංජිනේරු | ඩී.පී. සේනානායක මිය<br>B.Sc. Mech. Eng. (Sri Lanka)<br>M. Phil.Chem. Eng (Sri Lanka)<br>AM(IESL) |
| ජ්‍යෙෂ්ඨ යාන්ත්‍රික ඉංජිනේරු<br>(ඉංජිනේරු අංශ ප්‍රධානී) | එච්.එම්.ජේ.පී. රත්නායක මහතා<br>B.Sc. Prod. Eng. (Sri Lanka)<br>M.Tech in Agriculture process Engineering (INDIA)<br>C.Eng(IESL) |
| ජ්‍යෙෂ්ඨ පර්යේෂණ නිලධාරි | ආචාර්ය ඩී.එම්.සී.සී ගුණතිලක මහතා<br>BSc.Sp.(Agric.Eng), Sri Lanka<br>MSc. (Agric. Eng.), Sri Lanka<br>PhD. (Process & Food Eng.), India<br>NDT (Agric), Sri Lanka, ASAE (USA) |

| | |
|---|---|
| ජ්‍යෙෂ්ඨ පර්යේෂණ නිලධාරි<br>(සැලසුම් හා අධීක්ෂණ අංශ ප්‍රධානී) | ආචාර්ය ඩබ්ලිව්.ඒ.එච්. චම්පා මිය<br>BSc. Sp. (Horticulture), Sri Lanka<br>M.Phil (Crop Sci.), Sri Lanka<br>Ph.D. (Fruit Science),India |
| පර්යේෂණ නිලධාරි<br>(සංවර්ධන ව්‍යාපෘති ප්‍රධානී) | ඩබ්ලිව්.එම්.සී.බී. වාසල මහතා<br>B.Sc. Sp. Agric. (Sri Lanka) |
| යාන්ත්‍රික ඉංජිනේරු | බී.ඩී.එම්.පී. බණ්ඩාර දිසානායක මහතා<br>BSc. (Eng.) Sri Lanka,<br>M.Eng.(Processing & Food Eng.) India, AMIE (Sri Lanka) |
| පර්යේෂණ නිලධාරි | කේ.ජී.එල්.ආර්. ජයතුංග මිය<br>B.Sc. Sp. Agric. (Sri Lanka)<br>M.Phill. Food Sci.& Tech. (Sri Lanka) |
| පර්යේෂණ නිලධාරි | ආර්.එම්.ආර්.එන්.කේ. රත්නායක මිය<br>BSc.Sp. (Botany), Sri Lanka<br>MSc. (Postharvest Tech. of Fruit & Vegetables), Sri Lanka |
| ජ්‍යෙෂ්ඨ පර්යේෂණ නිලධාරි<br>(පර්යේෂණ අංශ ප්‍රධානී) | ආචාර්ය ආර්.එම්.එන්.ඒ. විජේවර්ධන මිය<br>BSc. (Agric.) Sri Lanka,<br>MSc. (Agric.) Sri Lanka,<br>MPhil. (Food Technology), Sri Lanka<br>PhD. (Horticulture, postharvest Technology), India |
| පර්යේෂණ නිලධාරි | සී.ආර්. ගුණවර්ධන මහතා<br>B.Sc. Special Chemistry (Sri Lanka) |
| ජ්‍යෙෂ්ඨ යාන්ත්‍රික ඉංජිනේරු | ටී.එම්.ආර්. දිසානායක මහතා<br>BSc. (Eng.), Sri Lanka<br>MEng.(India), C.Eng. (Sri Lanka) |
| පර්යේෂණ නිලධාරි | එච්.එස්. ජයවර්ධන මිය<br>BSc. (Applied Sci.), Sri Lanka.<br>MSc. (Food Sci. & Tech.) |
| ව්‍යාප්ති නිලධාරි | පී.ජී. ලලිත් වසන්ත මහතා<br>B.Sc. Sp.Agric. (Sri Lanka) |
| ව්‍යාප්ති නිලධාරි<br>(ව්‍යාප්ති අංශ ප්‍රධානී) | සී.ඒ.කේ. දිසානායක මිය<br>B.Sc.Sp. Agric. (Sri Lanka)<br>PGDipl. Agric.(Sri Lanka) |
| යාන්ත්‍රික ඉංජිනේරු | ඩී.එම්. ශ්‍රීමා ප්‍රියංගිකා බණ්ඩාර මිය<br>B.Sc. Chem. Eng.(Sri Lanka),<br>MEng Manf. Syst. Eng (Sri Lanka)<br>C.Eng(IESL) |
| ව්‍යාප්ති නිලධාරි | එම්.එම්. හේරත් මහතා<br>B.Sc Sp. Agric. ( Sri Lanka), Dip. in Counselling |

| | |
|---|---|
| පර්යේෂණ නිලධාරි | යූ.ජී. චන්ද්‍රජිත් මහතා<br>B.Sc.(Sp.)Botany<br>MSc.Food Sc.& Tech |
| ගණකාධිකාරි<br>(ප්‍රධානී, ගිණුම් අංශය) | අයි.එම්.එම්.එන්.පී. ඉලංගසිංහ මහතා<br>B.Com(Sp.) |
| පරිපාලන නිලධාරි | ජානක සුබසිංහ මහතා |
| ජ්‍යෙෂ්ඨ රසායනාගාර තාක්ෂණවේදී | පී.ඊ.එම්.ආර්. පලිපාන මහතා |
| සභාපතිවරයාගේ පෞද්ගලික සහකාර | එච්.ඩී.කේ.ඩී. වික්‍රමසිංහ මිය |

**සහායක කාර්ය මණ්ඩලය:**

| | |
|---|---|
| කාර්මික නිලධාරි | 01 |
| සැලසුම්කරු | 01 |
| ගොඩනැගිලි පරීක්ෂක | 01 |
| කළමනාකරණ සහකාර (ලඝුලේඛක/යතුරු ලේඛක) | 01 |
| කළමනාකරණ සහකාර (සිංහල/ ඉංග්‍රීසි යතුරු ලේඛක) | 03 |
| ක්ෂේත්‍ර නිලධාරි | 03 |
| රසායනාගාර සහායක | 03 |
| කළමනාකාර සහායක | 08 |
| නේවාසිකාගාර භාරකරු | 01 |
| පැස්සුම්කරු | 01 |
| කාර්මික ශිල්පි | 01 |
| විදුලි කාර්මික | 01 |
| සහල් මෝල් ක්‍රියාකරු | 02 |
| බොයිලේරු ක්‍රියාකාරු | 02 |
| රියදුරු | 08 |
| වැඩපොළ ක්‍රියාකරු | 01 |
| නඩත්තු සහායක | 05 |
| සූපවේදී | 01 |
| ආරක්ෂක නියාමක | 06 |
| රෝනියෝ යන්ත්‍ර ක්‍රියාකරු | 01 |
| ආපනශාලා කම්කරු | 01 |
| සේවා සහායක | 01 |
| සනීපාරක්ෂක කම්කරු | 01 |

ආයතනයේ සියලුම ගිණුම් ආයතනයේ අභ්‍යන්තර විගණකවරයා විසින් සහ කෘෂිකර්ම අමාත්‍යාංශයේ සහ විගණකාධිපති දෙපාර්තමේන්තුවේ විගණන නිලධාරින් විසින් විගණනය කරනු ලැබේ.

## පශ්චාත් අස්වැන්න පිළිබඳ තාක්ෂණ ආයතනය
## 2016 දෙසැම්බර් 31 වැනි දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය

| | සටහන් | 2016 රු. | 2015 රු. |
|---|---|---|---|
| **වත්කම්** | | | |
| **දේපල පිරියත සහ යන්ත්‍රෝපකරණ** | 6 | 147,286,980.78 | 145,085,299.74 |
| ආයෝජන | 7 | 30,000,000.00 | 50,000,000.00 |
| අස්පෘශ්‍ය වත්කම් | 8 | 7,840.00 | 7,840.00 |
| වෙනත් ජංගම නොවන වත්කම් | 9 | 10,182,986.29 | 10,177,402.96 |
| **මුළු ජංගම නොවන වත්කම්** | | **187,477,807.07** | **205,270,542.70** |
| **ජංගම වත්කම්** | | | |
| මුදල් හා මුදල් හා සමාන දෑ | 10 | 29,803,950.91 | 11,937,789.71 |
| ලැබිය යුතු දෑ | 11 | 2,612,360.26 | 1,807,472.89 |
| ඉන්වෙන්ටරි | 12 | 1,181,080.20 | 1,035,383.00 |
| අත්තිකාරම් | 13 | 208,021.50 | 470,314.36 |
| වෙනත් ජංගම වත්කම් | 14 | 675.00 | 675.00 |
| **මුළු ජංගම වත්කම්** | | **33,806,087.87** | **15,251,634.96** |
| **මුළු වත්කම්** | | **221,283,894.94** | **220,522,177.66** |
| **සමකොටස් සහ බැරකම්** | | | |
| **සමකොටස්** | 15 | | |
| මූලික ප්‍රාග්ධනය | | 69,907,594.42 | 69,907,594.42 |
| රජයේ ප්‍රදාන | | 8,368,214.00 | 8,368,214.00 |
| විදේශ ණය | | 72,750,229.02 | 72,750,229.02 |
| මහා භාණ්ඩාගාර අරමුදල - ප්‍රාග්ධනය | | 105,910,250.00 | 100,910,250.00 |
| සමුච්චිත අතිරික්තය / (ඌනතාවය) | | (81,238,009.36) | (83,325,347.91) |
| **මුළු සමකොටස්** | | **175,698,278.08** | **168,610,939.53** |
| **බැරකම්** | | | |
| **ජංගම නොවන බැරකම්** | | | |
| පාරිතෝෂික අරමුදල සඳහා වෙන්කිරීම් | 16 | 28,198,189.00 | 27,606,601.15 |
| **මුළු ජංගම නොවන බැරකම්** | | **28,198,189.00** | **27,606,601.15** |
| **ජංගම බැරකම්** | | | |
| ගෙවිය යුතු දෑ | 17 | 17,387,427.86 | 24,304,636.98 |
| **මුළු ජංගම බැරකම්** | | **17,387,427.86** | **24,304,636.98** |
| **මුළු බැරකම්** | | **45,585,616.86** | **51,911,238.13** |
| **මුළු සමකොටස් සහ බැරකම්** | | **221,283,894.94** | **220,522,177.66** |

*ගිණුම් ප්‍රතිපත්ති සහ පිටු අංක 05 සිට 19 දක්වා සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනවල ඒකාබද්ධ කොටසකි.*

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට (SLPSAS) අනුකූලව සකස් කර ඇත.

.........................................

අයි.එම්.එන්.පී. ඉලංගසිංහ

ගණකාධිකාරී

මෙම ගිණුම් ප්‍රකාශන සකස් කිරීම සහ ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලය වග කියනු ලැබේ.

මෙම ගිණුම් ප්‍රකාශන අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කර ඇති අතර ඔවුන් වෙනුවෙන් අත්සන් කර ඇත.

| | |
|---|---|
| ......................................... | ......................................... |
| කවින්ද සී. දිසානායක | ටී.එම්.ආර්. දිසානායක |
| සභාපති | අධ්‍යක්ෂ/ප්‍රවීනි (වැ.බ.) |

**පශ්චාත් අස්වැන්න පිළිබඳ තාක්ෂණ ආයතනය**

**2016 දෙසැම්බර් මස 31 වැනි දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශනය**

| | සටහන් | 2016<br>රු. | 2015<br>රු. |
|---|---|---|---|
| **ආදායම** | | | |
| මහා භාණ්ඩාර අරමුදල - පුනරාවර්තන | 18 | 94,750,000.00 | 85,139,000.00 |
| වෙනත් නියෝජිතායතනවලින් මාරු කිරීම් | 19 | 23,496,846.83 | 966,239.64 |
| වෙනත් ආදායම් | 20 | 8,595,729.55 | 9,670,344.47 |
| **මුළු ආදායම** | | **126,842,576.38** | **95,775,584.11** |
| | | | |
| **වියදම්** | | | |
| වේතන, වැටුප් සහ සේවක ප්‍රතිලාභ | 21 | 74,303,636.99 | 75,273,448.04 |
| භාවිතා කළ සැපයුම් සහ පාරිභෝගික ද්‍රව්‍ය | 22 | 12,992,082.47 | 11,930,151.55 |
| ක්ෂයවීම් සහ ක්‍රමක්ෂය වියදම් | 23 | 16,427,755.10 | 17,877,156.51 |
| වෙනත් වියදම් | 24 | 32,587,936.34 | 9,065,272.06 |
| මූල්‍ය පිරිවැය | 25 | 37,611.64 | 33,307.23 |
| **මුළු වියදම්** | | **136,349,022.54** | **114,179,335.39** |
| **කාල පරිච්ඡේදය සඳහා අතිරික්තය/(ඌනතාවය)** | | **(9,506,446.16)** | **(18,403,751.28)** |

*ගිණුම් ප්‍රතිපත්ති සහ පිටු අංක 05 සිට 19 දක්වා සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනවල ඒකාබද්ධ කොටසකි.*

## පශ්චාත් අස්වැන්න පිළිබඳ තාක්ෂණ ආයතනය

## 2016 දෙසැම්බර් මස 31 වැනි දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා මූල්‍ය ප්‍රවාහ ප්‍රකාශනය

| | සටහන් | 2016<br>රු. | 2015<br>රු. |
|---|---|---|---|
| **මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් මුදල් ප්‍රවාහය** | | | |
| අතිරික්තය/(ඌනතාවය) | | (9,506,446.16) | (18,403,751.28) |
| **මුදල් නොවන ගැලීම්** | | | |
| ක්‍රමක්ෂය | | 16,427,755.10 | 17,877,156.51 |
| සමුච්චිත අතිරික්තය සඳහා ගැලපීම් කිරීම හරහා බලපෑම | | - | 16,381,887.69 |
| පොලී ආදායම | 20.8 | (2,862,095.29) | (3,785,485.90) |
| ගෙවිය යුතු දෑවල වැඩිවීම/(අඩුවීම) | 27 | (6,917,209.12) | 1,627,812.39 |
| පාරිතෝෂික අරමුදල සඳහා වෙන්කිරීම්වල වැඩිවීම/(අඩුවීම) | 28 | 591,587.85 | |
| වෙනත් ජංගම වත්කම්වල (වැඩිවීම)/අඩුවීම | 29 | (688,291.71) | 5,178,101.05 |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ශුද්ධ මූල්‍ය ප්‍රවාහය** | | **(2,954,699.33)** | **18,875,720.46** |
| **ආයෝජන ක්‍රියාකාරකම්වලින් මුදල් ප්‍රවාහය** | | | |
| දේපල, පිරියත සහ යන්ත්‍රෝපකරණ මිලදී ගැනීම | 30 | (7,035,651.43) | (83,732,528.71) |
| ජංගම නොවන වත්කම්වල (වැඩිවීම)/අඩුවීම | 31 | 19,994,416.67 | (273,903.89) |
| ලැබූ ශුද්ධ පොලිය | 20.8 | 2,862,095.29 | 3,785,485.90 |
| **ආයෝජන ක්‍රියාකාරකම්වලින් ශුද්ධ මූල්‍ය ප්‍රවාහය** | | **15,820,860.53** | **(80,220,946.70)** |
| **මූල්‍ය ක්‍රියාකාරකම්වලින් මූල්‍ය ප්‍රවාහය** | | | |
| මහා භාණ්ඩාගාරයෙන් ලැබූ ප්‍රාග්ධනය | | 5,000,000.00 | 70,401,000.00 |
| **මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ශුද්ධ මූල්‍ය ප්‍රවාහය** | | **5,000,000.00** | **70,401,000.00** |
| **මුදල් හා සමාන දෑ වල ශුද්ධ වැඩිවීම/(අඩුවීම)** | | **17,866,161.20** | **9,055,773.76** |
| **කාල පරිච්ඡේදය ආරම්භයේදී මුදල් හා මුදල් හා සමාන දෑ** | 32 | **11,937,789.71** | **2,882,015.95** |
| **කාල පරිච්ඡේදය අවසානයේදී මුදල් හා මුදල් හා සමාන දෑ** | 33 | **29,803,950.91** | **11,937,789.71** |

*ගිණුම් ප්‍රතිපත්ති සහ පිටු අංක 05 සිට 19 දක්වා සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනවල ඒකාබද්ධ කොටසකි.*

## පශ්චාත් අස්වැන්න පිළිබඳ තාක්ෂණ ආයතනය

## 2016 දෙසැම්බර් මස 31 වැ වැනි දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා සමකොටස් වෙනස්වීම පිළිබඳ ප්‍රකාශනය

| පාලන ආයතනයේ හිමිකරුවන්ට ආරෝපණය කළ හැකි | ආරම්භක ප්‍රාග්ධනය | රජයේ ප්‍රදාන | විදේශ ණය | මහා භාණ්ඩාගාරයෙන් ලැබූ අරමුදල් | සමුච්චිත අතිරික්තය/(ඌනනය) | මුළු ශුද්ධ වත්කම් |
|---|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| 2015, දෙසැ.31 ට ඉ/ගෙ/ශේ. | 69,907,594.42 | 8,368,214.00 | 72,750,229.02 | 100,910,250.00 | (83,325,347.91) | 168,610,939.53 |
| | | | | | | |
| 2016 වර්ෂය සඳහා ශුද්ධ වත්කම්වල වෙනස්වීම | | | | | | - |
| භාණ්ඩාගාරයෙන් ලැබුනු ප්‍රාග්ධනය | | | | 5,000,000.00 | | 5,000,000.00 |
| සමුච්චිත අතිරික්තයේ වෙනස්වීම | | | | | 11,593,784.71 | 11,593,784.71 |
| කාලපරිච්ඡේදය සඳහා අතිරික්තය/(ඌනනය) | | | | | (9,506,446.16) | (9,506,446.16) |
| 2016 දෙසැම්බර් 31 දිනට ශේෂය | 69,907,594.42 | 8,368,214.00 | 72,750,229.02 | 105,910,250.00 | (81,238,009.36) | 175,698,278.08 |

*ගිණුම් ප්‍රතිපත්ති සහ පිටු අංක 05 සිට 19 දක්වා සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනවල ඒකාබද්ධ කොටසකි.*

1. වාර්තාකරණ ආයතනය

1.1 සංයුක්ත තොරතුරු

පශ්චාත් අස්වැන්න පිළිබඳ තාක්ෂණ ආයතනය 1972 අංක 11 දරන කෘෂිකර්ම සංස්ථා පනතේ විධිවිධාන යටතේ 1137/10 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශේෂ ගැසට් පත්‍රය මඟින් 2000 ජූනි 19 වන දින පිහිටුවන ලද සංස්ථාපිත ආයතනයකි.

1.2 ප්‍රධාන කටයුතු සහ මෙහෙයුම්වල ස්වභාවය

ආයතනය විසින් ධාන්‍ය, මාෂභෝග, තෙල් භෝග, වෙනත් ක්ෂේත්‍ර භෝග, පලතුරු, එළවළු සහ කුළුබඩු භෝග පිළිබඳ පසු අස්වනු පර්යේෂණ හා සංවර්ධන කටයුතු සිදු කරයි.

1.3 අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මූල්‍ය ප්‍රකාශන අනුමත කිරීම

ආයතනයේ මූල්‍ය ප්‍රකාශන නිකුත් කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය විසින් බලය ලබා දී ඇත.

2. සකස් කිරීමේ පදනම

2.1 අනුකූලවීමේ ප්‍රකාශනය

ආයතනයේ මූල්‍ය ප්‍රකාශන රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතවලට (SLPSAS) අනුකූලව සකස් කර ඉදිරිපත් කර ඇත.

2.2 මූල්‍ය ප්‍රකාශනවල වගකීම

ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අනුව ආයතනයේ මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම සහ සාධාරණ කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය විසින් වගකීම දරයි.

ආයතනයේ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේදී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙම වගකීම පිළිගනී.

2.3 ඇගයීමේ පදනම

මෙම මූල්‍ය ප්‍රකාශන ඓතිහාසික පිරිවැය පදනමින් සකස් කර ඇත.

2.4 ක්‍රියාකාරී සහ ඉදිරිපත් කිරීමේ මුදල් වර්ගය

වෙනත් ආකාරයකින් දක්වා නොමැති විට මූල්‍ය ප්‍රකාශන ආයතනයේ ක්‍රියාකාරී හා ඉදිරිපත් කිරීමේ මුදල් වර්ගය වන ශ්‍රී ලංකා රුපියල්වලින් ඉදිරිපත් කර ඇත.

**2.5 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

එහි මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ ඉදිරිපත් කර ඇති ආයතනය සතු වත්කම් හා බැරකම් ස්වභාවය අනුව කාණ්ඩගත කර ඒවායේ සාපේක්ෂ ද්‍රවශීලතාව හා කල්පිරීම පිළිබිඹු කරන ආකාරයකින් ලැයිස්තුගත කර ඇත. මූල්‍ය ප්‍රකාශන සඳහා බලපෑම් ඇති කරනු ලබන උද්ධමන සාධක සඳහා කිසිදු ගැලපීමක් සිදු කර නොමැත.

**2.6 අදාළත්වය සහ සමූහනය**

සමාන අයිතමවල එක් එක් ද්‍රව්‍ය වර්ගය මූල්‍ය ප්‍රකාශනවල වෙන වෙනම ඉදිරිපත් කරනු ලැබේ. ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත SLPSAS 1 “මූල්‍ය ප්‍රකාශනය ඉදිරිපත් කිරීම” ට අනුව ඒවා නොවැදගත් බවට දක්වා ඇත්නම් මිස නොගැලපෙන ස්වභාවයේ අයිතම හෝ කාර්යයන් වෙන වෙනම ඉදිරිපත් කෙරේ

**2.7 හිලව් කිරීම**

ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති මඟින් අවසර ලබා දී නොමැති නම් මිස වත්කම් හා බැරකම්, ආදායම් සහ වියදම් හිලව් කිරීම සිදු කළ නොහැක.

**2.8 සැලකිය යුතු ගිණුම්කරණ තීරණ, ඇස්තමේන්තු සහ උපකල්පන**

**2.8.1 අඛණ්ඩ පැවැත්ම**

ආයතනයේ අඛණ්ඩ පැවැත්ම සම්බන්ධයෙන් එහි කළමනාකාරිත්වය විසින් තක්සේරුවක් කර ඇති අතර ප්‍රත්‍යාසන්න අනාගතය සඳහා එහි මෙහෙයුම් පවත්වාගෙන යෑම සඳහා සම්පත් පවතින බවට සෑහීමට පත්ව ඇත. තවද, අඛණ්ඩ පැවැත්මක් ලෙස ඉදිරියට යෑමේ ආයතනයට ඇති හැකියාව සම්බන්ධයෙන් සැලකිය යුතු අවිනිශ්චිතතාවයක් සම්බන්ධයෙන් කළමනාකරණය දැනුම්වත් වී නොමැත. එබැවින් අඛණ්ඩව පැවතීමේ පදනම මත මූල්‍ය ප්‍රකාශනයන් අඛණ්ඩව සකස් කරගෙන යනු ලැබේ.

**2.8.2 දේපල, පිරියත සහ යන්ත්‍රෝපකරණවල ප්‍රයෝජ්‍ය ජීව කාලය**

දේපල, පිරියත සහ යන්ත්‍රෝපකරණවල ප්‍රයෝජ්‍ය ආර්ථික ජීව කාලය, මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් අංක 3.1 හි අනාවරණය කර ඇති ආකාරයට ඇස්තමේන්තු කරනු ලැබේ.

**3. සැලකිය යුතු ගිණුම්කරණ ප්‍රතිපත්ති - වත්කම් සහ බැරකම් හඳුනාගැනීම**

අන්‍යාකාරයකින් දක්වා ඇතොත් මිස පහත සඳහන් කර ඇති ගිණුම්කරණ ප්‍රතිපත්ති ආයතනයේ මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කර ඇති සියලු කාල පරිච්ඡේද සඳහා නිත්‍ය වශයෙන් යොදාගෙන ඇත. තවද, ආනුෂංගික වර්ෂයේ තොරතුරුද ඉදිරිපත් කර ඇත.

**3.1 දේපල, පිරියත සහ යන්ත්‍රෝපකරණ**

දේපල, පිරියත සහ යන්ත්‍රෝපකරණ භාණ්ඩ හෝ සේවාවන් නිෂ්පාදනය කිරීම හෝ සැපයීම සඳහා, අන් අය සඳහා කුලියට ලබා දීම හෝ පරිපාලන කටයුතු සඳහා භාවිතා කරනු ලබන ස්පෘශ්‍ය අයිතමයන් වන අතර එක් කාලපරිච්ඡේදයකට වඩා වැඩි කාලයක් භාවිතා කිරීම අපේක්ෂා කරනු ලැබේ. මෙම වත්කම් ගිණුම්ගත කිරීමේදී ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති– SLPSAS 7 - "දේපල, පිරියත සහ යන්ත්‍රෝපකරණවල" අවශ්‍යතාවයන් ආයතනය විසින් යොදා ගනු ලැබේ.

හඳුනාගැනීමේ පදනම

වත්කම හා සම්බන්ධිත අනාගත ආර්ථික ප්‍රතිලාභ, සේවා විභවය ආයතනය වෙත ගලා එන්නේ නම් සහ එම වත්කමෙහි පිරිවැය විශ්වසනීය ලෙස මැනිය හැකි නම් දේපල, පිරියත සහ යන්ත්‍රෝපකරණ හඳුනාගනු ලැබේ.

ඇගයීම

වත්කමක් ලෙස හඳුනාගැනීම සඳහා සුදුසුකම් ලබන දේපල, පිරියත සහ යන්ත්‍රෝපකරණවල අයිතමයක් ආරම්භයේදී එහි පිරිවැයට අගයනු ලැබේ. වත්කම අත්පත් කර ගැනීම සඳහා සෘජුව ආරෝපණය කළ වියදම පිරිවැයට ඇතුලත් වේ. ස්වයං-ඉදිකිරීම් වත්කම්වල පිරිවැය සඳහා ද්‍රව්‍ය සහ සෘජු ශ්‍රම පිරිවැය, එමඟින් අපේක්ෂිත භාවිතය සඳහා වත්කම ක්‍රියාකාරී තත්ත්වයට පත් කිරීම සඳහා සෘජුව ආරෝපණය කළ හැකි වෙනත් පිරිවැය සහ අයිතම කොටස්වලට වෙන් කිරීම සහ ඉවත් කිරීම සහ ඒවා ස්ථානගත කර තිබූ වැඩපොළ යථා තත්ත්වයට පත් කිරීම සඳහා දරන ලද පිරිවැය ඇතුලත් වේ. අදාළ උපකරණවල ක්‍රියාකාරීත්වයට අනුබද්ධිත මිලදී ගත් මෘදුකාංග, පරිගණක උපකරණයක කොටසක් ලෙස ප්‍රාග්ධනීකරණය කර කර ඇත. දේපල, පිරියක සහ යන්ත්‍රෝපකරණයක කොටස්වලට වෙනස් ප්‍රයෝජ්‍ය ජීව කාල පවතින විට, ඒවා වෙනස් අයිතම (ප්‍රධාන සංරචක) ලෙස ගිණුම්ගත කරනු ලැබේ.

පිරිවැය ආකෘතිය

සියලු දේපල, පිරියත හා යන්ත්‍රෝපකරණ සඳහා ආයතනය විසින් පිරිවැය ආකෘතියක් යොදා ගනු ලබන අතර සමුච්චිත ක්‍රමක්ෂය අඩුකිරීම ඒ හා සමබන්ධ කවර හෝ අනුෂංගික වියදම් සමඟ මිලදී ගැනීමේ හෝ ඉදිකිරීමේ පිරිවැයට වාර්තා කරනු ලැබේ. එවැනි පිරිවැය සඳහා පිළිගත් නිර්ණායක සපුරා ඇත්නම්, කොටසක් ප්‍රතිස්ථාපනය කිරීම සඳහා දරා ඇති වියදම ඇතුළත් වේ

තදනන්තර පිරිවැය

දේපල, පිරියත හා උපකරණවල අයිතමයක සංරචකයක් ප්‍රතිස්ථාපනය කිරීමේ තදනන්තර පිරිවැය, එම සංරචකය තුළ අන්තර්ගත අනාගත ආර්ථික ප්‍රතිලාභ ආයතනය වෙත ගලා එනු ඇතැයි අපේක්ෂා කරන විට සහ එය විශ්වසනීයව මැනිය හැකි වන විට අයිතමයක ධාරණ වටිනාකමෙහි හඳුනාගනු ලැබේ. දේපල, පිරියත සහ යන්ත්‍රෝපකරණවල එදිනෙදා සේවා සැපයීමේ පිරිවැය දරන ලද වියදමක් ලෙස මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයට ඇතුලත් කරනු ලැබේ. අයිතමයක් භාවිතා කිරීම හෝ නැවත සංවර්ධනය කිරීම සඳහා දරන ලද පිරිවැය අයිතමය ධාරණ වටිනාකම යටතට ඇතුලත් කරනු නොලැබේ.

**ක්ෂයවීම**

මෙම ක්‍රමය මඟින් වත්කමෙහි අන්තර්ගත අනාගත ප්‍රතිලාභ පරිභෝජනය කිරීමේ අපේක්ෂිත රටාව වඩාත් ආසන්නව පිළිබිඹු කරනු ලබන බැවින් දේපල, පිරියත සහ යන්ත්‍රෝපකරණ අයිතමයක එක් එක් කොටසක ඇස්තමේන්තුගත ප්‍රයෝජ්‍ය ජීව කාලය තුළ ක්ෂයවීම් සෘජු-රේඛා පදනම මත ලාභ අලාභ ප්‍රකාශනයෙහි හඳුනාගනු ලැබේ. සින්නකර ඉඩම් ක්‍රමක්ෂය කරනු නොලැබේ. ඇස්තමේන්තුගත ප්‍රයෝජ්‍ය ජීව කාලයන් පහත පරිදි වේ:

| වත්කම් කාණ්ඩය | කාල පරිච්ඡේදය |
|---|---|
| ගොඩනැගිලි | වර්ෂ 40 |
| දේපල හා යන්ත්‍රසූත්‍ර | වර්ෂ 13.3 |
| කාර්යාල උපකරණ | වර්ෂ 10 |
| රසායනාගාර සහ පර්. උපකරණ | වර්ෂ 10 |
| වෙනත් උපකරණ | වර්ෂ 10 |
| ගෘහභාණ්ඩ | වර්ෂ 10 |
| විදුලි සහවෙනත් සවිකිරීම් | වර්ෂ 10 |
| පුස්තකාල පොත් | වර්ෂ 10 |
| පරිගණක සහ උපාංග | වර්ෂ 4 |
| දුරකථන සහ සවිකිරීම් | වර්ෂ 5 |
| වාහන | වර්ෂ 5 |
| කෘෂි-ගොවිපොළ | වර්ෂ 4 |

**3.2 වාර්තාකරණ කාලපරිච්ඡේදයට පසුව සිදුවන සිදුවීම්**

වාර්තාකරණ කාලපරිච්ඡේදයෙන් පසු සිදුවීම් යනු වාර්තාකරණ දිනය සහ මූල්‍ය ප්‍රකාශන නිකුත් කිරීම සඳහා බලය ලබා දෙන දිනය අතර සිදුවන හිතකර හා අහිතකර සිදුවීම් වේ. මේ සම්බන්ධයෙන් වාර්තාකරණ කාලපරිච්ඡේදයට පසුව සිදු වූ සියලු ප්‍රධාන සහ වැදගත් සිදුවීම් සලකා බලා ඇති අතර අවශ්‍ය තැන්වලදී මූල්‍ය ප්‍රකාශනවල යෝග්‍ය අනාවරණය කිරීම් සිදු කර ඇත.

ඉන්වෙන්ට්‍රි

ඉන්වෙන්ටරි පිරිවැය අඩුකර සහ ශුද්ධ උපලබ්ධි වටිනාකමට අගයනු ලැබේ. පිරිවැය පෙර පිවිසි පෙර නිකුත් පදනමින් නිශ්චය කරනු ලබන අතර ඉන්වෙන්ටරි අත්පත් කර ගැනීමේ පිරිවැය සහ ඒවා පවතින ස්ථානයට සහ තත්ත්වයට ගෙන ඒම සඳහා දරන ලද වියදම ඇතුලත් වේ.

**3.4 සේවක ප්‍රතිලාභ**

**අර්ථ දැක්වූ දායකත්ව සැලසුම් - සේවා නියුක්තයන්ගේ අර්ථසාධක අරමුදල සහ සේවක භාරකාර අරමුදල.**

සේවා නියුක්තයන්ගේ අර්ථසාධක අරමුදලේ දායකත්වය සහ සේවක භාරකාර අරමුදලේ දායකත්වය සඳහා සුදුසුකම් ලැබූ සේවකයන් අදාල ප්‍රඥප්ති සහ නියාමනයන්ට අනුකූලව දායකත්ව අරමුදල් මඟින් ආවරණය කරනු ලැබේ. සේවා නියුක්තයන්ගේ අර්ථසාධක අරමුදල සහ සේවක භාරකාර අරමුදල සඳහා පිළිවෙලින් සේවකයා විසින් 10%ක දායකත්වයක් සහ ආයතනය විසින් සේවකයාගේ දළ වැටුපෙන් 12% හා 3% ක දායකත්වයක් දක්වනු ලැබේ.

අර්ථ දැක්වූ ප්‍රතිලාභ සැලැසුම - පාරිතෝෂික
අර්ථ දැකවූ ප්‍රතිලාභ සැලැස්ම, ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත-LKAS 19 "සේවක ප්‍රතිලාභ" හි අර්ථකථනය කර ඇති පරිදි අර්ථ දැක්වූ දායකත්ව සැලැස්මකට වඩා පශ්චාත් විශ්‍රාම ප්‍රතිලාභ සැලැස්මකි. 1983 අංක 12 දරන විශ්‍රාම පාරිතෝෂික පනත යටතේ විශ්‍රාම ප්‍රතිලාභ ගෙවීමට ආයතනය බැඳී සිටී. සේවක ප්‍රතිලාභ බැරකමක් ලෙස වසර 5ක සේවා කාලයකින් පසු සියලු සේවකයන් සඳහා විශ්‍රාම ප්‍රතිලාභ වෙනුවෙන් මූල්‍ය ප්‍රකාශනවල වෙන්කිරීම් සිදු කර ඇත. සාමාන්‍යයෙන් සේවය කරන ලද වර්ෂ ගණන සහ වන්දි වැනි සාධක එකක් හෝ වැඩි ගණනක් මත රඳා පවතිමින් විශ්‍රාම ගැනීමේදී කිසියම් සේවකයෙකු ලබන ප්‍රතිලාභ ප්‍රමාණය පාරිතෝෂිත සැලැස්මෙන් අර්ථ දක්වනු ලැබේ. මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයෙහි සේවක ප්‍රතිලාභ බැඳීම සම්බන්ධයෙන් හඳුනාගනු ලබන බැරකම යනු හඳුනානොගත් පෙර සේවා පිරිවැය සඳහා ගැලපීම් සමඟින් වාර්තාකරණ දිනට අර්ථ දැක්වූ ප්‍රතිලාභ බැඳීමේ වර්තමාන වටිනාකම වේ. සේවක ප්‍රතිලාභ බැරකම වාර්ෂිකව ගණනය කෙරේ.

### 3.5 වෙන්කිරීම්
පෙර සිදුවීමක ප්‍රතිඵලයක් ලෙස ආයතනයට විශ්වසනීයව ඇස්තමේන්තු කළ හැකි වර්තමාන නීතිමය හෝ ප්‍රයෝජනවත් බැඳීමක් පවතින විට සහ එම බැඳීම නිරවුල් කිරීම සඳහා ආර්ථික ප්‍රතිලාභයක පිටතට ගැලීමක් අවශ්‍ය විය හැකි වන විට වෙන්කිරීම් හඳුනාගනු ලැබේ. වෙන්කිරීම සහ බැරකම් මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේදී හඳුනාගනු ලැබේ.

## 4. සැළකිය යුතු ගිණුම්කරණ ප්‍රතිපත්ති - ආදායම සහ වියදම

### 4.1 ආදායම හඳුනාගැනීම
ආයතනයට තුළට ආර්ථික ප්‍රතිලාභ ගලා එනු ඇති යැයි සලකනු ලබන ප්‍රමාණයට සහ එවැනි ආදායම් විශ්වසනීයව මැනිය හැකි වන විට ආදායම් හඳුනාගනු ලැබේ.

### 4.2 ණය ගැනීමේ පිරිවැය
සියලු ණයගැනීමේ පිරිවැය ඒවා සිදු වූ කාලයේ වියදමක් ලෙස දරනු ලැබේ. අරමුදල් ලබා ගැනීම සම්බන්ධයෙන් ආයතනය විසින් දරනු ලබන පොළිය සහ වෙනත් පිරිවැයවලින් ණයගැනීමේ පිරිවැය සමන්විත වේ.

### 4.3 බදු වියදම්
ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත-LKAS 12 "ආදායම් බදු", අනුව බදු වියදම් (බදු ආදායම) යනු වර්තමාන සහ විලම්භිත බදු සම්බන්ධයෙන් කාලපරිච්ඡේදය සඳහා ලාභය හෝ අලාභය නිශ්චය කිරීමේදී ඇතුලත් කරනු ලබන සමුච්චිත එකතුවයි. සමකොටස්වල හෝ වෙනත් විස්තීර්ණ ආදායම්වල එය හඳුනාගෙන ඇති විට, සමකොටස්වල හෝ වෙනත් විස්තීර්ණ ආදායම්වල සෘජුව හඳුනාගත් අයිතමවලට එය අදාළවල ප්‍රමාණයට හැර ආදායම් බදු වියදම් මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශනයෙහි හඳුනාගනු ලැබේ.

## 5. මූල්‍ය ප්‍රවාහ ප්‍රකාශනය
"මුදල් ප්‍රවාහ ප්‍රකාශනය", පිළිබඳ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත-LKAS 2 ට අනුකූලව 'වක්‍ර ක්‍රමවේදය' භාවිතා කරමින් මූල්‍ය ප්‍රවාහ ප්‍රකාශනය සකස් කර ඇත.

දේපල, පිරියත සහ යන්ත්‍රෝපකරණ

| විස්තරය | ගොඩනැගිලි | පිරියත සහ යන්ත්‍රසූත්‍ර | කාර්යාල උපකරණ | රසායනාගාර සහ පර්. උපකරණ | වෙනත් උපකරණ | ගෘහභාණ්ඩ | විදුලි සහ වෙනත් සවිකිරීම් | පුස්තකාල පොත් | පරිගණක සහ උපාංග | දුරකථන සහ සවිකිරීම් | වාහන | කෘෂි-ගොවිපොළ | එකතුව |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| කාල පරිච්ඡේදය ආරම්භයේදී ශේෂය | 115,510,658.31 | 52,849,959.73 | 4,085,183.50 | 84,508,885.61 | 570,865.00 | 11,463,438.62 | 1,438,605.37 | 1,481,078.55 | 7,373,701.06 | 483,497.66 | 41,285,413.82 | 1,253,934.22 | 322,305,221.45 |
| වර්ෂය තුළ එකතු කිරීම් | 862,774.00 | 2,875,676.85 | 654,780.00 | 5,918,048.21 | 4,002,272.50 | 858,325.58 | 99,849.00 | | 3,337,160.00 | 20,550.00 | | | 18,629,436.14 |
| වර්ෂය තුළ කපා හැරීම් | | | | | | | | | - | - | | - | - |
| **වර්ෂය අවසානයේදී ශේෂය** | **116,373,432.31** | **55,725,636.58** | **4,739,963.50** | **90,426,933.82** | **4,573,137.50** | **12,321,764.20** | **1,538,454.37** | **1,481,078.55** | **10,710,861.06** | **504,047.66** | **41,285,413.82** | **1,253,934.22** | **340,934,657.59** |
| සමුච්චිත ක්‍රමක්ෂය | | | | | | | | | | | | | |
| වර්ෂය ආරම්භයේදී ශේෂය | 44,940,508.02 | 51,462,343.23 | 2,715,550.67 | 26,211,295.61 | 319,948.98 | 9,505,702.09 | 1,275,774.69 | 1,368,120.19 | 6,662,088.56 | 443,253.63 | 31,061,401.82 | 1,253,934.22 | 177,219,921.71 |
| වර්ෂය සඳහා අයකිරීම් | 2,909,335.81 | 456,164.06 | 316,434.17 | 7,794,561.89 | 448,250.25 | 680,683.49 | 40,248.70 | 36,052.10 | 1,162,539.96 | 27,484.67 | 2,556,000.00 | | 16,427,755.10 |
| වර්ෂය තුළ කපා හැරීම් | | | | | | | | | - | - | | - | - |
| වර්ෂය අවසානයේදී ශේෂය | 47,849,843.83 | 51,918,507.29 | 3,031,984.84 | 34,005,857.50 | 768,199.23 | 10,186,385.58 | 1,316,023.39 | 1,404,172.29 | 7,824,628.52 | 470,738.30 | 33,617,401.82 | 1,253,934.22 | 193,647,676.81 |
| 2016 දෙසැම්බර් 31 වැනි දිනට ධාරණ වටිනාකම | 68,523,588.48 | 3,807,129.29 | 1,707,978.66 | 56,421,076.32 | 3,804,938.27 | 2,135,378.62 | 222,430.98 | 76,906.26 | 2,886,232.54 | 33,309.36 | 7,668,012.00 | - | **147,286,980.78** |

| | | 2016 (රු.) | 2015 (රු.) |
|---|---|---|---|
| 7 | **ආයෝජන - තැන්පතු** | | |
| | ජාතික ඉතිරිකිරීමේ බැංකුව 2- 0001- 20-90520 -කොල්ලුපිටිය | - | 10,000,000.00 |
| | ජාතික ඉතිරිකිරීමේ බැංකුව 2- 0001- 21-28152 -කොල්ලුපිටිය | - | 10,000,000.00 |
| | ජාතික ඉතිරිකිරීමේ බැංකුව 2- 0001- 21-28195 -කොල්ලුපිටිය | 10,000,000.00 | 10,000,000.00 |
| | ජාතික ඉතිරිකිරීමේ බැංකුව 2- 0001- 21-28187 -කොල්ලුපිටිය | 10,000,000.00 | 10,000,000.00 |
| | ජාතික ඉතිරිකිරීමේ බැංකුව 2- 0001-21-28179 -කොල්ලුපිටිය | 10,000,000.00 | 10,000,000.00 |
| | | **30,000,000.00** | **50,000,000.00** |
| 8 | හේමතිලකා ජයවර්ධන මහත්මිය විසින් නිපදවන ලද " සහල් පදනම් වූ ක්ෂණික සුප් කැට" නිෂ්පාදනය කිරීම සඳහා පේටන්ට් බලපත්‍රය | **7,840.00** | **7,840.00** |
| 9 | **වෙනත් ජංගම නොවන වත්කම්** | | |
| | සේවක ණය | 9,640,525.33 | 9,687,817.36 |
| | සේවක ණය - විශේෂ | 542,460.96 | 489,585.60 |
| | | **10,182,986.29** | **10,177,402.96** |
| 10 | **මුදල් සහ මුදල් හා සමාන දෑ** | | |
| | ලංකා බැංකුව - ටෝරින්ටන් ශාඛාව | 5,795,171.51 | 4,271,183.18 |
| | මහජන බැංකුව -අනුරාධපුර | 17,459,429.11 | 3,442,336.91 |
| | අත් මුදල් | 5,000.00 | 5,000.00 |
| | ජාතික ඉතිරිකිරීමේ බැංකුව 1- 0005- 04-9129-2-අනුරාධපුර | 766,106.46 | 700,085.52 |
| | ජාතික ඉතිරිකිරීමේ බැංකුව 1- 0001- 07-32087-කොල්ලුපිටිය | 5,778,243.83 | 3,519,184.10 |
| | | **29,803,950.91** | **11,937,789.71** |
| 11 | **ලැබිය යුතු දේ** | | |
| | ණයගැති පාලන ගිණුම | 491,927.39 | 735,617.39 |
| | උපචිත ආදායම | 2,120,432.87 | 1,071,855.50 |
| | | **2,612,360.26** | **1,807,472.89** |
| 11.1 | **ණයගැති පාලන ගිණුම** | | |
| | වෙනත් | 490,708.39 | 734,398.39 |
| | විකුණුම්-වෙළඳසැල | 1,219.00 | 1,219.00 |
| | | **491,927.39** | **735,617.39** |
| 11.2 | **උපචිත ආදායම** | | |
| | පොදු | 1,344,884.44 | 975,951.25 |
| | ප්‍රාදේශීය ආර්ථිකය ඉහළ නැංවීමේ ව්‍යාපෘති 1 -මාතලේ | 49,354.70 | 49,354.70 |
| | ශ්‍රී ලංකා කෘෂිකාර්මික පර්යේෂණ ප්‍රතිපත්ති සභාව | 30,940.67 | 30,940.67 |
| | මහවැලිය සඳහා ලැබිය යුතු මුදල් | 504,800.00 | 15,608.88 |
| | NSF සඳහා ලැබිය යුතු මුදල් | 93,056.77 | |
| | අම්පාර සඳහා ලැබිය යුතු මුදල් | 97,396.29 | |
| | | **2,120,432.87** | **1,071,855.50** |
| 12 | **බඩු වට්ටෝරු** | | |
| | නූඩ්ල්ස් | 31,277.40 | 31,277.40 |
| | සහල් මෝල -සහල් | 1,606.50 | 1,606.50 |
| | ගබඩා-වී | 34,119.62 | 34,119.62 |
| | පර්යේෂණ ව්‍යාපෘති | 294,968.00 | 294,968.00 |
| | යන්ත්‍රසූත්‍ර- අමුද්‍රව්‍ය | 7,291.00 | 7,291.00 |
| | යන්ත්‍රසූත්‍ර | 519,745.00 | 519,745.00 |
| | ඩීසල් - කර්මාන්ත ශාලාව | 111,434.48 | 111,434.48 |
| | - විදුලි ජනකය | 34,941.00 | 34,941.00 |
| | ලිපිද්‍රව්‍ය තොගය | 103,032.20 | |
| | පාරිභෝගික ද්‍රව්‍ය තොගය | 42,665.00 | |
| | | **1,181,080.20** | **1,035,383.00** |

| | | | 2016 (Rs.) | 2015 (Rs.) |
|---|---|---|---|---|
| 13 | **අත්තිකාරම්** | | | |
| | උත්සව | | 52,800.35 | 47,250.00 |
| | විශේෂ වැටුප් අත්තිකාරම් | | - | |
| | ගමන් වියදම් | | 28,199.40 | 188,482.60 |
| | අතුරු අත්තිකාරම් - පොදු- පර්යේෂණ සහ සංවර්ධන | | 109,915.15 | 217,475.16 |
| | අතුරු අත්තිකාරම්-පොදු-ප්‍රධාන කාර්යාලය | | 17,106.60 | 17,106.60 |
| | | | **208,021.50** | **470,314.36** |
| 14 | **වෙනත් ජංගම වත්කම්** | | | |
| | සේවාවන් | | 675.00 | 675.00 |
| | | | **675.00** | **675.00** |
| 15 | **සමකොටස්** | | | |
| | ආරම්භක ප්‍රාග්ධනය | | 69,907,594.42 | 69,907,594.42 |
| | රජයේ ප්‍රදාන | | 8,368,214.00 | 8,368,214.00 |
| | විදේශ ණය | | 72,750,229.02 | 72,750,229.02 |
| | මහා භාණ්ඩාගාර අරමුදල - ප්‍රාග්ධන | | 105,910,250.00 | 100,910,250.00 |
| | සමුච්චිත අතිරික්තය/(ඌනතාවය) | | (81,238,009.36) | (83,325,347.91) |
| | | | **175,698,278.08** | **168,610,939.53** |
| 16 | **පාරිතෝෂික අරමුදල සඳහා වෙන් කිරීම** | | | |
| | පාරිතෝෂික අරමුදල | | 28,198,189.00 | 27,606,601.15 |
| | | | **28,198,189.00** | **27,606,601.15** |
| | **ජංගම බැරකම්** | | | |
| 17 | **ගෙවිය යුතු දේ** | | | |
| | අත්තිකාරම් | 17.1 | 1,345,752.48 | 1,429,895.84 |
| | උපචිත වියදම් | 17.2 | 4,814,931.77 | 4,838,380.31 |
| | තැන්පතු | 17.3 | 556,070.00 | 159,320.00 |
| | රඳවා ගැනීම් | 17.4 | 1,321,763.94 | 914,175.80 |
| | ණයහිමි පාලන ගිණුම | 17.5 | 8,962,284.04 | 16,264,729.99 |
| | පෙර ලැබීම් | 17.6 | 386,625.63 | 698,135.04 |
| | | | **17,387,427.86** | **24,304,636.98** |
| 17.1 | **අත්තිකාරම්** | | | |
| | අවිනිශ්චිත ගිණුම | - පොදු | 201,090.56 | 200,643.21 |
| | | - EPF | 986,556.50 | 1,053,935.92 |
| | | - ETF | 134,530.43 | 143,718.72 |
| | | - මුද්දර ගාස්තු | - | 8,775.00 |
| | | - Payee/WHT | 20,065.81 | 20,113.81 |
| | විශේෂ වැටුප් අත්තිකාරම් | | 3,509.18 | 2,709.18 |
| | | | **1,345,752.48** | **1,429,895.84** |
| 17.2 | **උපචිත වියදම්** | | | |
| | පොලිය සඳහා උපචිත බදු | | 126,826.67 | 113,588.33 |
| | උපචිත වියදම් - පර්යේෂණ සහ සංවර්ධන | | 4,687,975.10 | 4,713,974.80 |
| | උපචිත වියදම් - ප්‍රධාන කාර්යාලය | | - | 10,687.18 |
| | ණයහිමියන්-ප්‍රධාන කාර්යාලය | | 130.00 | 130.00 |
| | | | **4,814,931.77** | **4,838,380.31** |

| | | 2016 (Rs.) | 2015 (Rs.) |
|---|---|---|---|
| **17.3** | **තැන්පතු** | | |
| | ටෙන්ඩර් - පර්යේෂණ සහ සංවර්ධන | 556,070.00 | 159,320.00 |
| | | **556,070.00** | **159,320.00** |
| **17.4** | **රඳවාගැනීම්** | | |
| | කොන්ත්‍රාත් වැඩ | 186,826.96 | 432,729.41 |
| | නොගෙවූ වැටුප් | 268,724.39 | 268,724.39 |
| | නොගෙවූ වැටුප් - ප්‍රධාන කාර්යාලය | 200.00 | 200.00 |
| | අවලංගු කල චෙක්පත් | 726,740.59 | 73,250.00 |
| | ප්‍රාදේශීය ආර්ථික ප්‍රවර්ධන ව්‍යාපෘතිය 2 - මාතලේ | 139,272.00 | 139,272.00 |
| | | **1,321,763.94** | **914,175.80** |
| **17.5** | **ණයගැති පාලන ගිණුම** | | |
| | වෙනත් ණයගැතියන් | 375,545.00 | 1,703,380.00 |
| **17.5.1** | ප්ලාස්ටික් කුඩ අරමුදල | 2,687,630.00 | 10,353,965.95 |
| | තැම්බීමේ භාජන අරමුදල | 4,235,109.04 | 4,207,384.04 |
| | පැරණි වාහන විකිණීම | 1,664,000.00 | |
| | | **8,962,284.04** | **16,264,729.99** |
| **17.5.1** | **ප්ලාස්ටික් කුඩ අරමුදල** | | |
| | 2016.01.01 දිනට ශේෂය | 10,353,965.95 | 9,251,445.95 |
| | අමාත්‍යාංශයට ගෙවන ලද | 9,251,445.95 | 0.00 |
| | | 1,102,520.00 | 9,251,445.95 |
| | ප්ලාස්ටික් කුඩ විකුණුම් | 1,585,110.00 | 1,102,520.00 |
| | | **2,687,630.00** | **10,353,965.95** |
| **17.6** | **අත්තිකාරම් ලැබීම්** | | |
| | අත්තිකාරම් ලැබීම් - දැයට කිරුළ | 285,486.80 | 285,486.80 |
| | අත්තිකාරම් ලැබීම් - NSF | 101,138.83 | 412,648.24 |
| | | **386,625.63** | **698,135.04** |

| | | | 2016<br>(රු.) | 2015<br>(රු.) |
|---|---|---|---|---|
| 18 | මහා භාණ්ඩාගාරයෙන් ලැබූ අරමුදල් - පුනරාවර්තන | | 94,750,000.00 | 85,139,000.00 |
| 19 | වෙනත් නියෝජිතායතන වලින් ලැබූ අරමුදල් | | | |
| | - SAARC | | 1,238,309.79 | 544,808.88 |
| | - NSF | | 788,605.01 | 421,430.76 |
| | - PPR | | 25,000.00 | - |
| | - මහවැලි ව්‍යාපෘතිය | | 1,009,600.00 | |
| | - TOT | | 5,137,621.78 | |
| | - අඹ ව්‍යාපෘතිය | | 8,663,004.26 | |
| | - කාබනික ක්‍රමවේදය | | 4,435,193.20 | |
| | ප්‍රදර්ශන සඳහා ආදායම - BMICH | | 97,061.50 | |
| | ප්‍රදර්ශන සඳහා ආදායම - අම්පාර | | 194,951.29 | |
| | ගොවිසතිය සඳහා ආදායම - දඹුල්ල | | 1,907,500.00 | |
| | | | 23,496,846.83 | 966,239.64 |
| 20 | වෙනත් ආදායම් | | | |
| | යන්ත්‍රෝපකරණ විකිණීම | 20.2 | 449,735.00 | 255,809.00 |
| | නේවාසිකාගාර ආදායම | 20.3 | 2,254,309.46 | 2,068,474.22 |
| | පුහුණු වැඩසටහන් | 20.4 | 653,468.82 | 672,567.01 |
| | උපදේශන ගාස්තු | 20.5 | 199,339.00 | 682,208.90 |
| | මුංඇට විකිණීම | 20.6 | 6,420.00 | (13,100.00) |
| | සහල් අයිස්ක්‍රීම් විකිණීම | 20.7 | 6,968.00 | 4,340.00 |
| | පොළී ආදායම් | 20.8 | 2,862,095.29 | 3,785,485.90 |
| | සම්මන්ත්‍රණ ශාලා ගාස්තු | | 1,170,870.00 | 1,255,200.00 |
| | නිවාස කුලී | | 386,750.00 | 428,000.00 |
| | පොදු ආදායම් | | 537,163.15 | 314,776.25 |
| | ප්‍රකාශන විකිණීම | | 31,795.00 | 52,125.00 |
| | වැටුප් රහිත | | 19,555.83 | 64,847.19 |
| | ගොවිපොළ විකිණීම් | | 4,800.00 | 3,900.00 |
| | සෝයා බෝංචි විකිණීම | | - | 95,711.00 |
| | දඩ මුදල් | | 980.00 | |
| | නියැදි පරීක්ෂණ ගාස්තු | | 11,480.00 | |
| | | | 8,595,729.55 | 9,670,344.47 |
| 20.2 | යන්ත්‍රසූත්‍ර නිෂ්පාදන අළෙවිය ලාභ අලාභ ගිණුම | | | |
| | යන්ත්‍රසූත්‍ර විකුණුම් - සහල් තැම්බීමේ භාජන | | 0.00 | |
| | යන්ත්‍රසූත්‍ර විකිණීම - සහල් පෙති යන්ත්‍ර | | 981,650.00 | 981,650.00 |
| | 2016.01.01 දිනට අමුද්‍රව්‍ය ශේෂය | | 7,291.00 | |
| | එකතු කලා: අමුද්‍රව්‍ය මිලදී ගැනීම | | 20,250.00 | |
| | | | 27,541.00 | |
| | 2016.12.31 දිනට අමුද්‍රව්‍ය ශේෂය | | 7,291.00 | |
| | යන්ත්‍ර නිෂ්පාදන පිරිවැය ඉ/ගෙන ආ | | 20,250.00 | |
| | 2016.01.01 දිනට යන්ත්‍ර ශේෂය | | 519,745.00 | |
| | යන්ත්‍ර නිෂ්පාදන පිරිවැය ඉ/ගෙන ආ | | 20,250.00 | |
| | | | 539,995.00 | |
| | එකතු කලා: යන්ත්‍ර මිලදී ගැනීම් | | 511,665.00 | |
| | | | 1,051,660.00 | |
| | 2016.12.31 දිනට යන්ත්‍ර ශේෂය | | 519,745.00 | |
| | නිෂ්පාදන පිරිවැය - යන්ත්‍ර විකුණුම් | | 531,915.00 | 531,915.00 |
| | ලාභය | | | 449,735.00 |

| | | 2016 (රු.) | |
|---|---|---|---|
| 20.3 | **නේවාසිකාගාර ආදායම්** | | |
| | ආදායම් | 4,443,200.00 | |
| | වියදම් | 2,188,890.54 | |
| | | | **2,254,309.46** |
| 20.4 | **පුහුණු වැඩසටහන්** | | |
| | ආදායම් | 965,830.00 | |
| | වියදම් | 312,361.18 | **653,468.82** |
| 20.5 | **උපදේශන සේවා ගාස්තු** | | |
| | ආදායම් | 413,350.00 | |
| | වියදම් | 214,011.00 | |
| | | | **199,339.00** |
| 20.6 | **මුං ඇට විකිණීම** | | |
| | ආදායම | 17,850.00 | |
| | වියදම- මිලදී ගැනීමේ පිරිවැය | 11,430.00 | |
| | | | **6,420.00** |
| 20.7 | **සහල් අයිස්ක්‍රීම් විකිණීම** | | |
| | ආදායම් | 16,420.00 | |
| | වියදම් | 9,452.00 | |
| | | | **6,968.00** |
| 20.8 | **පොළී ආදායම්** | | |
| | ජාතික ඉතිරිකිරීමේ බැංකුව 1- 0005- 04-9129-2-අනුරාධපුර | 31,720.94 | |
| | ජාතික ඉතිරිකිරීමේ බැංකුව 1- 0001- 07-32087-කොල්ලුපිටිය | 195,027.79 | |
| | ජාතික ඉතිරිකිරීමේ බැංකුව 2- 0001- 20-90520 -කොල්ලුපිටිය | 85,352.05 | |
| | ජාතික ඉතිරිකිරීමේ බැංකුව 2- 0001- 21-28152 -කොල්ලුපිටිය | (190,547.95) | |
| | ජාතික ඉතිරිකිරීමේ බැංකුව 2- 0001- 21-28195 -කොල්ලුපිටිය | 781,917.80 | |
| | ජාතික ඉතිරිකිරීමේ බැංකුව 2- 0001- 21-28187 -කොල්ලුපිටිය | 781,917.80 | |
| | ජාතික ඉතිරිකිරීමේ බැංකුව 2- 0001-21-28179 -කොල්ලුපිටිය | 932,739.73 | **2,618,128.16** |
| | **රඳවා ගැනීමේ බදු** | | |
| | ජාතික ඉතිරිකිරීමේ බැංකුව 1- 0005- 04-9129-2-අනුරාධපුර | - | |
| | ජාතික ඉතිරිකිරීමේ බැංකුව 1- 0001- 07-32087-කොල්ලුපිටිය | 5,868.06 | |
| | ජාතික ඉතිරිකිරීමේ බැංකුව 2- 0001- 20-90520 -කොල්ලුපිටිය | (15,243.84) | |
| | ජාතික ඉතිරිකිරීමේ බැංකුව 2- 0001- 21-28152 -කොල්ලුපිටිය | (15,243.84) | |
| | ජාතික ඉතිරිකිරීමේ බැංකුව 2- 0001- 21-28195 -කොල්ලුපිටිය | 62,553.42 | |
| | ජාතික ඉතිරිකිරීමේ බැංකුව 2- 0001- 21-28187 -කොල්ලුපිටිය | 62,553.42 | |
| | ජාතික ඉතිරිකිරීමේ බැංකුව 2- 0001-21-28179 -කොල්ලුපිටිය | 74,619.18 | 175,106.40 |
| | **ශුද්ධ බැංකු පොළී අදායම** | | **2,443,021.76** |
| | **වෙනත් පොළී ආදායම්** | | |
| | විශේෂ අත්තිකාරම් පොළී | 10,804.48 | |
| | ආපදා ණය පොළී | 388,137.26 | |
| | විශේෂ ණය පොළී | 20,131.79 | **419,073.53** |
| | | | **2,862,095.29** |

| | | 2016 (රු.) | 2015 (රු.) |
|---|---|---|---|
| | **වියදම්** | | |
| **21** | **වේතන,වැටුප් සහ සේවක ප්‍රතිලාභ** | | |
| | වැටුප් සහ වේතන - ස්ථිර කාර්ය මණ්ඩලය | 45,536,057.66 | 56,472,206.86 |
| | අනියම් කාර්ය මණ්ඩලය | 1,773,394.11 | 1,802,487.99 |
| | ජීවන වියදම් දීමනාව | 10,774,496.51 | |
| | සේ.අ.අ. | 6,692,816.26 | 6,769,705.74 |
| | සේ.භා.අ. | 1,673,205.17 | 1,699,843.51 |
| | අතිකාල සහ නිවාඩු දින වැටුප් | 1,950,364.71 | 1,847,383.46 |
| | වෙනත් දීමනා | 280,252.00 | 102,700.00 |
| | පර්යේෂණ දීමනා | 1,219,645.37 | 75,334.50 |
| | දිරිදීමනා | 220,893.98 | 542,506.85 |
| | පාරිතෝෂික | 4,182,511.22 | 5,961,279.13 |
| | | **74,303,636.99** | **75,273,448.04** |

| | | 2016 (රු.) | 2015 (රු.) |
|---|---|---|---|
| **22** | **සැපයුම් සහ භාවිතා කල පාරිභෝගික ද්‍රව්‍ය** | | |
| | මුද්‍රණ හා ලිපිද්‍රව්‍ය | 1,019,126.97 | 770,710.93 |
| | කාර්යාල අවශ්‍යතා, විවිධ වියදම් | 1,089,656.68 | 865,494.15 |
| | පර්යේෂණ ව්‍යාපෘති පාරිභෝගික ද්‍රව්‍ය | 908,417.52 | 1,043,305.38 |
| | පරීක්ෂණාගාර පර්.වැඩසටහනේ පාර්භෝ.ද්‍රව්‍ය සහ පරිපාලන වියදම් | - | 1,517,168.00 |
| | නේවාසිකාගාර සහ මුළුතැන්ගෙයි වියදම් | 813,696.00 | 287,698.09 |
| | පර්යේෂණ ව්‍යාපෘති | 859,958.06 | 549,351.20 |
| | වාහන ධාවන වියදම් | 2,293,875.94 | 2,741,150.58 |
| | වාහන නඩත්තු | 2,880,608.54 | 1,920,151.30 |
| | ගොඩනැගිලි සහ ව්‍යුහයන් | 2,369,949.62 | 1,176,122.30 |
| | යන්ත්‍රසූත්‍ර නඩත්තු කිරීම | 756,793.14 | 1,017,249.62 |
| | ගොවිපළ පර්යේෂණ වියදම් | - | 41,750.00 |
| | | **12,992,082.47** | **11,930,151.55** |

| | | 2016 (රු.) | 2015 (රු.) |
|---|---|---|---|
| **23** | **ක්ෂයවීම** | | |
| | ගොඩනැගිලි | 2,909,335.81 | 2,887,766.46 |
| | පිරියත සහ යන්ත්‍රසූත්‍ර | 456,164.06 | 290,271.38 |
| | කාර්යාල උපකරණ | 316,434.17 | 255,295.95 |
| | පරීක්ෂණාගාර සහ පර්යේෂණ උපකරණ | 7,794,561.89 | 7,729,393.90 |
| | වෙනත් උපකරණ | 448,250.25 | 51,543.00 |
| | ගෘහභාණ්ඩ සහ සවිකිරීම් | 680,683.49 | 619,075.20 |
| | විදුලි සහ වෙනත් සවිකිරීම් | 40,248.70 | 31,368.80 |
| | පරිගණක සහ උපාංග | 1,162,539.96 | 394,525.00 |
| | දුරකථන සහ සවිකිරීම් | 27,484.67 | 31,995.82 |
| | පුස්තකාල පොත් | 36,052.10 | 60,801.00 |
| | වාහන | 2,556,000.00 | 5,525,120.00 |
| | | **16,427,755.10** | **17,877,156.51** |

| | | 2016 (රු.) | 2015 (රු.) |
|---|---|---|---|
| 24 | වෙනත් වියදම් | | |
| | ගමන් වියදම්- | 806,249.17 | 944,074.30 |
| | ගමන් වියදම්-විදේශීය | 1,098,749.95 | 154,478.00 |
| | කාර්ය මණ්ඩල තේ | 451,006.29 | 637,142.90 |
| | වාරික, ජර්නල සහ පුවත්පත් | 403,684.50 | 136,880.18 |
| | සම්මන්ත්‍රණ | 105,357.50 | 144,995.00 |
| | පුහුණු වැඩසටහන් | 805,182.65 | 537,820.40 |
| | සංග්‍රහ | 368,378.98 | 154,580.27 |
| | කොන්ත්‍රාත් ශ්‍රමය | 81,600.00 | 322,771.65 |
| | සුබසාධන | 4,000.00 | 6,690.00 |
| | රක්ෂණ සහ බලපත්‍ර | 442,223.96 | 470,221.45 |
| | විදුලි සන්දේශ | 1,438,057.61 | 1,130,777.95 |
| | තැපැල් ගාස්තු | 101,216.00 | 97,155.00 |
| | විදුලිය | 1,502,466.77 | 1,374,005.75 |
| | ජලය | 557,184.76 | 844,034.07 |
| | නිවාස කුලී | 301,748.00 | 208,832.97 |
| | වරිපනම් සහ බදු | 288,960.36 | 154,107.58 |
| | ප්‍රදර්ශන | 12,445.00 | 108,892.95 |
| | ප්‍රකාශන | 7,000.00 | - |
| | මානව සම්පත් සංවර්ධනය | 415,022.98 | 157,212.00 |
| | විගණන ගාස්තු | 250,000.00 | 250,000.00 |
| | නීති ගාස්තු | - | 52,360.00 |
| | නිල ඇඳුම් දීමනා | 224,000.00 | 212,000.00 |
| | SAARC සඳහා වියදම් | 1,238,309.79 | 544,808.88 |
| | NSF ව්‍යාපෘතිය සඳහා වියදම් | 788,605.01 | 421,430.76 |
| | මහවැලි ව්‍යාපෘතිය සඳහා වියදම් | 465,392.73 | |
| | සංවර්ධන ව්‍යාපෘති සඳහා වියදම් - TOT | 5,131,321.78 | |
| | සංවර්ධන ව්‍යාපෘති සඳහා වියදම් - අඹ | 8,663,004.26 | |
| | සංවර්ධන ව්‍යාපෘති සඳහා වියදම් - කාබනික | 4,435,193.20 | |
| | ප්‍රදර්ශන - BMICH | 99,123.80 | - |
| | ප්‍රදර්ශන - අම්පාර | 194,951.29 | - |
| | ප්‍රදර්ශන - ගොවිසතිය - දඹුල්ල | 1,907,500.00 | - |
| | | **32,587,936.34** | **9,065,272.06** |
| 25 | මූල්‍ය පිරිවැය | 37,611.64 | 33,307.23 |
| | | **37,611.64** | **33,307.23** |

| | | | 2016 (රු.) | 2015 (රු.) |
|---|---|---|---|---|
| 27 | ගෙවිය යුතු දේ | | | |
| | අත්තිකාරම් | 17.1 | 1,345,752.48 | 1,429,895.84 |
| | උපචිත වියදම් | 17.2 | 4,814,931.77 | 4,838,380.31 |
| | තැන්පතු | 17.3 | 556,070.00 | 159,320.00 |
| | රඳවා ගැනීම් | 17.4 | 1,321,763.94 | 914,175.80 |
| | ණයහිමි පාලන ගිණුම | 17.5 | 8,962,284.04 | 16,264,729.99 |
| | පෙර ලැබීම් | 17.6 | 386,625.63 | 698,135.04 |
| | | | **17,387,427.86** | **24,304,636.98** |
| | 2015.01.01 දිනය ශේෂය | | 24,304,636.98 | 50,283,425.74 |
| | අඩුකලා :2015.12.31 දිනට ශේෂය | | 17,387,427.86 | 51,911,238.13 |
| | බැරකම් වැඩිකිරීම/අඩුකිරීම | | **(6,917,209.12)** | **1,627,812.39** |
| 28 | වෙනත් ජංගම නොවන වත්කම් | | | |
| | පාරිතෝෂික අරමුදල සඳහා වෙන්කිරීම් | | | |
| | 2016.01.01 දිනය ශේෂය | 16 | 27,606,601.15 | |
| | අඩුකලා :2016.12.31 දිනට ශේෂය | | 28,198,189.00 | |
| | බැරකම් වැඩිවීම/(අඩුවීම) | | **591,587.85** | |
| 29 | ජංගම වත්කම් | | | |
| | තොග | 12 | 1,181,080.20 | 1,035,383.00 |
| | අත්තිකාරම් | 13 | 208,021.50 | 470,314.36 |
| | තැන්පතු | 14 | 675.00 | 675.00 |
| | ණයගැති පාලන ගිණුම | 11.1 | 491,927.39 | 735,617.39 |
| | උපචිත ආදායම් | 11.2 | 2,120,432.87 | 1,071,855.50 |
| | | | **4,002,136.96** | **3,313,845.25** |
| | 2016.01.01 දිනය ශේෂය | | 3,313,845.25 | 8,491,946.30 |
| | අඩුකලා :2016.12.31 දිනට ශේෂය | | 4,002,136.96 | 3,313,845.25 |
| | ජංගම වත්කම් වැඩිවීම/අඩුවීම | | **688,291.71** | **(5,178,101.05)** |
| 30 | දේපල, පිරියත සහ උපකරණ | | | |
| | වර්ෂය තුළ එකතු කිරීම් | | 18,629,436.14 | |
| | සමුච්චිත අතිරික්තය සඳහා ගැලපීම් A/C | | (11,593,784.71) | |
| | වර්ෂය තුළ මුදල් පදනමින් මිලදී ගැනීම් | | **7,035,651.43** | |
| 31 | ආයෝජන - තැන්පතු | | | |
| | ජාතික ඉතිරිකිරීමේ බැංකුව 2- 0001- 20-90520 -කොල්ලුපිටිය | | - | 10,000,000.00 |
| | ජාතික ඉතිරිකිරීමේ බැංකුව 2- 0001- 21-28152 -කොල්ලුපිටිය | | - | 10,000,000.00 |
| | ජාතික ඉතිරිකිරීමේ බැංකුව 2- 0001- 21-28195 -කොල්ලුපිටිය | | 10,000,000.00 | 10,000,000.00 |
| | ජාතික ඉතිරිකිරීමේ බැංකුව 2- 0001- 21-28187 -කොල්ලුපිටිය | | 10,000,000.00 | 10,000,000.00 |
| | ජාතික ඉතිරිකිරීමේ බැංකුව 2- 0001-21-28179 -කොල්ලුපිටිය | | 10,000,000.00 | 10,000,000.00 |
| | | | **30,000,000.00** | **50,000,000.00** |
| | සේවක ණය | | 9,640,525.33 | 9,687,817.36 |
| | සේවක ණය - විශේෂ | | 542,460.96 | 489,585.60 |
| | | | **10,182,986.29** | **10,177,402.96** |
| | මුළු ජංගම නොවන වත්කම් | | **40,182,986.29** - | **60,177,402.96** |
| | 2016.01.01 දිනය ශේෂය | | 60,177,402.96 | 59,903,499.07 |
| | අඩුකලා :2016.12.31 දිනට ශේෂය | | 40,182,986.29 | 60,177,402.96 |
| | ජංගම නොවන වත්කම් වැඩිවීම/අඩුවීම | | **(19,994,416.67)** | **273,903.89** |

| | | 2016 (රු.) | 2015 (රු.) |
|---|---|---|---|
| 32 | කාල පරිච්ඡේදය ආරම්භයේදී මුදල් හා මුදල් සමාන දෑ | | |
| | බැංකුවේ ඇති මුදල් | | |
| | ලංකා බැංකුව -ටොරින්ටන් ශාඛාව | 4,271,183.18 | (74,312,238.61) |
| | මහජන බැංකුව - අනුරාධපුරය | 3,442,336.91 | 70,534,726.71 |
| | අත් මුදල් | 5,000.00 | 5,000.00 |
| | ජාතික ඉතිරිකිරීමේ බැංකුව 1- 0005- 04-9129-2-අනුරාධපුර | 700,085.52 | 2,614,099.84 |
| | ජාතික ඉතිරිකිරීමේ බැංකුව 1- 0001- 07-32087-කොල්ලුපිටිය | 3,519,184.10 | 4,040,428.01 |
| | **2016.01.01** දිනට මුදල් සහ මුදල් හා සමාන දෑ | **11,937,789.71** | **2,882,015.95** |

| | | 2016 (රු.) | 2015 (රු.) |
|---|---|---|---|
| 33 | කාල පරිච්ඡේදය අවසානයේදී මුදල් හා මුදල් සමාන දෑ | | |
| | බැංකුවේ ඇති මුදල් | | |
| | ලංකා බැංකුව -ටොරින්ටන් ශාඛාව | 5,795,171.51 | 4,271,183.18 |
| | මහජන බැංකුව - අනුරාධපුරය | 17,459,429.11 | 3,442,336.91 |
| | අත් මුදල් | 5,000.00 | 5,000.00 |
| | ජාතික ඉතිරිකිරීමේ බැංකුව 1- 0005- 04-9129-2-අනුරාධපුර | 766,106.46 | 700,085.52 |
| | ජාතික ඉතිරිකිරීමේ බැංකුව 1- 0001- 07-32087-කොල්ලුපිටිය | 5,778,243.83 | 3,519,184.10 |
| | **2016.12.31** දිනට මුදල් සහ මුදල් හා සමාන දෑ | **29,803,950.91** | **11,937,789.71** |

34 පලතුරු සහ එළවළු ප්‍රවාහනයේදී සිදු වන පශ්වාත් අස්වනු හානිය අවම කර ගැනීම සඳහා ඇසුරුම් ක්‍රමවේද ප්‍රවර්ධනය කිරීම පිණිස 50% ක සහන මිලකට ගොවීන්, වෙළෙන්දන් සහ එක්රැස් කරන්නන්ට ලබාදුන් ප්ලාස්ටික් කූඩ. එම තොග මේ වන තෙක් ඔවුන්ට ලබා දී නොමැත. 2016.12.31 දිනට ප්ලාස්ටික් කූඩ තොගයෙහි පිරිවැය **179,658.30**

35 2006.10.25 දින වී අලෙවි මණ්ඩලයෙහි වත්කම් පශ්වාත් අස්වැන්න පිළිබඳ තාක්ෂණ ආයතනයට මාරු කර ඇත. කෙසේවෙතත්, ගිණුම් මගින් පෙන්වා ඇත්තේ වී අලෙවි මණ්ඩලයෙන් මාරු කරන ලද වත්කම් වල පොත් අගයන් වේ. වී අලෙවි මණ්ඩලයෙන් ලද වත්කම් ප්‍රත්‍යාගණනය කෙරෙමින් පවතී.

36 අපගේ එක් ගොඩනැගිලි කොන්ත්‍රාත්කරුවෙකු වන කේ.ඩී.ඊබට් සහ පුත්‍රයෝ හෝල්ඩිං පෞද්ගලික සමාගම අනුරාධපුර කාර්යාල ගොඩනැගිල්ල ඉදි කිරීම සඳහා ගිවිසුම් දෙකකට එළඹ ඇත. ඔවුන් ගිවිසුමට පටහැනිව අමතර වැඩකොටස් කීපයක් සිදු කර ඇත. ගිවිසුමට පටහැනි අමතර වැඩ කොටස් සඳහා ගෙවීම් නතර කිරීමෙන් අනතුරුව, ඔවුන් විසින් 2006.11.28 දින රු. 30,806,979.10 ක් ගෙවන ලෙස ඉල්ලා එන්තරවාසි දෙකක් එවා ඇත. අතිරේක වැඩ සඳහා ගෙවීම් වෙනුවෙන් රු. 5,329,344.62 ක් හා රු. 5,477,634.48 ක් වශයෙනි. තවද මුළු ගෙවීම රු. 10,806,979.10 ක් හා ඔවුන්ගේ අලාභය රු. 20,000,000.00 වන සේ මුළු මුදල වන රු. 30,806,979.10 ක් දින 14 ක් ඇතුලත ගෙවන ඉල්ලීම් කර ඇති අතර එසේ නොවුනහොත් ඒ සම්බන්ධව කටයුතු කරන බවත් දන්වා ඇත. නමුත් ආයතනය ඉල්ලීම සම්බන්ධව ප්‍රතිචාරය ක් දක්වා නොමැති අතර ඔවුන් විසින් එන්තරවාසියට අනුව ආයතනයට එරෙහිව කටයුතු කර නොමැත.

37 පශ්වාත් අස්වැන්න පිළිබඳ තාක්ෂණ ආයතනයේ අනුදත් ප්‍රාග්ධනය රු. 500,000,000.00 කි.

38 2000 සිට 2016 දක්වා කාලය තුල ප්‍රාග්ධන වියදම් සඳහා රු.105,910,250.00 ක් මහා භාණ්ඩාගාරයෙන් ලැබී ඇත.

# විගණකාධිපති දෙපාර්තමේන්තුව
## கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
## AUDITOR GENERAL'S DEPARTMENT

| | | |
|---|---|---|
| මගේ අංකය / எனது இல. / My No. එන්සීපී/ජීපී/ටී/පයිඑච්ඩීවී/ 01/16/14 | ඔබේ අංකය / உமது இல. / Your No. | දිනය / திகதி / Date 2017 සැප්තැම්බර් 13 දින |

සභාපති,

පශ්චාත් අස්වැන්න පිළිබඳ තාක්ෂණ ආයතනය.

පශ්චාත් අස්වැන්න පිළිබඳ තාක්ෂණ ආයතනයේ 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1971 අංක 38 දරන මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව

---

පශ්චාත් අස්වැන්න පිළිබඳ තාක්ෂණ ආයතනයේ 2016 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර ආයතනයේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත් කළයුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. මුදල් පනතේ 13(7)(ඒ) වගන්තිය ප්‍රකාර විස්තරාත්මක වාර්තාව 2017 අගෝස්තු 09 දින ආයතනයේ සභාපති වෙත නිකුත් කරන ලදි.

### 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

---

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය නිර්ණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.3 විගණකගේ වගකීම

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000 - 1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාළවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්,වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරුකිරීම් ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාචෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස ආයතනයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් ආයතනයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය සහ ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උපවගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.4 තත්ත්වාගණය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 2.2. ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 2. මූල්‍ය ප්‍රකාශන

### 2.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2016 දෙසැම්බර් 31 දිනට පශ්චාත් අස්වැන්න පිළිබඳ තාක්ෂණ ආයතනයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නාවූ මතය වේ.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 2.2.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති

ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 07 ප්‍රකාරව ජංගම නොවන වත්කම් සඳහා ඵලදායි ජීවිත කාලය වාර්ෂිකව සමාලෝචනය නොකිරීම හේතුවෙන් පිරිවැය රු. 118,207,445 ක් වූ වත්කම් සම්පූර්ණයෙන්ම ක්ෂය කර ඇතත් තවදුරටත් ප්‍රයෝජනයට ගනිමින් පැවතුණි. ඒ අනුව වූ ඇස්තමේන්තුගත දෝෂය ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 03 ප්‍රකාරව ප්‍රතිශෝධනය කිරීමට කටයුතු කර නොතිබුණි.

#### 2.2.2 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයට අදාළ රු.307,480 ක උපචිත වියදම් ගිණුම්ගත කර නොතිබුණි.

(ආ) 2016 – 2018 ජාතික ආහාර නිෂ්පාදන වැඩසටහන යටතේ ආයතනය විසින් ක්‍රියාත්මක කර තිබුණු ව්‍යාපෘති සඳහා මිලදීගෙන සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ඉතිරි වී තිබුණු රු. 260,505 ක් වටිනා ලිපිද්‍රව්‍ය හා පරිභෝජන ද්‍රව්‍ය තොග මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ අවසන් තොග යටතේ ගිණුම්ගත කර නොතිබුණි.

(ඇ) දේපල පිරියත හා උපකරණ තුළ කෘෂි ගොවිපොළ (Agro – farm) ලෙස රු.1,253,934ක් දක්වා තිබූ නමුත් ආයතනයට අනාගත ප්‍රතිලාභ ලැබිය හැකි එවැනි වත්කම් භෞතිකව දක්නට නොතිබුණි.

### 2.2.3 පැහැදිලි නොකළ වෙනස්කම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ආදායම් විෂයයන් 03කට අදාල ලැබියයුතු ආදායම රු. 354,302 ක් වුවද ආදායම් ලේඛන අනුව එම ආදායම රු. 662,250 ක් වූයෙන් රු. 307,948 ක වෙනසක් නිරීක්ෂණය විය.

(ආ) සමාලෝචිත වර්ෂය සඳහා පිළියෙල කර තිබුණු ආදායම් ප්‍රකාශනය අනුව අනෙකුත් ආදායම් ප්‍රභවයන් 04 කට අදාල ආදායම, ආදායම් ලේඛන සමග සැසඳීමේදී එම වටිනාකම් අතර රු. 400,223 ක වෙනස්කම් නිරීක්ෂණය විය.

### 2.2.4 විගණනය සඳහා සාක්ෂි නොවීම

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ පොත් අගයට දක්වා තිබුණ රු.1,002,498 ක් වටිනා තොග වර්ග 06 කට අදාල භෞතික තොග සමීක්ෂණ වාර්තා විගණනයට ඉදිරිපත් නොවුණි.

## 2.3 ලැබියයුතු ගිණුම්

දීර්ඝ කාලයක් සිට පැවත එන ලැබියයුතු ආදායම් ලෙස දක්වා තිබූ එකතු වටිනාකම රු.80,295 ක්වූ ගිණුම් ශේෂ දෙකක් අයකර ගැනීමට ප්‍රවර්ථන වර්ෂයේදීද කටයුතු කර නොතිබුණි.

## 2.4 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

පහත සඳහන් නීති රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| නීති රීති හා රෙගුලාසි යනාදියට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) 1988 අංක 74 දරන පනතින් සංශෝධිත ජාතික රාජ්‍ය සභාවේ 1975 අංක 01 දරන වත්කම් හා බැරිකම් ප්‍රකාශ කිරීමේ පනතේ 01 වගන්තිය | සෑම මාණ්ඩලික නිලධාරියෙක්ම වාර්ෂිකව වත්කම් බැරකම් ප්‍රකාශයක් ඉදිරිපත් කළ යුතු වුවද පශ්චාත් අස්වැන්න පිළිබඳ තාක්ෂණ ආයතනයේ මාණ්ඩලික නිලධාරීන් 20 දෙනෙකු එම ප්‍රකාශ ඉදිරිපත් කර නොතිබුණි. |
| (ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | |
| (i) මුදල්රෙගුලාසි 371 (2) | අත්තිකාරම් ලබාගත් කාර්යය නිමවූ වහාම පියවිය යුතු වුවත් 2007 ,2012 හා 2014 වර්ෂවලදී විවිධ කාර්යයන් 12ක් වෙනුවෙන් ලබාදුන් රු.73,915 ක අත්තිකාරම් 2017ජූලි 31 දින වන විටත් පියවා නොතිබුණි. |
| (ii) මුදල් රෙගුලාසි 570 සහ 571 | 2009 වර්ෂයේ සිට 2014 වර්ෂය දක්වා පැවත එන එකතුව රු.126,500ක් වූ ටෙන්ඩර් ඇප තැන්පත් හා රු.260,853 ක කොන්ත්‍රාත් රඳවා ගැනීම් ආදායමට ගැනීමට කටයුතු කර නොතිබුණි. |
| (iii) මුදල්රෙගුලාසි 757 (ආ) | 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ආයතනයේ භාණ්ඩ සමීක්ෂණයක් සිදුකර අදාල වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි. |

3. මූල්‍ය සමාලෝචනය

3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ආයතනයේ මූල්‍ය ප්‍රතිඵලය රු. 9,506,446 ක ඌනතාවයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු. 18,403,751 ක් වූයෙන් මූල්‍ය ප්‍රතිඵලයේ රු.8,897,305ක වර්ධනයක් පෙන්නුම් කෙරුණි. භාණ්ඩාගාරයෙන් ලද පුනරාවර්තන ප්‍රදාන රු.9,611,000 කින් වැඩිවීම ඉහත වර්ධනයට ප්‍රධාන වශයෙන් හේතුවී තිබුණි.

සමාලෝචිත වර්ෂයේ හා ඉකුත් වර්ෂ 04ක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේදී 2012 වර්ෂයේ සිට 2015 වර්ෂය දක්වා අඛණ්ඩව ඌනතාවය වැඩිවීමක් පැවතියද සමාලෝචිත වර්ෂයේ ඌනතාවය සැලකිය යුතු අඩුවීමක් දක්නට ලැබුණි. සේවක පාරිශ්‍රමිකය හා ජංගම නොවන වත්කම් සඳහා ක්ෂය සැලකීමේදී 2012 වර්ෂයේ රු.49,267,371 ක් වූ දායකත්වය සමාලෝචිත වර්ෂයේ දී රු.81,224,946 දක්වා වර්ධනය වී තිබුණි.

4. මෙහෙයුම් සමාලෝචනය

4.1 කාර්යසාධනය

2000 ජුනි 19 දිනැති අංක 1137 (අතිවිශේෂ) දරන ගැසට් පත්‍රය ප්‍රකාරව ශ්‍රී ලංකාවේ කල්තබාගත හැකි මෙන්ම කල්තබාගත නොහැකි ආහාර භෝග පිළිබඳ පර්යේෂණ හා පශ්චාත් අස්වැන්න පිළිබඳ තාක්ෂණය සංවර්ධනය කිරීම සඳහා අවශ්‍ය පර්යේෂණ සිදු කිරීම හා කෘෂිකර්ම නිෂ්පාදනවල සැකසුම්, ඇසුරුම්, ප්‍රවාහනය හා ගබඩාකරණය සඳහා අවශ්‍ය නවීන තාක්ෂණය හඳුන්වා දීම තුළින් පශු අස්වනු හානිය අවම කිරීම, ගොවීන්ගේ ආදායම් වැඩි දියුණු කිරීම ආයතනයේ අරමුණ වේ. ඉහත සඳහන් අරමුණු ඉටුකර ගැනීම සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ආයතනය පිහිටුවීමේ අරමුණු අතර කෘෂි භෝගවල පශු අස්වනු හානිය අවම කිරීම ආයතනයේ ප්‍රධාන අරමුණක් වූ අතර ඒ වෙනුවෙන් 2009 වර්ෂයේ සිදුකර තිබූ මූලික සමීක්ෂණයකට අනුව සමස්ථ කෘෂිභෝගවල පශු අස්වනු හානිය සියයට 30ත් 40ත් අතර පැවති බව හඳුනාගෙන තිබුණි. සමාලෝචිත වර්ෂය අවසන්වන විට ඉන් වසර 07ක

පමණ කාලයක් ගතවී තිබුණත් මේ වනවිට සමස්ථ පශු අස්වනු හානිය අවමකරගෙන තිබූ ප්‍රමාණය කොපමණද යන්න හඳුනාගතහැකිවන අන්දමේ දත්ත සමුදායක් ආයතනය සතුව නොපැවතුණි.

(ආ) සමාලෝචිත වර්ෂය සහ පෙර වර්ෂ 03ක් තුළ පශ්චාත් අස්වැන්න පිළිබඳ තාක්ෂණ ආයතනය මගින් පර්යේෂණ 36 ක් සිදුකර තිබුණු අතර එම පර්යේෂණවල ප්‍රතිඵලය ක්ෂේත්‍රයට හඳුන්වාදීම හා අදාල තාක්ෂණය ක්ෂේත්‍රයේ භාවිතා වන ස්ථාන පිළිබඳ තොරතුරු ආයතනය විසින් පවත්වාගෙන යාමට කටයුතුකර නොතිබුණු බැවින් පර්යේෂණ වල තාක්ෂණික සොයා ගැනීම් ක්ෂේත්‍රයට හඳුන්වාදීම, එම තාක්ෂණය ක්ෂේත්‍රයට යොදා ගැනීමේ හැකියාව සහ පර්යේෂණ ප්‍රතිඵල ක්ෂේත්‍රය භාවිතා කිරීමේ සඵලදායිත්වය පිළිබඳ විගණනයේදී තහවුරුවක් ලබා ගැනීමට නොහැකි විය.

(ඇ) පශ්චාත් අස්වැන්න පිළිබඳ තාක්ෂණ ආයතනය 2000 වර්ෂයේ පිහිටුවීමෙන් පසු සමාලෝචිත වර්ෂය දක්වා වසර 16ක් තුළ යාන්ත්‍රික ඉංජිනේරු අංශය යටතේ තාක්ෂණික යන්ත්‍ර 37 ක් නිෂ්පාදනය කර තිබුණු අතර එම යන්ත්‍ර 37 න් යන්ත්‍ර 03කට පමණක් පේටන්ට් හිමිකම ලබාගෙන තිබුණු නිසා එම නිෂ්පාදන වලින් සියයට 92 ක් වූ යන්ත්‍ර සඳහා ආයතනයට අනන්‍යතාවයක් ලැබී නොතිබුණි.තවද එයින් යන්ත්‍ර වර්ග 24 ක් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විටත් ක්ෂේත්‍රයේ භාවිතයට ගෙන නොතිබුණු බැවින් නිෂ්පාදිත යන්ත්‍රවලින් සියයට 65 ක් ක්ෂේත්‍රයට ගැලපෙන බවට තහවුරුවක් ලබාගැනීමට නොහැකිවිය.

(ඈ) 2016 – 2018 ආහාර නිෂ්පාදන ජාතික වැඩසටහන යටතේ ක්‍රියාවට නංවා තිබුණු අඹ නිෂ්පාදන සැපයුම්දාම ව්‍යාපෘතිය මගින් අදාල ප්‍රතිලාභීන් වෙත බෙදා දීම සඳහා සමාලෝචිත වර්ෂයේ මිලදීගෙන තිබුණු රු. 2,777,843 ක් වටිනා උපකරණ 2017 ජුනි මාසයේ 15 දින වන විටත් ප්‍රතිලාභීන් වෙත බෙදා දී නොතිබුණි.

(ඉ) ආයතනය සතු රසායනාගාරය ජාත්‍යන්තර තත්ත්වයේ පිළිගත් රසායනාගාරයක් ලෙස නවීකරණය කිරීම සඳහා 2014 වර්ෂය තුළ රුපියල් මිලියන 61.6 ක් වියදම් දරා උපකරණ මිලදී ගෙන රසායනාගාරය නවීකරණය කර තිබූ නමුත් එම රසායනාගාරය ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුව පර්යේෂණ සිදු කිරීම සඳහා අවශ්‍ය ජාත්‍යන්තර පිළිගත හැකි සහතික (accreditation) ලබාගෙන නොතිබීම හේතුවෙන් මෙම ආයතනය විසින් සිදු කරනු ලබන පර්යේෂණ සඳහා පිළිගත හැකි භාවයක් ලබාගැනීමට අපොහොසත් වී තිබුණි.

(ඊ) සමාලෝචිත වර්ෂය තුළ ආහාර නිෂ්පාදන ජාතික වැඩසටහන සඳහා රු. 18,235,818ක් වියදම් දරා ව්‍යාපෘති ක්‍රියාත්මක කර තිබූ නමුත් මෙම ව්‍යාපෘති වල පිරිවැයට සාපේක්ෂව ආහාර නිෂ්පාදන ජාතික වැඩසටහනට දක්වන ලද දායකත්වය ඇගයීම සඳහා ස්ථාපිත කාර්යසාධනය මැනීමේ නිර්ණායකයන් ස්ථාපනය කර ඒ අනුව විධිමත් ඇගයීම් ක්‍රමවේදයක් ක්‍රියාවට නංවානොතිබුණි.

කළමනාකරණ ක්‍රියාකාරකම්

---

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ආයතනය සතු නේවාසිකාගාරය බාහිර පුද්ගලයන්ට ලබා දීමේදී අනුගමනය කරන ලිහිල් ප්‍රතිපත්තිය හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ අවස්ථා 21 කදී නේවාසිකාගාරයේ නවාතැන්ගෙන තිබූ අමුත්තන්ගෙන් අයවිය යුතු රු. 60,900 ක්ද පෙර වර්ෂයේ අවස්ථා 17 කදී අයවිය යුතු රු. 84,600 ක්ද අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) ප්‍රතිලාභීන්ගෙන් සියයට 50ක් අයකර නිකුත් කිරීමට 2014 වර්ෂය තුල මිලදීගෙන තිබූ වටිනාකම රු. 3,360,000 ක් වටිනා රයිස් ක්‍රීම් යන්ත්‍ර 10 ක් සමාලෝචිත වර්ෂය අවසාන වන විට නොමිලේ විවිධ ආයතන වෙත ලබා දී තිබූ අතර එම යන්ත්‍ර උපයෝගී කරගෙන රයිස් ක්‍රීම් නිෂ්පාදනය සිදු කරන්නේද යන්න පිළිබඳ නැවත පරීක්ෂාවක් සිදුකර නොතිබුණු අතර තවදුරටත් ඒවා ප්‍රචලිත කිරීමට අවශ්‍ය පසුවිපරම් කටයුතු හෝ සිදුකර නොතිබුණි.

(ඇ) ආයතනයේ ජ්‍යෙෂ්ඨ පර්යේෂණ නිලධාරියකු ආචාර්ය උපාධිය හැදෑරීම සඳහා 2006 ජූලි 23 සිට 2009 ජූලි 29 දක්වා බැඳුම්කරයන් මත වැටුප් සහිත අධ්‍යයන නිවාඩු ලබාගෙන තිබූ අතර අත්සන් කරන ලද බැඳුම්කරයට අනුව 2009 ජුනි 29 සිට 2019 ජුනි 29 දක්වා නැවත ආයතනයේ සේවය කළ යුතුවේ. ආචාර්ය උපාධිය හැදෑරීම අවසන් කර 2009 ජුනි 29 දින සේවයට වාර්තා කර රාජකාරි කර තිබූ නමුත් ඉදිරි වසර 10ක් සේවය නොකර 2016 ජනවාරි 07 දින සේවය හැරගොස් තිබුණි. ඒ අනුව ඉහත බැඳුම්කරය කඩවීමෙන් ආයතනයට සිදුවූ පාඩුව අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) මහජන බැංකු ගිණුම් අංක 008-1-001-11725665 දරන ජංගම ගිණුමෙහි 2016 දෙසැම්බර් 31 දිනට රු.150,425 ක හඳුනා නොගත් ප්‍රේෂණ පැවතුණ අතර විගණිත දිනය වන 2017 ජුනි 21 දින වනවිටත් එම ප්‍රේෂණ හඳුනා ගෙන ගිණුම්ගතකර නොතිබුණි.

4.3 නිෂ්ක්‍රිය හා ඌන උපයෝජිත වත්කම්

---

2015 වර්ෂයේදි පරික්ෂණ කටයුතු සඳහා භාවිතා කළ හැකි රු. 15,216,575 ක් වැයකර Gas chromatograph mass Spectrometer උපකරණය මිලදී ගෙන තිබූ අතර එම යන්ත්‍රය පූර්ණ වායු සමනය කරන ලද කාමරයක පවත්වා ගැනිම සඳහා නඩත්තු වියදම් දැරුවද විගණිත දිනය වූ 2017 මැයි 31 දක්වාම ආයතනයේ කිසිදු කාර්යයක් සඳහා භාවිතා නොකොට නිෂ්කාර්යව පැවතුණි.

4.4 ප්‍රසම්පාදන හා කොන්ත්‍රාත් ක්‍රියාවලිය

---

පහත සඳහන් නිරික්ෂණ කරනු ලැබේ.

(අ) අවස්ථා 04 කදී රු.3,989,050 කට සිදුකර තිබූ මිලදීගැනිම් සඳහා ප්‍රසම්පාදන පරිපාටියෙන් බැහැරව මුද්‍රාතබන ලද මිලගණන් තුනක් ලබා ගැනිමකින් තොරව අතින් ලබාගත් මිල ගණන් පදනම්ව ප්‍රසම්පාදන කාර්ය සිදුකර තිබුණි.

(ආ) ආයතනය සතු නිල නිවසක් අලුත්වැඩියා කිරිම සඳහා ලියාපදිංචි කොන්ත්‍රාත්කරුවන් වෙතින් ප්‍රමාණවත් පරිදි මිල ගණන් ලබා ගැනිමකින් තොරව ලැබී තිබූ එකම ලංසුකරුට ඉංජිනේරු ඇස්තමේන්තුවේ සඳහන් රු. 3,790,323 ක්වූ මිලට කොන්ත්‍රාත්තුව පිරිනමා ඉදිකිරිම් සිදුකර තිබුණි.

(ඇ) 2014 වර්ෂයේදි ආයතනයේ රසායනාගාරය වෙනුවෙන් උපකරණ මිලදී ගැනීමේදී ආයතනයට සිදු වූ රුපියල් මිලියන 16.6 කට වැඩි අලාභය සම්බන්ධයෙන් ප්‍රමාණවත් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

4.5 මතභේදයට තුඩුදෙන ගනුදෙනු

-----------------------------------

කෘෂිකර්ම අමාත්‍යාංශය විසින් ගොවිසතිය වැඩසටහන සඳහා ඉදිරිපත් කරන ලද අංක 55/2016 දරන අමාත්‍ය මණ්ඩල සංදේශය ප්‍රකාරව ගොවි සතිය තුළ ක්‍රියාත්මක කළ යුතු සංවර්ධන වැඩසටහනට පරිබාහිරව එම වැඩසටහනේ ප්‍රතිපාදනවලින් රාත්‍රී භෝජන සංග්‍රහයක් පැවැත්වීම සඳහා රු. 275,000 ක් වැයකර තිබුණි.

4.6 කාර්ය මණ්ඩල පරිපාලනය

-----------------------------------

පශ්චාත් අස්වැන්න පිළිබඳ තාක්ෂණ ආයතනය තුළ ආරම්භයේ සිට සමාලෝචිත වර්ෂයේ අවසානය දක්වා කිසිදු සේවා කාණ්ඩයක් සඳහා අනුමතබඳවාගැනීමේ පරිපාටිය ප්‍රකාරවකාර්යක්ෂමතා කඩඉම් විභාග නොපවත්වා පරිවාස කාලයේ සිටින නිළධාරීන් වසර 03 ඉක්ම වූ පසු සේවය ස්ථිර කිරීම්, උසස් කිරීම්,වැටුප් වර්ධක ලබා දීම් අඛණ්ඩව සිදුකර තිබුණි.

5. ගිණුම්කටයුතු භාවය හා යහපාලනය

-----------------------------------

5.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

-----------------------------------

2003 ජූනි 02 දිනැති අංක පීඊඩී 12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය අනුව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන ගිණුම් වර්ෂය අවසන් වී දින 60ක් ඇතුළත විගණනයට ඉදිරිපත් කළ යුතු වුවද සමාලෝචිත වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කරන ලද්දේ 2017 මැයි 31 දින දිය.

5.2 නොවිසඳී ඇති විගණන ඡේද

-----------------------------------

ආයතනය විසින් සිදුකරන පර්යේෂණ කටයුතු ගුණාත්මක සහ වෘත්තීය මට්ටමින් සිදු කෙරෙන බවට තහවුරු කර ගැනීමට, ආයතනයේ පිහිටුවා ඇති පර්යේෂණ උපදේශක මණ්ඩලය වසරකට අවම වශයෙන් 4වරක් වත් රැස්වී පර්යේෂණ යෝජනා හා පර්යේෂණවල ප්‍රගතිය ඇගයීමට ළක්කල යුතු බවට 2010 අගෝස්තු 19 දිනැති පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේදී නියෝගකර තිබූ නමුත් සමාලෝචිත වර්ෂයේදී පර්යේෂණ උපදේශක සභාව අවම වශයෙන් එක් වරක්වත් රැස් වී නොතිබුණි.

## 6. පද්ධති හා පාලනයන්

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර ආයතනයේ සභාපතිගේ අවධානය යොමු කරන ලදී.පහත සඳහන් පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කළයුතුව ඇත.

| පද්ධති හා පාලන ක්ෂේත්‍ර | | නිරීක්ෂණ |
|---|---|---|
| (අ) මූල්‍ය පාලනය | | විධිමත් අභ්‍යන්තර පාලන ක්‍රමයක් යොදා ගනිමින් නේවාසිකාගාර ආදායම් අයකර නොතිබීම. |
| (ආ) පර්යේෂණ හා රසායනාගාර කටයුතු පාලනය | (i) | පර්යේෂණ සඳහා පර්යේෂණ මාර්ගෝපදේශ සංග්‍රහය ප්‍රකාරව කටයුතු කර නොතිබීම. |
| | (ii) | පර්යේෂණ උපදේශක මණ්ඩලයේ උපදෙස් ලබාගෙන නොතිබීම. |
| | (iii) | ආයතනය සතු රසායනාගාරය ප්‍රමිතිකරණයට භාජනය කර නොතිබීම. |
| | (iv) | රසායනාගාර උපකරණවලින් ඵලදායීව ප්‍රයෝජනය ගෙන නොතිබීම. |
| (ඇ) කාර්ය මණ්ඩල පරිපාලනය | (i) | කාර්ය මණ්ඩලය විධිමත් පුහුණු වැඩසටහන්වලට යොමුකර නොතිබීම. |
| | (ii) | කාර්යක්ෂමතා කඩඉම් පරික්ෂණ පවත්වා නොතිබීම. |

එච්.එම්. ගාමිණී විජේසිංහ

විගණකාධිපති